

64 වන නිදහස් දින සැමරුම වෙනුවෙන් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් නිකුත් කළ නිවේදනය.

**දේශය ගොඩනැංවීම මෙදා නිදහස් අදිටනයි** 3 පිටුව



**පුංචි පුංචි දම් දූතයෝ ලක් දෙරණේ**

ධර්මදූත ළමා සමාජය ශ්‍රී ලංකාවේ ආරම්භ කර විසිපස් වසර සැමරුම නිමිත්තෙන් පළවන්නකි. 8 පිටුව



**ශුද්ධාසනයට නව කාදිනල් හිමි විසිදෙනමක්**

මෙවර පත්වන නව කාදිනල් හිමිපාණන් විසිදෙනම පිළිබඳ විස්තරය දෙවන කොටස 11 පිටුව



2010 වසරේ හොඳම ආගමික පුවත්පත

# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07



ශ්‍රී ලංකා අප ස්වාමිදුගේ මංගල්‍යය පෙබරවාරි 4 දා

ක්‍රි.ව. 2012 ක් වූ ජනවාරි මස 29 ඉරිදා 146 වෙළුම 34 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 20 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

# දේශය ගොඩනැංවීම මෙදා නිදහස් අදිටනයි

## කාදිනල් හිමි නිදහස් දින පණිවුඩයෙන් ප්‍රකාශ කරයි



**උතුරේ මෙන්ම දකුණේ ද නායකයන් පටු හැඟීම් වලින් මංමුලා නොවී, හුදු පක්ෂ දේශපාලනයේ න්‍යාය පත්‍ර වලින් බැහැර වූ ජාතික වගකීම පෙරටු කරගත් ගමන් මඟකට අවතීර්ණ විය යුතුව තිබේ. මෙහි දී ප්‍රඥාවෙන් යුතුව රට පෙරට ගෙන යෑම සඳහා උතුර මෙන් දකුණත්, නැගෙනහිර මෙන් බටහිරත් සමගි සන්ධානයේ රැහැනින් ඇද බැඳ තබා ගැනීමේ මොහොත එළැඹ තිබේ. යුක්තිය, සාධාරණත්වය ඔස්සේ තිරසාර සාමය උදාකර ගැනීමේ ක්‍රියාදාමයේ දී අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කිරීමට සමත් වැඩපිළිවෙලකට යෑම ඉතාමත් අවැසි වී තිබේ යැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කරති.** (64 වැනි ජාතික නිදහස් සමරු දිනය නිමිත්තෙන් "දේශය ගොඩනැංවීම මෙදා නිදහස් අදිටනයි" මැයෙන් නිකුත් කළ කාදිනල් හිමිපාණන්ගේ සම්පූර්ණ නිවේදනය 03 පිටුවේ පළවේ)

## අගරදගුරු පදවි සිරිහද නිළධාරි ධර්ම විවේකය

කොළඹ අගරදගුරු පදවියට අයත් සියලුම දිව්‍ය හෘදය සමිති නිලධාරීන් වෙනුවෙන් විශේෂ ධර්ම විවේකයක් පසුගියදා තේවත්ත ජුබිලි ශාලාවේදී පැවැත්විය. "කිතුනු ජීවිතය හා නූතන පවුල් ජීවිතය" ගැන දේශනය කොළඹ පදවි විවාහ අධිකරණයේ ගරු ප්‍රැන්සිස් සේනානායක පියතුමා පැවැත්විය. කොළඹ පදවි දිව්‍ය හෘදය සමිති අධ්‍යක්ෂ ගරු බර්නාඩ් නිශාන් විලත්ගමුව පියතුමා හා පදවි කමිටුව සංවිධානය කළ මෙම අවස්ථාවට සෑම දිව්‍ය හෘදය සමිතියක්ම නියෝජනය කරමින් 400 ක් පමණ සහභාගි වූහ.

(✍ ඩොරීන් පෙරේරා)

## සා. සෙබස්තියන් බැතිය මෙවර ඉතා අගෙයි

කළුාන සා. සෙබස්තියන් මුනි මංගල්‍යය අරබයා පැවති සියලු ආධ්‍යාත්මික ව්‍යායාමයන් වලට අති බහුතරයක් සහභාගි වීම කැපී පෙණුනු විශේෂ ලක්ෂණයකි. පෙර නොවූ විරූ අයුරින් සා. සෙබස්තියන් මුනි මංගල්‍යයේ ආධ්‍යාත්මික පැතිකඩ ඉහළ තත්ත්වයට නංවන්නට සිද්ධස්ථානයේ පාලක පියතුමා ඇතුළු අනෙක් පියවරුන් ගෙන තිබූ අප්‍රතිහත ධෛර්යය පොදුවේ කාගේත් පැසසුමට ලක් විය.

## කතෝලික කොඩිය ඔසවන්නට නිර්දේශයක්

පෙබ. 04 දා ට යෙදෙන ලංකා අප ස්වාමි දූ මංගල්‍යය නිමිත්තෙන් සියලුම දේවස්ථාන, කතෝලික ආයතන හා නිවෙස්වල ජාතික කොඩිය සමඟ කතෝලික කොඩියද ඔසවන මෙන් කිතුහඬ සංවිධානය ඉල්ලා සිටී.

## ජයකොඩි පිය සමර




පුදසුන මතට පුද දුන් ගී මල් පොකුර
සැමදා පිපී සුවඳයි නොමයයි අවර
ඒ හා සුවඳ මල් පිදුමට එන කවර
කෙනකුට වුවද ඔබෙ මඟ දසුනකි අමර

**පිටිපන මා. ජයවීර**

ශ්‍රී ලංකා තලයෙහි කතෝලික ලකුණ සනිටුහන් කරන්නට දෙවිඳුන් තුළින් ලත් තලෙන්තු නොමඳව වර්ධනය කරමින් දායාද කළ ගරු මර්සලින් ජයකොඩි පියතුමාගේ 14 වන ගුණ සමරුව සිහිපත් කරන මේ වකවානුවේ අන්ත ආගම් වාදයට එරෙහිව මෛත්‍රියෙන්ම කතා කළ කතෝලික පියතුමකු සේ එම නාමය නැවත නැවතත් ලියැවෙන වගයි!

## මැද පෙරදිග සංක්‍රමික ජනතා ගැටළු ගැන කතෝලික සභාව නිරන්තර අවධානයෙන්!

### ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමික දිනයේ දී ජාතික කොමිසමේ සභාපති රදගුරු හිමි කියයි

**ගරු ජෙනට් පැවදි සොයුරිය විසිනි**



මැද පෙරදිග සේවය සඳහා ගොස් සිටින ශ්‍රම සංක්‍රමිකයන්ට මුහුණ පෑමට සිදුවන තාඩන පීඩන මෙන්ම මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ තත්ත්වය පිළිබඳව කතෝලික සභාව දැඩි අවධානයක් දක්වා ඇති බවත්, මැද පෙරදිග රටවලට පූජකතුමන් හා පැවදි සොයුරියන් සේවාව සඳහා යොමු කරන්නේ ඒ නිසා බවත් ජාතික කතෝලික ශ්‍රම සංක්‍රමික, සංචාරක, බන්ධනාගාර හා සෞඛ්‍ය සේවා කොමිසමේ සභාපති හලාවත රදගුරු අති උතුම් දෙවිශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ ප්‍රකාශ කළහ.

ජාත්‍යන්තර ශ්‍රම සංක්‍රමිකයන්ගේ දිනය නිමිත්තෙන් ජාතික සංක්‍රමික කතෝලික කොමිසම කුරුණෑගල ජනසෙත ආයතනයේ දී පැවැත්වූ සැමරුම් උලෙලේ ප්‍රධානත්වය ගනිමින් රදගුරු හිමි මේ බැව් පළ කළේය.

කොළඹ, මහනුවර, හලාවත, කුරුණෑගල රදගුරු වසම්හි පදවි නියෝජිතයන් සහ සංක්‍රමිකයන් නියෝජනය කරමින් විදේශගතව සිට ආපසු පැමිණි කාන්තාවන් පිරිසක් ද සහභාගි වූහ.

කතෝලික සංක්‍රමික කොමිසමේ ජාතික අධ්‍යක්ෂ ගරු අජිත් රොහාන් ප්‍රනාන්දු පියතුමා ඇතුළු කාර්ය මණ්ඩලය සැමරුම් උලෙළ සංවිධානය කැර තිබිණ.

## ලංකා බයිබල් සමාගමට වසර 200 සපිරේ

**ඒන්ස්ලි ජෝශප් විසිනි**

ලංකා බයිබල් සමාගමට වසර දෙසීයයක් සපිරීම් නිමිත්තෙන් මිලාගිරිය සා. පාවුලු දේවස්ථානයේ දී දෙසීය වැනි සමරු උලෙළ පැවැත්විණ.

කතෝලික සභාව වෙනුවෙන් ඊට සහභාගි වූ ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ සහකාර ලේකම් ගරු ටෝනි මාටින් පියතුමා "මේ සුවිශේෂී මොහොතේ කතෝලික සභාවේ සුබ පැතුම් ද, දෙවියන් 15 පිටුවට ▶

## අගරදගුරු පදවිය ප්‍රතිව්‍යුහගතකරණය

## නව මීසම් කිහිපයක් බිහිවේ?



අගරදගුරු පදවි ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙල යටතේ නම් කළ මීගමුව කලාපයේ නව දිසා සීමා නිර්ණය කිරීම හා නම් කිරීම පිළිබඳ පැවති සාකච්ඡා ඉතා සාර්ථකව නිම වී ඇති බව තතු දත් ආරංචි මාර්ග සඳහන් කරයි.

නායකකන්ද මීසමට මෙතුවක් අයත්ව තිබූ බලගල සහ කෙරවලපිටිය නව මීසම් වශයෙන් වෙන්වන අතර නායකකන්ද මීසමට යහපත් එඬේරාගේ ප්‍රධාන පැවදි ආරාමය සහ හේකිත්ත ද අයත් වන අතර බලගල මීසමට අවරකොටුව සම්බන්ධ වන බව සැලයි. කළුාන - රිලවුල්ල නව දෙව්මැදුරක් බිහිවීමට නියමිත අතර පිටිපන - තලාහේන අර්ධ මීසමක් වශයෙන් ගොඩනැඟීමටත් සැලසුම් සම්පාදනය කොට ඇත.

කළුඑලිය මුල් කොට නව මීසමක් බිහිවන අතර ආඬිඅම්බලම නව මීසමක් හෝ නැතිනම් අර්ධ මීසමක් වශයෙන් ද වෙන් වන බවත් දැන ගන්නට ලැබී තිබේ. ඉදිරි අප්‍රේල් මස අවසානයේ දී මේ නව මීසම් නිර්ණය වීම අගරදගුරු පදවියේ පස් වසරක සේවා නිමකළ සියලු පියතුමන්ගේ නව පත්වීම් හා සමඟ ක්‍රියාත්මක වන බව ද වැඩි දුර ආරංචි මාර්ග සඳහන් කරයි.

## ජංගම කතෝලික පොත් සේවාව කොළඹ කතෝලික මුද්‍රණාලය අරඹයි



කොළඹ කතෝලික මුද්‍රණාලය මගින් ජංගම පොත් අලෙවිහලක් මේ වසරේ පටන් ආරම්භ කැර තිබේ. ජනවාරි මාසයේ දී පැවැත්වෙන සා. සෙබස්තියන් මුනි මංගල්ල සමය ඉලක්ක කැරගෙන කළුානෙන් මේ වැඩසටහන අරඹා තිබේ.

කතෝලික ලේඛක ලේඛිකාවන්ට තම තමන් විසින් ලියා පළකරන ලද කතෝලික පොත් අලෙවි කර ගැනීමට මේ වැඩසටහන යටතේ අතහිත දීමට කොළඹ කතෝලික මුද්‍රණාලය සූදානම් යැයි කොළඹ කතෝලික මුද්‍රණාලයේ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමා ඥානාර්ථ ප්‍රදීපයට පැවසීය. මුද්‍රාංකණ සතියට පමණක් සීමා නොවී කතෝලික පොත් පත් වසර පුරා ජනතාව අතර රැගෙන යෑමටත්, විශේෂයෙන් දෙව්මැඳුරු මංගල්‍ය සමයන් වලදී ඒ ඒ මීසම් වලට යෑමටත් බලාපොරොත්තු වේ. මීසම් සේවක පියතුමන් වෙතින් ආරාධනා ලැබෙන්නේ නම් ඒ අනුව දින යොදා ගැනීමට අදහස් කැර තිබේ. සියළු විස්තර අධ්‍යක්ෂ පියතුමාගෙන් විමසන්න.

## ලොකු සෑර්



මැගසින් සිරගෙදර කැරැල්ලක්!
- පුවතක්

**ගෙදර ඉන්නව වගේනේ!**

**"ජේසුස් වහන්සේ බලය ඇත්තකු මෙන් ඉගැන්වූ සේක." (මාක් 1:21-28)**

පදවියෙන් පදවියට

# කතෝලිකයන්ට පල්ලි හදාගන්න බැරි තරමට දැඩි පීඩනයක් ඔවුන්ට එල්ල වෙලා!

## රත්නපුර රදගුරු හිමිපාණෝ කඳානේ දී ප්‍රකාශ කරති

**"කතෝලික සභාව අද දැඩි ලෙස පිඩනයකට ලක් වෙනවා. නොයෙක් පීඩනවලට අප යට වෙනවා. කතෝලික ආගම නිසා රැකියාව කර කියා ගන්න, රැකියාවේ උසස්වීමක් ලබා ගන්න සමහරකට බැරිව ගොස් තිබෙනවා. අද අපේ දෙව් මැඳුරුවල වූ ප්‍රතිමා විනාශ කරනවා. අද අපි බොහෝ විට වැඩකරන ප්‍රදේශවල පල්ලියක් හදා ගන්න බැරි තත්ත්වයක් උදාවෙලා තියෙනවා" යැයි කඳාන 143 වැනි සා. සෙබස්තියන් මුනි වාර්ෂික මංගල මහා පූජාවේදී රත්නපුර රදගුරු අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණෝ පැවසූහ.**

මංගල්‍ය මහ පූජාවට සහභාගිව සිටි අති විශාල බැතිමතුන් රාශියක් අමතමින් රදගුරු හිමි එහිදී මෙසේ ද පැවසීය.

පීඩාවට හයවන පුද්ගලයා සැබෑ ක්‍රිස්තියානි කාරයකු නොවේ. සැබෑ ක්‍රිස්තු අනුගාමිකයෙක් නොවෙයි. පසුගිය දවස්වල රාවතාවත්ත ප්‍රේම් නිවාසයේ සිද්ධිය දඩමීමා කරගෙන කතෝලික සභාවට මඩ ගහන්න පත්තර කාරයෝ, මාධ්‍යකාරයෝ උත්සාහ කළා. අවසානයේදී ඔවුන්ට මොකද වුනේ - කළ ප්‍රකාශන යළි වමාරන්නට, සිද්ධ වුනා. ක්‍රිස්තියානි විශ්වාසයට මඩ ගහල - පහර ගහල - අපහාස - අවමාන - නින්දා කරල කිසිදාක විනාශ කරන්නට බැහැ.

සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පෙරේරා පියතුමා හා සහයක පියතුමන්ගේ එකමුතුවෙන් මීසම් ජනතා සහයෙන් මංගල කටයුතු සාර්ථකව සිදුකැරිණ.

ලෙස්ලි පෙරේරා

## සුබාසිංසන!



අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මේරියස් පීරිස් හිමිපාණන්ගේ රදගුරු අබිසෙස් සංවත්සරය පෙබරවාරි 03 වැනිදාට යෙදේ. ප්‍රදීපය එතුමන්ට සමිඳු ආසිරි බහුලව ලැබේවායි සුබාසිංසන පිරිනමයි.

## හදවත් සැත්කමට ආධාර පතයි



මොරටුව, කටුකුරුන්ද සා. මරියා පාරේ අංක 10/1 හි පදිංචි එච්. ඇන්තනි පොන්සේකා මහතාව හදවත් සැත්කමකට බඳුන් කළ යුතු බව විශේෂඥ වෛද්‍ය ගාමිණී වීරකෝන් මහතා නිර්දේශ කර තිබේ.

ඒ සඳහා යන වියදම් දැරීමට විශ්‍රාමිකයකු වන ඒ මහතාට නොහැකි බැවින් මොරටුව කොමර්ෂල් බැංකුවේ අංක 8590011497 දරණ ගිණුමට ඒ සඳහා වූ ආධාර ලබා දෙන්නැයි ආයාචනා කර සිටී.



බුරුල්ලපිටිය මීසමට අයත් පොල්වත්ත දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පසුගියදා භක්ති ප්‍රබෝධන සංස්කාරක හා නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශාධිපති උපදේශක ගරු ඩිලාන් පෙරේරා නි.ම.නි පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකැරිණ. මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද හා ගරු ඇලෙක්ස් කොස්තා නි.ම.නි පියතුමන් ද එම අවස්ථාවට සහභාගි විය.

සමන් සී. පෙරේරා

## ගල්ගමුවේ වාස් පිය උලෙළට මහ සෙනඟක්!



ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරු වන භාග්‍යවන්ත ජුසේවාස් පියාණන් සග සැපත්වීමේ තෙශත සංවත්සර ජයන්ති සමාප්තිය හා උන්වහන්සේ මෙරටට වැඩමකර 325 වන ජයන්ති සංවත්සර මංගල උලෙළ එතුමන්ගේ පාද ස්පර්ශයලත් ඇතුගල්පුර පදවි, ගල්ගමුව ජුසේවාස්පුර සිද්ධස්ථානයේ දී ගාල්ල රදගුරු අති උත්තම රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවත්විණි.

මංගල දිව්‍ය යාගය ගාලු රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් හා කුරුණෑගල පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස්, පදවි ගිහි අපෝස්තික, සේවා පරිපාලක, ජාතික ධර්මෝපදේශක, බයිබල් අපෝස්තලික සේවා, ජාතික අධ්‍යක්‍ෂ අතිගරු පියල් ජානක ප්‍රනාන්දු සහභාගිත්වයෙන් කුරුණෑගල අනුරාධපුර, හලාවත, කොළඹ රත්නපුර ආදි ප්‍රදේශවලින් පැමිණි සැදැහැවත් ජනතා සහභාගිත්වයෙන් සිදු කැරිණ.

මේ උලෙළට ඇතුගල්පුර රදගුරු අති උත්තම, හැරල්ඩ් ඇන්තනි පෙරේරා, විශ්‍රාමික රදගුරු අති උත්තම, රේමන්ඩ් පීරිස් රදගුරු හිමපාණන් එක්විය. ගරු ලින්ටන් පෙරේරා පියතුමා ප්‍රමුඛ පදවි ජුසේවාස් පිය කමිටුව, හල්ගමුව මීසම් සංසය හා එක්ව උත්සවය සංවිධාන කර තිබූ අතර, භාග්‍යවත් ජුසේවාස් මුනිඳුන්ගේ සග සැපැත්වීමේ 300 වන සමාප්තිය සනිටුහන් කරමින් එම සන්නස් පත්‍රය ප්‍රකාශයට පත්කිරීම පදවි රදගුරු හිමිපාණන් විසින් සිදුකරන ලදී.

ජේ. බී. එච්. ලිවේරා

## අදේවවාදි බලවේග හමුවේ කිතුනු විශ්වාසය කොයිබට ද?

කිතුනු ජීවිතය විශ්වාසයේ ජීවිතයක්. එදිනෙදා ජීවිතයේ දුක, වේදනාව, ප්‍රශ්න වැනි අමිහිරි අත්දැකීම් මත වුව ද තිර ඇදහිල්ලෙන් පසුවන්නට ස්වාමින් වහන්සේ අපට ආරාධනා කරනවා. යුගයේ ප්‍රවනතා තුළින් විශ්වාසයට පටහැනි දෑ අප දර්ශනය කරන විට අපගේ විශ්වාසය කොයිබට ද යන්න විමසා බැලිය යුතුයි. විශ්වාසයේ අභියෝග ජයගන්නට ස්වාමින් වහන්සේ අපගේ ජීවන ඔරුවේ ජීවමානව වැඩ සිටින බව අපගේ විශ්වාසයේ අත්දැකීම විය යුතු යැයි මට්ටක්කුලිය ජෝන් මේරි වියානි දෙව්සත්හල් අදියුරු ගරු වික්ටර් සිල්වා පියතුමා පැවසීය.

137 වන වරටත් උත්කර්ෂවත් ලෙස පැවැති මොරටුව සා. සෙබස්තියන් මුනිඳුන්ගේ වාර්ෂික මංගල උලෙළේ සැඳෑ යැදුම් මෙහෙයේ දී පැවසීය.

ෆ්‍රැන්සිස්කාන නිකායික ගරු එමසි ප්‍රියශාන්ත පියතුමන් අධ්‍යාත්මික ධර්ම විවේකය මෙහෙය විය. මීසම් සේවක ගරු බර්ට්‍රම් රංජිත් හා සහයක ගරු රංජන් ප්‍රියදර්ශන පියතුමන්ගේ මග පෙන්වීම මත මංගල්‍ය කටයුතු සංවිධානය විණි. මංගල පෙරහැරින් අනතුරුව ප්‍රතිමාවෙන් ආසිරි ගැන්වීම දකුණු කොළඹ කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමන් අතින් සිදුවිය.

ප්‍රදීප් සූරවීර

## දූ දරුවන් තුළ දේව භක්තිය වර්ධනය කරමු



මංගල්‍ය උත්සව වල දක්නට ලැබෙන්නේ, වානිජ රැල්ලට ජනතාව පොළඹවන අවස්ථාය. එහෙත්, අද අපගේ ඇතුලාන්ත ජීවිතය පිළිබඳව කිසිදු තැකීමක් ඇති නොකිරීම කණගාටුවට කරුණකි. ප්‍රථම කොට දෙවියන් කෙරෙහි අප තුළ ඇති භක්තිය, විශ්වාසය, ශක්තිමක් කර ගැනීම, කිතුනු වටිනාකම් ඔප ගැන්වීම අප වෙතින් ඉටුවිය යුතු ප්‍රධාන වූ වගකීමකි. අපෙන් පසුව, ඉදිරියට එන පරපුරට ඒ විශ්වාසය වඩාත් තහවුරු වන අන්දමට අප ඔවුන්ට ආදර්ශයක් විය යුතු යැයි, ගරු ජෝන් කැමිලස් ප්‍රනාන්දු නි.ම.නි පියතුමා පැවසීය.

එතුමා එසේ පැවසුවේ, දියලගොඩ සා. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ 167 වන වාර්ෂික මංගල උලෙළේ මුලසුන හොබවමිනි. මංගල උලෙළ සූදානම් වීම සඳහා අටදින නුවාන මෙහෙය ප්‍රැන්සිස්කන් නිකායේ ගරු ජයන්ත ප්‍රනාන්දු පියතුමන් විසින් සිදුකරන ලදී. හිටපු මීසම් සේවක, දැනට කොරළවැල්ල මීසම් සේවක ගරු ලියෝ කැමිලස් හෙට්ටිආරච්චි පියතුමන් විසින් සන්ධ්‍යා මෙහෙය සිදු කරන ලදි.

මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ මූලිකත්වයෙන් දියලගොඩ කිතුනු සංසයේ එකමුතුවෙන් මංගල උලෙළ අර්ථවත් අන්දමින් පැවැත්වුනි.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

## අගරදගුරු පදවි කොමිට්සියම් ධර්ම විවේකය

අගරදගුරු පදවියේ ශ්‍රී ලංකා අප ස්වාමිදුවගේ කොමිට්සියම් සභාවේ 'වාර්ෂික ධර්ම විවේකය' 6 වන පාවුළු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදි. ගතානුගතික සම්ප්‍රදායානුකූල දේශනයක් නැතහොත් අනුශාසනයක් වෙනුවට මෙවර වෙනස් අත්දැකීමක් ධර්ම විවේකය තුළ මරිය හටයන්ට ලබාදෙන ලද්දේ මොරටුවේ ශිරාන් ප්‍රනාන්දු මහත්මා විසිනි. නවීන තාක්ෂණය ඇසුරින් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යය උපයෝගි කරගෙන, දේව මාතාවන් වහන්සේගේ ජීවිතය රෝසමල් යහනාවක ගෙවුණු දිවියක් නොවන බවත්, ජීවිත ප්‍රශ්න ගැටලු හමුවේ නොසැලී ඒවාට මුහුණ දුන් අයුරුත්, මහතා පැහැදිලි කළේය.

නව වසර තුළ මරිය හටයකු ලෙස තමාගත් තීරණයන්, තමාගේ දුබලකම්, බලාපොරොත්තු දිව්‍ය පූජා යාගය තුළදී පඬුරු ලෙස පුද කැරිණ. කොමිට්සියමේ ආත්මීක අධ්‍යක්‍ෂ සහ මරිය හමුදා ජාතික අධ්‍යක්‍ෂ ගරු රොනී පොන්සියුස් පෙරේරා පියතුමා දිව්‍ය පූජා යාගය ඔප්පු කළේය. කොමිට්සියමේ සභාපති සනී ප්‍රැන්සිස් ප්‍රනාන්දු සහ නිලධාරි පිරිස ධර්මවිවේකය සංවිධානය කළ අතර තාක්ෂණික සහය සපයන ලද්දේ ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු මහත්මා විසිනි.

ජිනවලි ස්වර්ණලතා



'කිතු මඟ' වැඩසටහන යටතේ එ.ජා.ප නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මහතා සේදවත්ත ආරෝග්‍ය දේවමාතා දේවස්ථානයේ ක ට යු තු සඳහා මුදල් පරිත්‍යාග සේදවත්ත මීසම් සේවක ගරු නිලන්ත හේෂාන් පියතුමාට ලබා දුන් අයුරු. මේ සඳහා මැදිහත් වූ මීසම් සැදැහැවතියක වන සුසිලා ඩයස් මහත්මිය පසෙක සිටී.



මාකෙවිට මීසම් සේවක ගරු තරංග සම්පත් පියතුමාගේ සංකල්පයක් මත අඩු ආදායම් ලාභී පවුල්වල පාසල් දරුවනට නොමිලේ පොත්පත් ලබාදීමේ වැඩ සටහන 4 වන වරටත් පසුගිය දා සිදුකැරිණ. මෙවර 175 කට ආසන්න පිරිසකට පොත් බෙදාදෙන ලදී. ඊට සමගාමීව ශාන්ත වින්සෙන්ති ද පාවුලා සමිතියෙන් සංවිධානය කරනු ලබන වියලි ආහාර පාර්සල් බෙදීමද සිදුවිය.

සටහන - ප්‍රැන්ක් වික්‍රමසිංහ, සේයා - තිලක් ඩයස්

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2012 ජනවාරි 29 ඉරිදා

# ද්‍රවිඩ සන්ධාන ඇස් මායිමේ අසමත් වන සංහිඳියා කොමිසම

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාව පිළිබඳව දෙමළ ජාතික සන්ධානයේ මතය කුමක් ද යන්න ඔවුන් ප්‍රකාශයට පත් කළ ප්‍රකාශනයේ සඳහන් වීම නැවතත් කුතුහලය ඇති කරවන නිමිත්තක් බවට පත්වී තිබේ. මුල පටන්ම දෙමළ ජාතික සන්ධානයේ ස්ථාවරය වූයේ යුද්ධයෙන් අගතියට පත් ජන කොටස නියෝජනය කරන දේශපාලන ප්‍රවාහයේ කොටස් කරුවන් හැටියට තමන්ගේ අයිතිය සුරක්ෂිත කරන විශ්වාසනීය වගවීමේ ක්‍රියාවලියක් බහුතර බලය නියෝජනය කරන පාර්ශවයෙන් අවශ්‍ය බවයි. 'ප්‍රදීපය' එදා සිටම සිය කරුණු අවධාරණයේ දී ඉටු කළේ දෙපාර්ශවයේම කරුණු කාරණා ඒ සැටියෙන්ම විමසුමකට ලක් කොට නිර්ණය කිරීමක් සඳහා පොදුවේ එළි දැක්වීමයි. අදත් ඒ ස්ථාවරයේම පිහිටා මෙම උක්ත කරුණ කෙරෙහිත් ප්‍රදීපය දක්වන විමසීම මෙලෙස සනිටුහන් කරන්නෙමු.

2010 මැයි මස 15 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජන රජයේ ජනාධිපතිතුමන් විසින් ඉහතින් සඳහන් කළ කරුණු වල වගවීම අරබයා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබුවේ විනිවිද භාවයකින් යුතුව අතීතය විමර්ශනය කරන බවට පොරොන්දුවක් ද වෙමිනි. නමුත් ද්‍රවිඩ ජාතික සන්ධානය සිය ප්‍රකාශය ආරම්භයේ දී ම පවසන්නේ මෙම කොමිසමේ ක්‍රියාවලිය හා පරිචයන් දෙමළ ජනතාවගේ විශ්වාසය දිනාගැනීමට අපොහොසත් වී ඇතිවා පමණක් නොව වගවීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අදාළ වන්නා වූ අන්තර් ජාතික ප්‍රමිතීන් ද තෘප්ත කිරීමට කොමිසම අසමත් වී ඇති බවයි.

මෙහිදී ඔවුන් පෙන්වා දෙන තවත් වැදගත් කරුණක් වන්නේ අගතියට පත් පාර්ශවය වෙනුවෙන් අඩු තක්සේරුවකින් සාක්ෂ්‍ය විමසීමක් කර ඇති නිසා එහි සමස්තය තුළ විශාල හිඩැසක් ඉතිරි කර ඇති බවයි. ඒ තුළ ජාතින් නියෝජනයේ සාක්ෂිකරුවන් හට ආරක්ෂාව සැපයීමට උක්ත කොමිසම අපොහොසත් වීමම එහි විශ්වාසනීයත්වය ලඝු වීමට බෙහෙවින්ම බලපා ඇති බවයි. වාචික කරුණු වලට පමණක් වැඩි බර පැනක් ලබා දෙමින් සයුරෙන් එහා වෙසෙන ප්‍රබල සාක්ෂිකරුවන්ගේ වීඩියෝ දර්ශන රැගත් සාක්ෂ්‍ය කෙරෙහි අල්ප අවධානයක් යොමු කළ බව පැවසීමත් ඍණ අගයක් ගැනීමට කොමිසම මඟක් විවර කළා වැනියි.

විශේෂයෙන්ම යුද්ධයේ අවසන් අදියරේ දී සිදුවූ උල්ලංඝනය වීම් පිළිබඳ අවංක වගකීමක් නිර්මාණය කිරීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් සම්පත් හෝ කාර්යය මණ්ඩලයක් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම සතු නො වූ බව ද්‍රවිඩ ජාතික සන්ධානය පැවසීමත් අඩු තක්සේරුවකින් බැලිය යුත්තක් නොවේ. එලෙසම කොමිසමේ අන්තර්කාලීන නිර්දේශයන් ක්‍රියාවට නැංවීමට රජය තවමත් අපොහොසත් වීම එහි සමස්ත අසමත් බව විදහා දක්වන බව සන්ධානයේ මතයයි. එපමණක් නොව යුද අපරාධ ස්ථාපිත කැරෙන අන්තර්ජාතික මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට එල්ල වූ විශ්වාසනීය චෝදනාවන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම නොතකා හැර ඇති බව පැවසීමත් ප්‍රධාන චෝදනාවකි.

එමෙන්ම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම කරුණු සඳහා නිවැරදි අයුරින් නීතිය අදාල කිරීමට ද අසමත් වී ඇති බව දෙමළ ජාතික සන්ධානය පවසයි. අන්තර්ජාතික මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම් සිදුවීමේ විය හැකියාවන් සමීපව ගැඹුරින් සාකච්ඡා කිරීමටද, සිදුව ඇති බවට විශ්වාසනීය ලෙස චෝදනා එල්ල වී පවතින උල්ලංඝනය කිරීම් පිළිබඳ ජාත්‍යන්තර අපරාධ නීතිය තුළ වන ප්‍රතිපාදනයන් කෙරෙහි අවධානය යොමු කිරීමට ද උගත් පාඩම් කොමිසම අසමත් වී ඇති බවට දෙමළ ජාතික සන්ධානය නගන චෝදනා ද සැහැල්ලුවෙන් ගත හැක්කක් නොවේ.

රජයට එරෙහි සියලු චෝදනාවන් පිළිබඳ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ සමස්ත විශ්ලේෂණය අති මහත් පරස්පරතාවන් විශද කරන්නක් බව දෙමළ ජාතික සන්ධානය පවසයි. ඔවුන් තවදුරටත් පවසන්නේ අතිශයින්ම අතාර්කික යම් යම් විශ්ලේෂණයන් තුළින් නිරූපිත වී ඇත්තේ රජයට එරෙහිව පවත්නා චෝදනාවන් පිළිබඳව අවංකව විමර්ශනය කිරීමට උගත් පාඩම් ප්‍රතිසන්ධාන කොමිසම් පසුබට වී ඇති බවයි.

"මානව හිමිකම් සම්බන්ධයෙන් වන උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශයන් බොහොමයක් අධිකරණය, නීතිපති දෙපාර්තමේන්තුව, ජාතික පොලිස් කොමිසම සහ රාජ්‍ය සේවා කොමිසන් සභාව ඇතුළු ආයතන ගණනාවක ස්වාධීනත්වය පූර්ව උපකල්පනය කරයි. එනමුදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහ අට වන සංශෝධනය අරබයා එය බලාත්මක කරවීම තුළ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ අවසන් නිර්දේශයන් ක්‍රියාවට නැංවීමේදී ජයගත නොහැකි අභියෝගයක් අභිමුඛ කරන බව දෙමළ ජාතික සන්ධානය ප්‍රබල උපකල්පනයක් ද කරයි.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශයන් බලාත්මක කරවීම හා කොමිසමේ බලාත්මක බව පිළිබඳව කවදත් ප්‍රදීපය සද්භාවයෙන් කථා කළ අතරම අගතියට පත් පාර්ශ්වයට සිදුවන අගතිය පිළිබඳව ද විමසිලිමත් වෙමින් පසු වූයේ ජාතික සමඟියට සියළු කොටස් හි එකමුතුව අගය කළ නිසා ය. ප්‍රදීපය අදත් සිටින්නේ ඒ ස්ථාවරයේමයි.



# දේශය ගොඩනැංවීම මෙදා නිදහස් අදිටනයි

ශ්‍රී ලංකාවට නිදහස ලැබීමේ 64 වන නිදහස් දින සමරුව 2012 පෙබරවාරි 04 දිනට යෙදේ. මේ අවස්ථාව ශ්‍රී ලාංකිකයන් ලෙස අප සැම අමන්දානන්දයට පත්කරන අවස්ථාවකි. සැබෑ ශ්‍රී ලාංකිකයන් සමඟ මේ මොහොතේ කතෝලික ජනතාව ද අත්වැල් බැඳ ගනී. සොබා දහමේ අපූරු තිළිණයන් රැසක උරුම කරුවන් වන්නට අප වෙත ප්‍රදානය කළ දෙවි මහෝත්තමයාණන් වහන්සේට තුති පුදන්නට අපි පළමුව කැමැත්තෙමු. විවිධ ජාතීන්, ආගම්, භාෂා සමඟ සංස්කෘතීන් සංකලනය වූ මේ දේශයේ හා ජනතාවගේ විවිධත්වය ඔස්සේ දේශය ගොඩනැංවීම උදෙසා ඒකත්වයෙන් කටයුතු කිරීම මේ මොහොතේ අප සියල්ලන් හමුවේ පවත්නා අභියෝගයකි.

ශ්‍රී ලංකාව නිදහස උදාකර ගැනීමේ ව්‍යායාමයේ දී මෙරට කතෝලික ජනතාව ද විවිධ ලෙස ඒ සඳහා දායක කාරක වූහ. තමන් උපන් බිම විදේශ ආධිපත්‍යයෙන් මුදා ගැනීමට දියත් කළ නිදහස් අරගලයේ දී කතෝලිකයන්ගෙන් සුවිශේෂී දායකත්වයක් ලැබී ඇති අන්දම ඉතිහාසය පිරික්සා බැලීමේදී සක් සුදක්සේ පැහැදිලිය. එදා පටු බේද දුරලමින් දේශයේ නිදහස උදෙසා සියලු වෙනස්කම් පිටු දකිමින් එකමුතු කම පෙරටු කරගෙන කටයුතු කළ නිසාම අපි ජයග්‍රහණය ලැබුවෙමු. එහිලා කතෝලික ජනතාව ද දායක කාරක වීම ගැන අපි නිහතමානී සාඩම්බරයකින් පසුවන්නෙමු. මේ එකමුතුකම පෙරටු කර ගැනීම නිසා එදා එක ලේ බිඳුවකුදු නොහෙලා නිදහස ලබාගන්නට සමත්වීම ගැන අපි උදම් ඇනුවෙමු. එදා අති බලවත් අධිරාජ්‍යයකින් එසේ නිදහස ලබා ගන්නට හැකිවූයේ නිදහස් අරගලයේ පැවැති ප්‍රබල එකමුතු භාවය නිසාය.

එහෙත් කාලයත් සමග මේ එකමුතුකම විනාශ වී යමින් පටු අරමුණු ඔස්සේ ගමන් කරන්නට වීම නිසා බරපතල බේදවාචකයන්ට අපි මුහුණ පෑවෙමු. මේ නිසාම පුරා තිස් වසරක බිහිසුණු විනාශකාරී යුද්ධයකට මැදිවන්නට මේ දේශයට සිදුවිය. එකී බරපතල බේදවාචකය නිසා විනාශ වූ මිළ කළ නොහැකි ජීවිත, ආර්ථික සම්පත් හා ආධ්‍යාත්මික හරයන්ගේ විනාශය ගණන් හැදීමට නොහැකි තරම් යැයි කිවහොත් නිවැරැදිය.

කෙසේ හෝ වේවා යුද්ධය නිමාකරන්නට රටට හැකිවී ඇත. ඉන් ඇති වූ තුවාල සුවපත් කරන්නටත් ලෞකික හා භෞතික සංවර්ධනය ඇති කරලීමටත් ඉකුත් කාලයේ මුල පුරා ඇති බව සැබෑය. එහෙත් සැකයෙන් විරසක වූ සිත් සතන් බියෙන් තොර සාමකාමී මාවතක රැගෙන යෑමේ බරපතල අභියෝගයට අපි අද මුහුණ දී සිටිමු. උතුරේ යුද්ධයෙන් විපතට පත් ජනතාව නගා සිටුවමින් ඔවුන්ගේ ජීවිත යළි ජීවත් කරවීමේ අභියෝගය අප හමුවේ පවතී. ඔවුනොවුන් අතර විශ්වාසය තහවුරු කර මිනිස් බවේ වටිනාකම් තුළින් නව අරුණෝදයකට පියනැගීමේ යුගයකට අපි පිවිස සිටිමු.

උතුරේ මෙන්ම දකුණේ ද නායකයන් පටු හැඟීම් වලින් මංමුලා නොවී - හුදු පක්ෂ දේශපාලනයේ න්‍යාය පත්‍රවලින් බැහැරවූ ජාතික වගකීම පෙරටු කරගත් ගමන් මඟකට අවතීර්ණ විය යුතුව තිබේ. මෙහිදී ප්‍රඥාවෙන් යුතුව රට පෙරට රැගෙන යෑම සඳහා උතුර මෙන් දකුණත්, නැගෙනහිර මෙන් බටහිරත් සමගි සන්ධානයේ රැහැනින් ඇද බැඳ තබා ගැනීමේ මොහොත එළැඹ තිබේ. යුක්තිය, සාධාරණත්වය ඔස්සේ තිරසාර සාමය උදාකර ගැනීමේ ක්‍රියාදාමයේ දී අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කිරීමට සමත් වැඩ පිළිවෙළකට යෑම ඉතාමත් අවැසි වී තිබේ.

ප්‍රචණ්ඩත්වයේ සංස්කෘතිය වෙනුවට සැමට එක හා සමාන ලෙස නීතිය ක්‍රියාත්මක වීමත්, මත්ද්‍රව්‍ය ජාවාරම්, දුශ්ශීල හැසිරීම්, අල්ලස්, දූෂණ, අපරාධ ඇතුලු සෑම ආකාරයේ විනාශකාරී දෑ පිටුදකින්නට කාලය උදා වී තිබේ. නිදහස යනු තමන්ට කැමැති කුමක් හෝ කරන්නට ලැබෙන අයිතියක් ලෙස සිතන සංකල්පයෙන් බැහැර වී පරිණත වගකීමෙන් යුතුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය දෙයකි.

මේ තත්ත්වයන් මැද 64 වැනි ජාතික නිදහස් දිනය දේශය ගොඩ නැංවීමේ අදිටන පෙරටු කරගත් එකක් කර ගනිමු. නිදහසේ සැබෑ අර්ථය ද, පුරවැසි වගකීම් ද, දේශය ගොඩ නැංවීමේ අපගේ කාර්ය භාරයන් ද මෙනෙහි කරගත් සාමයෙන් පිරි සැබෑ නිදහස් දේශයකට පිය නගමු.

**+ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමි**
කොළඹ අගරදගුරු

**පසුගිය සතියේ මෙම පිටුවේ පළ වූ ශිරාන් මෛත්‍රී විසින් රචිත 'අමුඩයෙන් නිරුවත වසා ගත හැකි ද?' ලිපියේ ඉතිරිය 15 වැනි පිටුවේ යනුවෙන් සඳහන් වී තිබුණද ප්‍රමාද දෝෂයක් නිසා එය 15 වැනි පිටුවේ පළ වී නොතිබුණි. මේ එම ලිපියෙහි ඉතිරියයි.**

'පැට්‍රෝල්' වත් කළහ. මේ කිසිවක් කළේ රටේ බහුතර සිංහල හෝ දමිළ ජනතාව නොවේ. ඔවුන් වෙනුවෙන් පෙනී සිටින්නේ යැයි වහසි බස් දෙඩූ නායක කාරකාදීන් ය. මේ පිළිබඳව අන් කාටත් වඩා සාමාන්‍ය ජනතාවට අවබෝධයක් ඇත. එහෙත් අවාසනාවකට මෙන් බහුතර ජනමතය නමැති මේ නිසල යෝධයා නිදි ගන්වලා, නැතිනම් ගොළු කරලාය.
විවිධ පාර්ශ්වයන් වෙනස් මුහුණුවරින් සිය මතවාදයන් ඔස්සේ යළි යළිත් පෙනී සිටින්නට යන්නේ මේ නිසල යෝධයා වෙනුවෙනි. මේ නිසල යෝධයාගේ ගොඩට කතෝලික සභාව ද ඇද දමා නිල කතෝලික සභාව ලෙස හඬ නගන්නට මේ කූඩාරම් ගත මතවාදී හු නොයෙක් ආකාරයෙන් කැස කවති. රටේ ආර්ථික, සමාජයීය. සංස්කෘතික මෙන්ම දේශපාලනික තත්ත්වයන්හි විවිධත්වය තුළ තම තමන්ගේ කල්ලි, කණ්ඩායම් පෙරට රැගෙන ඒමේ න්‍යාය පත්‍රයන් මේ බොහොමයකට ඇත. එය පක්ෂ දේශපාලනයේ සිට සමාජ ක්‍රියාකාරකම් ඔස්සේ ආගමික සංස්ථා හරහා දියත් කිරීමේ වෑයම් විටින් විට මතුවේ. ඒ සියලු නිරුවත් වීම් වසා ගන්නට ඔවුහු 'දේශපාලන විසඳුම' අමුඩයක් කර ගන්නට යෑම හාස්‍ය ජනකය. අමුඩයෙන් පශ්චාත් ප්‍රදේශය ආවරණය නොවන බැව් ඔවුන් නොදන්නේ ද? එදා 'උතුරේ යුද්ධය' හිඟන්නාගේ තුවාලය කරගත් ආකාරයෙන්ම මෙදා 'දේශපාලන විසඳුම' ස්වකීය උදර පෝෂණයේ පටු අරමුණු උදෙසා සටන් පාඨයක් කර ගැනීම කිසිසේත් අනුමත කළ නොහැකි තත්ත්වයකි. එමෙන්ම රටේ අනාගත සුබසිද්ධිය වෙනුවෙන් කටයුතු කරනු වෙනුවට පටු අරමුණු සාක්‍ෂාත් කරගන්නට දරණ වෑයම් වලින් කබලෙන් ලිපට වැටෙනුයේ මෙරට ජනතාවය. මේ සියලු තත්ත්වයන් මැද යුක්තිය, සාධාරණත්වය හා ප්‍රේමය පෙරටු කරගත් සැබෑ කිතුනු දැක්මක් ඔස්සේ තිරසාර සාමය සඳහා කටයුතු කළ යුතුය. සැබෑ කතෝලික මඟ එය මිස අන් කවරක් ද?

## කැම්ලස්ගේ — තිත්ත ඇත්ත



## මීසමෙන් මීසමට

# මේ රටේ වසරකට ගබ්සා ලක්ෂ 3 ක් සිදුවෙනවා

## කාදිනල් හිමිපාණෝ අනාවරණය කරති

**"දෙවි පියාණන් අපට දෙන ලොකුම තෑග්ග දරුවන්. එම දරුවන් ප්‍රතික්ෂේප කිරීම මරණීය පාපයක්. මව් කුසේ සිටින දරුවාට තම අයිතීන් වෙනුවෙන් සටන් කරන්න බෑ. ඒ දරුවාට ජීවත් වීමේ අයිතියක් නැද්ද? අපේ රටේ වසරකට ලක්ෂ 3 ක් පමණ ගබ්සා සිදුවෙනවා. සිව් මහ ආගම් තියෙන මේ රටේ කිසිම ආගමකට මෙය ගැලපෙන්නේ නෑ. 'පුංචි පවුල රත්තරන්' කියන සංකල්පය අප කතෝලිකයන් හැටියට මුළුමනින්ම හෙලා දකිනවා."**

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මෙසේ අවධාරණය කළේ, පසුගියදා කොළඹ මරදාන, සා. ජෝශප් විදයාලයයීය ශාලාවේ දී කොළඹ අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවාවේ නියැලෙන යුවළ හා උපදේශන කණ්ඩායම් වලට අයත් පවුල් වල සහභාගීත්වයෙන් පැවැති වාර්ෂික සුහද හමුවේ ප්‍රධානත්වය ගනිමිනි.

අගරදගුරු පදවි පවුල් සේවා අධ්‍යක්ෂ ගරු ජුලියන් පැට්‍රික් පෙරේරා පියතුමන් ප්‍රමුඛ සංවිධායක කමිටුවක් මගින් මෙය මැනවින් සංවිධානය කර තිබුණි.

ගරු ජුලියන් පැට්‍රික් පෙරේරා පියතුමන් විසින් වාර්ෂික ප්‍රගති වාර්තාව ඉදිරිපත් කරන ලදී

ඒ ඒ වසරේ සිංහල / දෙමළ / ඉංග්‍රීසි උපදේශක (councelling groups) කණ්ඩායම් විසින් හරවත් නාට්‍ය හා විනෝද අංග වලින් උලෙළ විචිත්‍රවත් කරන ලදී. වසර පුරා විවාහාපේක්ෂක සමුළු වලදී දේශන ඉදිරිපත් කරන සියළුම යුවළ සඳහා අති උතුම් කාදිනල් හිමිපාණන් අතින් තිළිණ ප්‍රදානය කිරීම සිදුවිය.

සී. ආර්. ඩික්සන් ඇන්ටනි



බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි හිමිපාණන් සැම වසරක නත්තල් සතුට, බදුල්ල නගරයේ අසරණ අය සමඟ බෙදා ගනී. මෙවරද ඔවුන් සමඟ නත්තල් භෝජනය බෙදාගන්නා අයුරු. සහභාගි වූ පිරිස සමඟ මීසම් සේවක ගරු ප්‍රියලාල් කුරේ සහ අනෙකුත් ගරු පියතුමන්ද සේයාරුවේ වන අතර රදගුරු හිමිපාණන්ගේ කැමැත්ත වූයේ ඔවුන් වළඳන එම භෝජනයම එතුමා ද වැළඳීමයි.

සටහන - ශ්‍රීකාන්ති ගුණවර්ධන

සේයා - ගරු මාලන් ඇන්තනි පියතුමා

## වකුගඩුවක් ඕනෑ!



බරපතල වකුගඩු රෝගයෙන් පෙලෙන වයස අවු. 39 වයසැති අයිවන් පෙරේරා මහතා හට 'ධ' පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කිරීමට අවශ්‍ය වී ඇති අතර ඔහු දෙදරු පියකි. පරිත්‍යාගශීලි කෙනෙක් වෙතොත් 077-6781350 හෝ 031-2273727 අමතන්න.

## ඉඳිබැද්දේ බ්ලාසියුස් මංගල්‍යය පෙබ්‍ර. 05

උගුරේ ආබාධයන්ට සුවය ලබාදෙන ශුද්ධ වූ බ්ලාසියුස් මුනිඳුන්ට කැපකළ ඉඳිබැද්ද දෙව්මැඳුරේ වාර්ෂික මංගලෝත්සවය පෙබරවාරි 05 වැනිදාට යෙදී තිබේ.

මේ නිමිත්තෙන් විශේෂ සුව මෙහෙයක් පෙබරවාරි 04 දින පෙ.ව. 8.00 ට පැවැත්වේ.

මැක්ෂි ප්‍රනාන්දු

# මීසම් සභාවේ කාර්යය සමිඳාණන් ජනතාවට සමීප කිරීමයි



අද ඔබ නව මීසම් සභාවට පත්වී ඇත්තේ අන් අයට සමිඳුන් හඳුන්වා දීමටයි. ඔබේ ජීවිත ආදර්ශය තුළින් දේව ජනතාවට සමිඳාණන්ව ළංකිරීම ඔබේ කාර්ය ය යි. මෙම මීසම් සභාව මොන්ටිසෝරියක්වත්, පාර්ලිමේන්තුවවත්, විපක්ෂයවත් නොමෙයි. ධර්මය ජනතාව අතරට ගෙනයාමේ වගකීම අද පටන් ඔබට භාරයැයි කඩලාන මීසම් සේවක ගරු ලලිත් පෙරේරා පියතුමා කඩලාන සා. අන්තෝනි දේවස්ථානයේ නව මීසම් සභාව දිවුරුම් දීමේ දිව්‍ය පූජා යාගයේ දී පැවසීය.

නව වෙනස්කම් රැසක් ඇති කරමින් නව මීසම් සභාව පිහිටුවනු ලැබීය.

මේ අවස්ථාවට මීසම් සභාවට තේරී පත්වූ සියළුම සාමාජික මහත්ම මහත්මීන් සහභාගි වූ අතර දිව්‍ය පූජා යාගයෙන් පසු පියතුමන් මූලිකත්වයෙන් නව මීසම් සභාවේ මංගල රැස්වීම් වාරය ද පැවැත්විණි. මෙම අවස්තාවට සහයක ගරු මලින් චතුරංග පියතුමා හා පැවිදි සොහොයුරියෝ ද සහභාගි වූහ.

සූරත් ද සිල්වා

# කොටුගොඩ කිතුනු කම්කරුවෝ දිළිඳු ජීවිත නංවන්න කැපවෙති

කොටුගොඩ මීසම් සේවක ගරු ජුඩ් ලක්ෂමන් පියතුමන්ගේ සංකල්පයකට අනුව කොටුගොඩ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ මෙහෙයවීම මත ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන් විසින් මාසිකව ප්‍රදානය කරනු ලබන මූල්‍ය ආධාර එකතුවෙන් තෙවන වරට ද අඩු ආදායම්ලාභී පවුල් වල ඉගෙනුමට දක්ෂ සිසු දරුවන් 20 දෙනකු වෙත රු. 2500/- බැගින් මුදලින් ශිෂ්‍යාධාර පිරිනැමීම ද; ගරු පියතුමන් වෙත විවිධ පරිත්‍යාග ශීලීන්ගෙන් ලද ආධාර වලින් තවත් සිසුන් 22 දෙදෙනෙකුට පාසල් පොත් හා නිල ඇඳුම් බෙදා දීම ද සිදුවිය. මෙයට සමගාමීව කොටුගොඩ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ දැනුවත් කිරීම මත ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන් වෙතින් ලැබුණ ආධාර වලින් දිළිඳු පවුල් 15 කට පරිපූර්ණ වියලු ආහාර



ද්‍රව්‍ය අඩංගු මල්ල බැගින් ලබාදුන් අතර, ගරු ජුඩ් ලක්ෂමන් පියතුමා ආධාරලාභී කාන්තාවකට ආහාර ද්‍රව්‍ය මල්ලක් ප්‍රදානය කරන අයුරු.

සටහන - මැල්කම් සිල්වා

සේයා - ජානක ප්‍රනාන්දු



සීතාවක උරුමය විදහා දක්වන පුරා විද්‍යා, ආයුර්වේද සහ අධ්‍යාපන ප්‍රදර්ශනය පසු ගිය දා හංවැල්ල මැදි විදුහල් පරිශ්‍රයේදී පැවැත්වුණි. එහි සමාරම්භක උත්සවයට හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමා සහභාගි වූ අයුරු.

ඇන්තනි හෙට්ටිආරච්චි

## කුමාරකට්ටුව ජයන්තියට ධර්ම විවේකයක්

2012 ඔක්තෝබර් මාසයේ පැවැත්වීමට නියමිත කුමාරකට්ටුව ශු. ජපමාල මාතා දෙව්මැඳුරේ 75 වන දියමන්ති ජයන්තියට සූදානමක් වශයෙන් දෙව් මැඳුරට අයත් සියළුම කිතුනු ජනතාව නව තවත් දෙවියන් වහන්සේ වෙත ළංකිරීමේ අරමුණ පෙරදැරි කරගෙන ජනවාරි මස 24 වන දින සිට පෙබරවාරි මස 05 වන දින දක්වා ධර්ම විවේකයක් පැවැත්වීමට මීසම් සේවක ගරු සම්පත් උදාන පියතුමා කටයුතු කර ඇත.

ඊට සමගාමීව නිවාස ආසිරි ගැන්වීම හා කොට්ඨාශ මට්ටමින් දිව්‍ය පූජාවන් පැවැත්වීමත් සිදුකෙරේ. වෙන්නප්පුව නාසරෙත් හි නිමල මරිය නිකායික ගරු රෙජිනෝල්ඩ් ජයමහ පියතුමා ඇතුළු පියතුමන් දෙනමක් මෙම ධර්ම විවේකය සඳහා සම්පත් දායකත්වය ලබා දෙති.

ඇන්ටනි වීරසිංහ

# 125 ජයන්තිය සමරන පන්නල සා. ඇග්නස් දෙව්විමන



කුරුණෑගල පදවියේ කුලියාපිටිය දිසාවට අයත් පන්නල සා. ඇග්නස් මුනිවරියට කැපකරන ලද දෙව්මැඳුරේ 125 ජයන්ති සැමරුම ජනවාරි 29 වන ඉරුදිනට (අද) යෙදී ඇත.

කුලියාපිටිය පන්නල ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිවී ඇති සා. ඇග්නස් දෙව්මැඳුරේ වංශ කථාන දිගැහැරෙන්නේ ක්‍රි.ව 1886 සිටය. දෙව්මැඳුරක් සෑදීම සඳහා අක්කර 01 රූඩ් 03 පර්චස් 24 ක ඉඩම් කොටසක් යාපනේ ප්‍රතිරාජගුරු අති උතුම් ඇන්ඩෘ මෙලිසන් හිමිපාණන් විසින් මොරටුවේ ඩබ්. එම්. ඩී. මදලේනා හාමිනේ යන අයගෙන් රු. 40 කට මිලදී ගෙන ඇත.

පුදබිමක අසිරිය

1888 ජූලි 11 වන දින අක්කර 01 රූඩ් 02 ප්‍රමාණයේ බිම් කොටසක් කිරිහෙට්ටි ලියනගේ දොන් ජුසේ අප්පුහාමි යන අයගෙන්ද, 1913 දී කොළඹ අගරදගුරු අති උතුම් අන්තෝනි කුසේර් හිමිපාණන් විසින් කුරුකුලආරච්චිගේ දොන් මාර්ෂල් අප්පු යන අයගෙන් රු. 500 කට අක්කර 4 පර්චස් 38 ක බිම් කොටසක් ද, 1955 වසරේදී හලාවත රදගුරු අති උතුම් එඩ්මන්ඩ් පීරිස් නි.ම.නි හිමිපාණන් අක්කර 01 පර්චස් 18 ඉඩම මාර්ෂල් අප්පුහාමි මහතාගෙන් රු. 100 කටද මිලට ගෙන ඇත. මාර්ෂල් අප්පුහාමි මහතා දෙව්මැඳුර සෑදීම සඳහා තම දායකත්වය ලබා දී ඇත.

පන්නල දෙව් මැඳුර මුලින් අයත් වුයේ යාපනය පදවියටය. 1912 - 1948 දක්වා කොළඹ පදවියටත්, 1940 දී හලාවත පදවියටත් අයත්විය. එකල මීසම හාල්දඩුවන විය. 1912 හාල්දඩුවන මීසම බෙදා වෙන් කිරීම නිසා නාලවලාන වෙනම මීසමක් විය. පන්නල නාලවලානට අයත් විය. පන්නල දෙව්මැඳුරේ නිර්මාතෘ වරයා වන්නේ නාලවලාන මීසමේ පුරා වසර 17 ක් (1910-1927) සේවය කළ ගරු ලුවී ජෝශප් ලබෙර් නි.ම.නි පියතුමාය. කුරුණෑගල රදගුරු වසමට අයත් වූ ස්වාධීන මීසමක් විය. එයට මාහොලව බම්මන්න, හුනුවිල යන දෙව්මැඳුරු අයත් විය. එදා පවුල් සුළු සංඛ්‍යාවක් වූ වත් අද එය පවුල් 300 කට ආසන්න ප්‍රමාණයකට වර්ධනය වී ඇත. කුඩා කිතුනු සංඝ සංකල්පය මේ ප්‍රබෝධයට මගක් වී ඇත.

වත්මන් මීසම් සේවක ගරු පැට්‍රික් ජයකොඩි පියතුමා 125 වන ජයන්ති සැමරුම වෙනුවෙන් ප්‍රතිසංස්කරණය කළ අලංකාර දෙව්විමනක් මතු පරපුරට ලැබී ඇත.

ලූසිල්ඩා විජේසිංහ

# ගම්පහ බුදුනුවන්ගෙන් කිතුනුවන්ට සංග්‍රහයක්

පසුගිය නත්තලේ දී ගම්පහ සිරිකුරුස දෙව්මැඳුරට අයත් කිතුනු ජනතාවට ගම්පහ බෞද්ධ සැදැහැවත් ජනතාව විසින් විශේෂ සංග්‍රහයක් පිරිනමන ලදී.

නත්තල් මධ්‍යම රාත්‍රී දිව්‍ය පූජාව අවසන්වීමෙන් පසුව දහසක් පමණ වූ කිතුනු සැදැහැවතුන් වෙත ගම්පහ මැදගම සහන සුබසාධක සංගමය විසින් කේක්, රසකැවිලි සහ නෙස්කැෆේ වලින් සමන්විත සුහද සංග්‍රහයක් පිරිනමන ලදී.

බර්නාඩ් මනතුංග



ගොඩැල්ල කොස්ගහවත්ත ජනතාව වාර්ෂිකව පවත්වන දානය කොස්ගහවත්ත ජනපදයේ දී ගොඩැල්ල මීසම් සේවක ගරු මේරියස් ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමාගේ සහ ගරු නිමන්ත ප්‍රගීත් පීරිස් පියතුමාගේ (සහයක) ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි.

එච්. ඒ. සිරිල් පෙරේරා

සභා පියවරු 24 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

# අන්තියෝකියේ ඉග්නාසියස් තුමා

**පසුගිය සතිය හා සබැඳේ....**

## ප්‍රාණ පරිත්‍යාගවරයෙක් යනු කවරෙක් ද?

ජීවිතයේ ගැඹුරුතම අර්ථය ක්‍රිස්තුන් වහන්සේ තුළින් සොයා ගත් පුද්ගලයා එය ආරක්ෂා කර ගැනීමට, ඊට සාක්ෂි දැරීමට කිසිදු මැළිකමක් නොදක්වයි. එවැන්නෙක් මරණය තුළ පවා ක්‍රිස්තුන් වහන්සේව අත්දකියි. එවිට ජීවිතය සහ මරණය යනු පරස්පර විරෝධී යථාර්ථයන් දෙකක් නොව, එකිනෙකට ඒකාබද්ධ වූ සජීවී ක්‍රියාවලියකි. තම ජීවිතය පිදීමෙන් එතුමා සාක්ෂි දැරුවේ මරණයට නොව ජීවනයේ දෙවියන් වහන්සේට ය. සැබෑ ප්‍රාණ පරිත්‍යාගිවරයෙක් ඒ සඳහා දීර්ඝ කාලයක් තිස්සේ සූදානම් වේ. එසේ සූදානම් වන්නේ වඩා යහපත් ජීවිතයක් ගත කිරීමෙනි. ප්‍රාණ පරිත්‍යාගිවරුන් සාක්ෂි දරන්නේ මානව සංහතිය සඳහා වඩා යහපත්, වඩා සාධාරණ, වඩා මානුෂික, වඩා අභිමානවත් අනාගතයක් සකස් කර දීම සඳහායි. දේව රාජ්‍යයේ පදනම ප්‍රාණ පරිත්‍යාගිවරුන්ගේ රුධිරයයි. ප්‍රාණ පරිත්‍යාගිවරභාවය ලෝකයේ ජීවය සඳහා ය. ලෝකය ආලෝකමත් කිරීම සඳහාය. ඒ අනුව ප්‍රාණ පරිත්‍යාගිවර භාවය තුළ දේව වරප්‍රසාද අඛණ්ඩව ක්‍රියාත්මක වේ. කිතුනුවෙක්ව මරණයට පත් කිරීමට උත්සාහ කරන්නා, තීරණය කරන්නා සදාකාලිකවම පරාජිත පුද්ගලයකු බවට පත්වේ. ඔවුන් ඇවිදින මළ මිනී බවට පත් වේ. සත්‍යයට එරෙහි වන්නා සදාකාලික අන්ධකාරයේ ජීවත් වන්නෙකි. කිතුනුවන්ව මැරීමෙන්, පීඩාවට පත් කිරීමෙන් සත්‍යය පරාජය කළ නොහැකිය. ආලෝකය දුරුකළ නොහැකිය.

ප්‍රාණ පරිත්‍යාගවරුන් මිය යන්නේ වෛරය, අන්ධකාරය, මෝහය, ආත්මාර්ථකාමීත්වය, ද්වේෂය, අසත්‍යය, අයුක්තිය, අසාධාරණය යනාදිය තීරණාත්මකව පරාජය කරමිනි. අන්තියෝකියෝ ඉග්නාසියුස් තුමා සදාකාලිකවම ජීවත් වන්නේ ඒ නිසයි. එතුමාගේ සතුරන් සදාකාලිකවම මිය ගොස් ඇත්තේ ද ඒ නිසයි.

ප්‍රාණ පරිත්‍යාගවරුන් මිය යන මොහොතේ දී ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව සම්පූර්ණයෙන්ම හමුවේ. ඔවුන් මිය යන මොහොතේ දී සැබෑ නිදහස සහ පූර්ණ අවදිවීම ලබයි. මිය යන මොහොතේ දී ඔවුන් පරිපූර්ණ ලෙසම සැබෑ මනුෂ්‍යයන් බවටත්, ඒ නිසාම සැබෑ කිතුනුවන් බවටත් පත් වේ. දෙවියන් වහන්සේට ප්‍රාණ පරිත්‍යාගවරයකුගේ මරණය තුළින් සුවිශාල යහපතක් මානව සංහතිය සඳහා කළ හැකිය.

ඔවුන්ගේ ජීවිතයේ සෑම මොහොතකම ඔවුන් තම දූත මෙහෙවරට සාක්සි දරති. ඔවුන් ජීවත් වන සෑම තත්පරයක් තුළම දේව රාජ්‍යය යථාර්ථයක් බවට පත් වේ. සෑම ප්‍රාණ පරිත්‍යාගවරයෙක් ම තම ජීවිතය දානය කිරීමෙන් විවෘත කරන්නේ දේව රාජ්‍යයේ කවුළුවකි. දොරටුවකි.

ප්‍රාණ පරිත්‍යාගවර භාවය යනු කොන්දේසි විරහිත සාක්සි දැරීමයි. අන්තියෝකියේ ඉග්නාසියස් තුමා අනෙකුත් කිතුනුවන් ද තමන්ගේ අඩිපාරේ ගමන් කරයි යන්න බලාපොරොත්තු වූ බවක් පෙනෙන්නට නැත. එතුමාගේ පරමාර්ථය වූයේ තම ජීවිතය පරිත්‍යාග කොට, තම ජීවිතය කප්පමක් වශයෙන් ගෙවා, අනෙකුත් කිතුනුවන්ව එවකට පැතිර පවතිමින් තිබූ පීඩනයෙන් ගලවා ගැනීමයි. ආරක්ෂා කර ගැනීමයි. අනෙකුත් කිතුනුවන් සඳහා ආශිර්වාදයක් වීමට එතුමාට උවමනා වූ බව එතුමාගේ ලිපි ඉවසීමෙන් කියවන විට පෙනී යයි.

ඔසාමා බින් ලාඩන්, රෝහණ විජේවීර, වේලුපිල්ලේ ප්‍රභාකරන් සහ අන්තියෝකියේ ඉග්නාසියුස් තුමා අතර ඇති වෙනස කුමක් ද? ඉහත සඳහන් කළ පුද්ගලයන් තුන් දෙනාටම ඉග්නාසියුස් තුමාගේ ධෛර්යය, නිර්භීතකම, ගැඹුරු ඇදහිල්ල, නිහතමානීකම සහ මානව දයාව තිබුණේ නැත. ඔවුන් සැඟ වී ක්‍රියා කළේ ඒ නිසයි. නමුත් ඉග්නාසියුස් තුමා තම දූත මෙහෙවර ක්‍රියාවට නංවන ලද්දේ ප්‍රසිද්ධියේය. එතුමා රහස් කුමන්ත්‍රණවල නියැලුණේ නැත. බල අරගලවල යෙදුනේ නැත. එතුමා තම දූත මෙහෙවර ගැන කිසිම දෙයක් සැඟවූයේ නැත. සුබාරංචිය සැඟවිය හැකි ආරංචියක් නොවේ. සුබ දේවල් අප සැඟවීමට උත්සාහ නොකරයි. අප සැඟවීමට උත්සාහ කරන්නේ අසුබ දේවල් ය. හානිකර දේවල්ය. අවංක පුද්ගලයකුට සැඟවීමට දෙයක් නැත. කිසිවක් හොර රහසේ කිරීමට උවමනාවක් නැත. විවෘතභාවය සාක්ෂි දැරීමේ සජීවී කොටසකි. අවංක පුද්ගලයා විවෘත පුද්ගලයෙකි.

ප්‍රාණ පරිත්‍යාගවරයෙක් වීම සඳහා අවශ්‍ය ධෛර්යය, නිහතමානීත්වය සහ ගැඹුරු විශ්වාසය වගා කර ගත හැක්කේ දෙවියන් වහන්සේ තුළ නිරන්තරයෙන්ම ජීවත් වන, උන්වහන්සේව නිරන්තරයෙන්ම අත්දකින පුද්ගලයකුට පමණි. ප්‍රාණ පරිත්‍යාගවරයෙක් වීම සඳහා දෙවියන් වහන්සේ ඉතිහාසය තුළ ක්‍රියාකාරී වන ආකාරය ගැන ගැඹුරු දෘෂ්ටියක්, මෙනෙහි කිරීමක්, අචල ඇදහිල්ලක්, අති මහත් ඉවසීමක්, අවංක චේතනාවක් සහ අසීමිත දයා කරුණාවක් අවශ්‍යය.

ප්‍රාණ පරිත්‍යාගවරයෙක් වීම යනු සිය දිවි නසා ගැනීමක් නොවේ. ජීවිතය නාස්ති කරගැනීමක් ද නොවේ. අපතේ ඇමීමක් ද නොවේ. ජීවිතය අකාලයේ විනාශ කර ගැනීමක් නොවේ. සැබෑ ජීවිත පරිත්‍යාගයක් යනු ජීවිතය පරිපූර්ණත්වයට පමුණුවන ක්‍රියාවකි. සුළු ප්‍රමාණයේ මිය යෑම් කරන්නෙමු, වැයවීම් කරන්නෙමු. අපි අපටම හිස්වන ප්‍රමාණය අධික වන තරමට, මිය යන ප්‍රමාණය වැඩි වන විට, අපගේ ජීවිතය තව තවත් අර්ථවත් වේ.

**ලබන සතියට ...**

ධර්ම සංග්‍රහය

# ලේඛකයන්ගේ සහ මුද්‍රණකරුවන්ගේ සාන්තුවර

# ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් මුනිතුමා

*ලේඛකයන්ගේ සහ මුද්‍රණකරුවන්ගේ සාන්තුවරයා වන අප ශුද්ධවූ ප්‍රැන්සිස් සාලෙස් මුනිතුමන්ගේ ජීවිතය අනෙකුත් බොහෝ සාන්තුවර ජීවිතයන්ට වඩා වෙනස් බවක් පෙන්නුම් කරයි. ළමා කාලයේ පටන් එතුමා සාමාන්‍ය මිනිස් දිවිපෙවත තුළ සාර්ථක බවට සහ පරිපූර්ණ බවට පත් විය.*

එතුමාගේ ළමා කාලය ප්‍රාථමික අධ්‍යාපනය, නව යොවුන් විය, ද්විතික අධ්‍යාපනය, යොවුන් විය, විශ්ව විද්‍යාල අධ්‍යාපනය ආදී එක් එක් ස්ථරයන්හි එතුමන් සෙසු දරුවන් හා සමගාමීව ක්‍රියා කළහ. එහෙත් එතුමන් සැමවිටම සෑම ක්‍රියාවකදීම අන් අයට වඩා සාර්ථකව කැපී පෙණින.

අධ්‍යාපන කටයුතු මෙන්ම ජීවිතයට අවශ්‍ය ඉන් පරිබාහිර ක්‍රියාකාරකම් වලදී ද හොඳ සූදානමකින් යුතුව, ගැඹුරු අවබෝධයක් ලබාගෙන වටහාගත් දෙය ප්‍රගුණ කර පූර්ණත්වයට පත් කිරීම එතුමාගේ ක්‍රමවේදය විය. බුද්ධිය තුළින් දියුණු කළ ප්‍රඥාව නිසා ඕනෑම ගැඹුරු කාරණයක් පහසුවෙන් ග්‍රහණය කර ගැනීමට හැකි විය.

සාලෙස් කුමරු උපත ලද්දේ ක්‍රි.ව. 1567 අගෝස්තු මස 21 දින සවස 9 - 10 අතර බව සඳහන් වේ. සාලෙස් මාලිගයේ ඉතා කුඩා කාමරයක උපත සිදු විය. ඒ කාමරය අද කුඩා දෙව් මැඳුරකි. සාලෙස් කුමරුගේ පියා සහ මව ඉතා ධනවත් වංශවත් සිටුවරු වූහ. පියා ප්‍රැන්කොයිස් සෙයිග නර් ඩි නොවෙල්ස් නම් විය. කුමරු ඉපදීමට වසර හතකට පෙර ඉතා ධනවත් බොයිසි කුමරිය හා විවාහ විය. විවාහයේ දී බොයිසි කුමරිය හට බොයිසි පළාතම දායාද කොට දෙන ලදි. ඒ අනුව මේ දේපල මොන්සියෝර් මැඩම් බොයිසි ලෙස ප්‍රකට වූහ. එය ඉතා මනහර පැහැදිලි උදෑසනක් විය. ගහ කොළ නැවුම් බවක් දැක්විය. සැවෝහි උස් කඳු පෙළ අලංකාරව දිස්විණි.

බොයිසි කුමරිය පැය කිහිපයකට පෙර උපන් තම කිරිකැටි බිළිඳාව තුරුළු කරගෙන මඟට පිළිපන්නාය. ඇය සමග පවුලේ ඥාතීන්ද ගමන් කළහ. මේ ගමන දරුවා බෞතිස්ම කිරීම සඳහා දේවස්ථානය වෙතය. ප්‍රසාද ස්නාපනයේ දී දරුවා ප්‍රැන්සිස් බොන්වෙන්චර් යනුවෙන් නම් තබන ලදි.

ප්‍රැන්සිස් කුඩා කල හුරුබුහුටි කෙළිලොල් දරුවකු විය. සාමාන්‍ය දඟකාරකම් ඔහු තුළ විය. එසේ නොවුනි නම් ඔහු මෙතරම් ආදරවන්ත විය නොහැකිය. දිනෙක අරක්කැමි ගෘහය දෙසින් රස නහර පිනවන කේක් සුවඳක් ගලා ආයේ ය. ඔහු පැණිරස කෑම ප්‍රිය කළේය. හෙමිහිට ගොස් පෝරණුවෙන් කේක් තැටිය ඇද ගත්තේය. අත්වල ඇඟිලි හොඳ හැටි පිළිස්සිණ. එහෙත් කුමරු කේක් තැටිය හොඳ හැටි රසවින්දේ ය. ඒ සමඟම ඔහුගේ හෘද සාක්ෂිය අවදි විය. වහා දිවගොස් මව් තුරුළට වැදී තම ක්‍රියාව මවට පැවසීය. දරුවාගේ පිලිස්සුන ඇඟිලි දැක මව බියපත් වූවාය. ඊතැන් සිට අරක්කැමි දෙපාර්තමේන්තුව ඔහුට තහනම් ප්‍රදේශයක් විය.

වයස 7 වන විට ප්‍රැන්සිස් කුමරු ලාරොච්හි විදුහලකට ඇතුළත් කරන ලදී. එහෙත් වසර දෙකක් යන විට බොයිසි පවුලට සාලෙස් මාළිගය අතහැර වැබ්ලිස්හි පිහිටි බ්‍රෙන්ස් මාළිගයට යාමට සිදුවිය. ඒ අනුව කුමරා ඇනසි නගරයේ විද්‍යාලයකට ඇතුළත් කෙරිණි. එහිදී ඔහු ලතින් භාෂාව - ග්‍රීක රෝම සාහිත්‍ය හොඳින් හැදෑරිය. දියුණු කරගත් උසස් බුද්ධි මට්ටමකින්ද ප්‍රඥාවෙන් ද පරිපූර්ණ විය. වයසට වඩා මුහුකුරා ගිය දැනුමක් ද අසන්නන් සිත් තුළ ගැඹුරට කාවදින වාග් චාතුර්යයක් ද විය. දිනපතා අධ්‍යාපන කටයුතු හමාරවූ වහාම දේවස්ථානය වෙත දිව ගොස් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැහැදැකීම දරුවාගේ සිරිත විය. යහළුවෝද ඔහු අනුගමනය කරමින් ඔහු පසු පස දිව ගියහ. දේවස්ථානය වෙත දිව යන මේ දරු කැළ නගරයේ ඉතාමත් ආනන්ද ජනක දසුනක් විය. නගරවාසිහු ප්‍රැන්සිස් දරුවා ජීවමාන සුරදූතයකු යයිද පවුලේ මානික්‍යයයි ද පැවසූහ.

වසර දහය පිරෙද්දී ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමේ අවස්ථාව උදාවිය. ඉටිපහන් ආලෝකයෙන් බැබළෙන අල්තාරය ඉදිරියේ දරුවෝ පෙළ ගැසුනහ. ඕගනයේ ගැඹුරු හඬ ක්‍රමයෙන් අඩු වී ගොස් නැවතිණි. කුඩා රිදී සීනුවල මිහිරි නාදය පැතිරෙන්නට විය. පැහැපත් දිළිසෙන නිල්වන් දෑස් විදහා දන ගසා සිටි ප්‍රැන්සිස් දරුවාගේ මුහුණ දීප්තියෙන් බැබළිනි.

වසර 11 වන විට ප්‍රැන්සිස් දරුවා බුද්ධියෙන් ප්‍රඥාවෙන් මෙන්ම භක්තිමත් ශුද්ධවන්ත බවින් ද කැපී පෙණින. ඔහු හුරු බුහුටි මන බඳින රූපශ්‍රියෙන් යුතු විය. මෙම ආකර්ශනීය බව ඔහුගේ සිතට වද දෙන්නට විය. පිටස්තර අළංකාරයෙන් බැහැර වී චාම් ගතියට අවතීර්ණ වීමට ඔහුට අවශ්‍ය විය. අවසානයේ ඔහු තම අලංකාර රන්වන් කෙස් කළඹ කපා දැමීමට කණගාටුවෙන් වුවද තීරණය කළේය. තම සුමුදු කෙහෙරැළි කතුරේ නිර්දය යකඩ පෙති වලින් සිඳලීමට ඉඩ දුන්නේය. බොයිස් ආර්යාව මේ සියල්ල කවුළුවකින් බලා සිටියේ කොපුල්තල තෙත් කරමින් වැහෙන කඳුළු සමඟය. පිරිස නික්ම ගිය පසු ඇය ගොස් ඒ කෙහෙරැළි එකතු කර තම කාමරයට ගෙන ගියාය. ඉපදෙන්නට පැය කිහිපයකට පෙර තම දරුවා දෙවියන්ට පූජා කළ බව ඇයට මතක් විය.

වයස 13 දී එනම් ක්‍රි.ව. 1580 දී ප්‍රැන්සිස්ව පැරීසියේ ප්‍රසිද්ධ විද්‍යාලයකට යැවීමට පියා තීරණය කළේය. ප්‍රැන්සිස් මෙයින් කැළඹීමට පත්විය. නවාරෙහි පිහිටි එම විද්‍යාලයේ දී රාජකීය ප්‍රභූ හිතුවක්කාර තරුණයන්ගේ බලපෑම්වල ග්‍රහණයට - කෘරකම්වලට අසුවේ යැයි බිය විය. මවට මේ ගැන පවසා තමන් ඇන සිහි පිහිටි නීති විද්‍යාලයට යවන ලෙස ඉල්ලා සිටියේය. ශුද්ධවූ ඉග්නේෂියස් තුමාගේ ආශිර්වාදයෙන් සහ ස්ප්‍රීතුවෙන් පිරි එම විද්‍යාලය තුළ තම දරුවාට ශාරීරික මෙන්ම මානසික හා අධ්‍යාත්මික රැකවරණය ලැබෙන බව මව විශ්වාස කළාය. ඉතාමත් අපහසුවෙන් වුවද බොයිසි සිටුවරයාව මේ සඳහා කැමතිකර ගන්නා ලදි.

ආවේගයෙන් හෝ ඇඩි බවෙන් කලබලයෙන් නොව ඉවසීමෙන් බැහැපත්ව කරුණු අවබෝධ කරවීමෙන් ප්‍රශ්න ජයගත හැකි බවට මෙය කදිම ආදර්ශයකි.

නීති විද්‍යාලයේ දී ප්‍රැන්සිස් තරුණයා ඉමහත් ධෛර්යයෙන් ද කැපවීමෙන් ද දේශනා වලට සහභාගි වෙමින් පොත පත විමර්ශනය කරමින් අධ්‍යාපන කටයුතු උසස් මට්ටමක පවත්වාගෙන ගියේය. තම පියාගේ අරමුණ වූ රාජ්‍ය තන්ත්‍රයේ ඉහළ තානාන්තරයකට අවශ්‍ය බාහිර ක්‍රියාකාරකම් එනම් කාය වර්ධනය, අසුන් පිට යාම, අවිහරඹය ආදී ශිල්පීය පුහුණුව මෙන්ම නර්තනය වැනි කලාත්මක අංශයෙන් ද ශිල්ප ශාස්ත්‍රයන් ප්‍රගුණ කළේය. මේ සියල්ලට සමගාමීව තම දේව භක්තිය - යාච්ඤාව සහ අධ්‍යාත්මික වර්ධනය පවත්වාගෙන ගියේය.

එහෙත් හිටිහැටියේම නපුරු බලවේගයක ග්‍රහණයකට හසුවී බලවත් මානසික පීඩනයකට පත් විය. මේ අදෘශ්‍යමාන බලවේගය ඔහුව නිරයට ඇද දමන්නාක් මෙන් දැනින. යක්ෂයාගේ බලපෑම ඔහුගේ භක්තිමත් බව සහ යාච්ඤාව ඔහුගෙන් ඈත් කර අධ්‍යාත්මික ජීවිතය අකර්මන්‍ය කිරීමට උත්සාහ දරන බව පෙණින. ඔහු අසරණ විය. එහෙත් ප්‍රැන්සිස් වඩ වඩාත් දෙවියන්ට කන්නලව් කළේය. ඔහුගේ ශක්තිය නැතිවී විශ්වාසය ගිලිහී දෙවියන්ට ආඩපාලි කියනු ඇතැයි නපුරු බලවේගයේ අරමුණ බව පෙණිනි. ප්‍රැන්සිස් තරුණයා ශාන්ත ඇතිනා දේවස්ථානයේ දේව මාතා පිළිරුව ඉදිරියේ දණින් වැටී හඬමින් තමා නිරයේ ගිනිදැල් වලින් පිළිස්සුනත් දෙවියන් කෙරේ ආදරය, විශ්වාසය අත් නොහරින බවට ප්‍රතිඥා දුන්නේය. වඩාත් දෙව් මව්ට ලං වෙමින් සහනය පතා සිටියේය.

මෙම අධ්‍යාත්මික පීඩනය සති හයක් පමණ ඔහුව හෙම්බත් කළේය. අවසානයේ එම භයානක චිත්ත වේගය අප්‍රසන්න ලාදුරුවක් මෙන් ගිලිහී වැටින.

ඔහු ප්‍රකෘති තත්ත්වයට පැමිණ මානසික සුවයට පත් වී ඉමහත් භක්තියෙන් දෙව්මවුන්ට ස්තෝත්‍ර ගායනා කළේය.

☛ 15 පිටුවට



> **“ ප්‍රැන්සිස් තරුණයා ශාන්ත ඇතිනා දේවස්ථානයේ දේව මාතා පිළිරුව ඉදිරියේ දණින් වැටී හඬමින් තමා නිරයේ ගිනිදැල් වලින් පිළිස්සුනත් දෙවියන් කෙරේ ආදරය, විශ්වාසය අත් නොහරින බවට ප්‍රතිඥා දුන්නේය. ”**

✍ දළුගම
**මාකස් ජයසිංහ**

## ජන වන්දනාව

# මෙම දිව්‍ය සත්ප්‍රසාදීය දශකය තුළ දිව්‍ය සත්ප්‍රසාදීය ජේසුස් වහන්සේ ඉදිරියේ භාවනාත්මක යැදුමකි

★ ආදර සමිඳුනී, ඔබවහන්සේගෙන් යැපෙන මෙම හෝරාවේ ඔබවහන්සේ ඉදිරියේ මම තනි වූවාද? නැත්නම් ඔබවහන්සේ මාව තනි කළාද? ඔබවහන්සේ මා දෙස බලා නිහඬව සිටින්නේ මන්දැයි මට නොතේරේ.

★ දෙනෙතම කඳුලින් බර වූ දා කෙනෙක් සිටියේ නැහැ එය පිස දමන්නට. හිස ඔසවා බැලූවිට ඔබවහන්සේගේ දෙනෙත දුටුවා ජේසුනී! ඒ දෙනෙතේ ආදරයෙන් මම යළි ජීවය ලැබුවෙමි.

★ දිවියම ගින්නෙන් ඇවිළුනු දා ගිනි මැද්දෙන් මා ගිය ගමනේ ඔබවහන්සේව සොයන්නට වෙර දැරුවා ජේසුනී.

එදා මෙන් අදත් ඇවිළෙන මගේ හදවතට පවනක් වෙන්න සමිඳුනේ! මෙතෙක් නිහඬව සිටි උන්වහන්සේ "නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝය" ඔවුහු දේශය උරුම කරගන්නෝය" යයි යන්තම් මුමුණන හඬක් මට ඇසුණේ එදා කන්ද උඩ දේශනාවේද? නැත්නම් මට ද සමිඳුනී

★ ජීවිතයේ රළු පරළු මාවතේ වැටී වැටී මා හඬන මොහොතක දිරිය දී මගේ කඳුළු පිස දමන්න ඔබවහන්සේ පියෙක් වෙන්න. "මම මිහිපිට සාමය දෙන පිණිස ආවෙමියි නොසිතන්න. සාමය නොව කඩුවක් දෙන පිණිස ආවෙමි". එසේ පැවසූ ඔබවහන්සේ මා දෙස නොබලාම සිය කුරුසිය දරාගෙන මා අනුගමනය නොකරන තැනැත්තා මට සුදුසු නොවේ" යයි පවසමින් මාගේ නිදිබර දෑසට එබුණා මතකය.

★ රෝස මලක් බිම දමා පාගන්නා සේ සතුරන් ඔබවහන්සේව පාගා දැමූහ.

නැහැ ජේසුනී, මමයි ඔබව පාගා දමන්නේ. ඒ මිනිසා මමයි. මට සමාවෙන්න ජේසුනී. "සැබවින්ම මා සමඟ එක පැයක්වත් අවදිව සිටින්නට ඔබට බැරි වුණාද?" මට නැවතත් සමාවන්න ජේසුනී, ඔබවහන්සේ මෙසේ අසන විටයි මට මතක් වුණේ ඔබවහන්සේ ඉදිරියේත් මා කල්පනා ලොවට සිටි බව.

★ ප්‍රශ්නවලින් හෙම්බත්ව අන්දමන්දව සැරිසරන මා හිතුවා තවත් ඔබවහන්සේට මොර ගසා පළක් නැහැ කියා.

"වෙහෙසවන බර උසුලන සියල්ලෙනි, මා වෙතට එන්න. මම ඔබට සහනය දෙමි" මතකයෙන් ඈතට ගොස් තිබූ ඔබවහන්සේගේ වදන් එවේලේ මගේ මතකය අවදි කළා.

> **දෙනෙතම කඳුලින් බර වූ දා කෙනෙක් සිටියේ නැහැ එය පිස දමන්නට. හිස ඔසවා බැලූවිට ඔබවහන්සේගේ දෙනෙත දුටුවා ජේසුනී! ඒ දෙනෙතේ ආදරයෙන් මම යළි ජීවය ලැබුවෙමි.**

දෙතොල් වියැළෙන තෙක් මොරගැසූ මා හට ඔබවහන්සේ "අබ ඇටයක් පමණ ඇදහිල්ල ඇතිව මේ ඇඹිල්ල ගහට ඉදිරී ගොස් මුහුදේ පැලවෙවයි කියන්නහු නම් එය ඔබට කීකරු වනු ඇත" යන වදන් සමඟ මා පියවි ලොවට පිවිසියා.

★ ඔබවහන්සේගේ තිර පෙම දකින්නට මම අන්ධව සිටියෙමි. සමාවන්න ජේසුනී, මා වැරැදි බව පසුවයි වැටහුණේ.

මගේ දිවියේ හැම මොහොතකම ඔබවහන්සේගේ මුහුණ සොයන්නෙමි. "ස්වර්ගයේ වැඩ වසන මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටුකරන අය මිස මට "ස්වාමිනී, ස්වාමිනී යි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුළත් නොවන්නේය" යදින මා හට ඔබවහන්සේ තෙපල වදන් රන් හා සමානය.



★ ස්වර්ගයෙන් පැමිණි භෝජනය ඔබයි සමිඳුනේ. ඔබවහන්සේගේ ශරීරය, දිව බොජුනක් ලෙස අපට දුන්නේ එය වළඳන සැමට ස්වර්ගයට පිවිසෙන්නට ලෙහෙසි මාවතක් ලෙසයි. "මාගේ ස්වාමිනී, මාගේ දෙවියනී.

★ ඔබවහන්සේගේ අත් පා විහිදුවා රුදු කුරුසිය මත ගැසූ ඇණ පහරින් ඔබවහන්සේගේ ශ්‍රී වත සිදුරු වුණා. කල්වාරි කඳු මුදුනේ එය සිටුවා තිබුණි.
දුබල මිනිසුන් ඒ කුරුසිය හැර දා යන්නට සිතුවත් මම ඔබවහන්සේ සමඟින් නතර වෙන්නම් සමිඳුනේ.

★ ඔබවහන්සේ අපගේ ජීවිතයේ ආහාරයයි. සදාතන ජීවිතයේ මාවත ඔබවහන්සේයි. අපට ජීවය දෙන්නේ ඔබවහන්සේයි. සදා ජීවනයේ මාවත වෙත මා රැගෙන යන්න සමිඳුනේ. "පුනර්ජීවනය ද, ජීවනය ද මම වෙමි. මා අදහාගන්නා මැරුණත් ජීවත් වන්නේය. ජීවත්ව සිටින මා අදහාගන්නා කිසිවෙක් කිසිකලෙක නොමැරෙන්නේය. ඔබ මෙය අදහන්නෙහිද"යයි උන්වහන්සේ ඇසූ සේක. (ශු. ජුවාම් 11:25-26) ඔබවහන්සේ මාගේ හදවත ගැහෙනා රාවය වී සදා රැ දෙන්න ජේසුනී, මා හද තුළ පුරවා ඔබේ අසීමිත ආදරේ.

✍ තුඩැල්ලේ
**අයිරින් පෙරේරා**

---

## 2012 දේව වචනයේ වසර

# සාමාන්‍ය සමයේ සතරවන ඉරුදින



### පළමුවෙනි කියවීම (ද්විතිය නීති සංග්‍රහය 18:15-20)

මෝසෙස් ඉශ්‍රායෙල් ජනතාවට පවසන්නේ ඔහුට පසු දෙවියන් වහන්සේ දිවැසිවරයකු පත්කරන බවය. එම දිවැසිවරයා උන්වහන්සේගේ වචන ප්‍රකාශ කරන නිසා ඔහුට සවන් දීම ඉශ්‍රායෙල් ජනතාවගේ වගකීමයි. දෙවියන් වහන්සේගේ අභිමතයට එරෙහිව දිවැසිවැකි කියන්නා තම මරණයෙන් වන්දි ගෙවිය යුතුය. මෙම පාඨය ජුදෙව් හා ක්‍රිස්තියානි සම්ප්‍රදායන් තේරුම් ගත්තේ මෙසියස් තුමා සම්බන්ධයෙන් ය. ක්‍රිස්තු භක්තිකයන් වන අප අපගේ බෞතිස්මය කරණකොට ගෙන දෙවියන් වහන්සේගේ වචනය ලොවට ප්‍රකාශ කරන්නන් විය යුතුය.

### දෙවෙනි කියවීම (1 කොරින්ති 7:32-35)

කොරින්තිවරුනට ලියන ලද පළමුවන ලිපියේ පාවුළුතුමා විවාහ ජීවිතය හා පැවදි ජීවිතයේ වෙනස අවධාරණය කරමින් පවසන්නේ පැවදි ජීවිතයට ඇතුළුවන්නා දේව සේවයට පූර්ණ ලෙස කැපවිය යුතු බවය. පවුලක බරක් නොමැති පැවදි අය දේව සේවය සම්බන්ධයෙන් තමන්ගේ පූර්ණ කැපවීම උරගා බැලිය යුතු කරුණකි.




### ශුභාරංචිය (මාක් 1:21-28)

ජේසුස් වහන්සේ ඉගැන්වීමේ අධිකාරි බලය අත්දුටු ජනයා විමතියට පත්වූහ. උන්වහන්සේ පෞරුෂයෙන් නික්මුණු එම අධිකාරී බලය වඩාත් පිළිබිඹු වූයේ උන්වහන්සේගේ මහත් ක්‍රියා හේතුකොටගෙන ය. මෙයින් පෙනී යන්නේ දේව වචනය ක්‍රියාශීලි හා බලගතු බවත් ය. දෙවියන් වහන්සේගේ වචනය සිද්ධීන් ඇතිකරන සුලුය.

### මෙනෙහි කිරීම

බෞතිස්මය කරණකොටගෙන අපට ප්‍රදානය කෙරෙන දිවැසිවරයා ක්‍රියාත්මක කළ යුත්තේ අප ජීවිත සාක්ෂිය තුළින් දෙවියන් වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීමෙන් ය.

පැවදි ජීවිතයෙන් බලාපොරොත්තුවන පූර්ණ කැපවීම පළමුකොට ජීවිත සාක්ෂියෙන් ශුභාරංචියට සාක්ෂි දැරීමය. අධිකාරි බලයෙන් ශුභාරංචිය ප්‍රකාශ කිරීම යනු දේව වචනය අපේ එදිනෙදා ජීවිත තුළ ජීවත් කර එයට සාක්ෂි දැරීමය එවිට දෙවියන් වහන්සේ අප මඟින් මහත් ක්‍රියා කරන සේක. ජේසුස් වහන්සේගේ ඉගැන්වීමේ අධිකාරි බලය ප්‍රකාශ වූයේ ද ඒ අයුරින් ය.

---

**ගරු හෙන්රි සිල්වා පියතුමා** 20

# උත්පත්ති පොත




## 5. උත්පත්ති හතර වන පරිච්ඡේදය පාපය පිළිබඳ දෙවන කථාව

## කායින් සහ ආබෙල්ගේ කථාව

### මුලාශ්‍ර

1. තුන්වන සහ හතරවන පරිච්ඡේදයන්හි සඳහන් තේමා බෙහෙවින් සමානය. එනම් පාපය, දඬුවම හා ........ උපත සමග දිස්වෙන ගැලවීම පිළිබඳ බලාපොරොත්තු.

2. භාෂාව හා සාහිත්‍යමය ශෛලියයද සමාන බැවින් මුලාශ්‍රය යාවිස්ත සම්ප්‍රදායය වෙයි.

### ඓතිහාසිකත්වය

මෙම පරිච්ඡේදය වචනාර්ථයෙන් අර්ථකථනය කරන්නට යාමෙන් බරපතළ ඓතිහාසික ගැටළු මතු වනු ඇත.

1. කායින් ගොවියකු බවද ආබෙල් සතුන් ඇති කරන්නකු බවද කියැවෙන බැවින් මෙම කථා පුවතට අනුව කෘෂිකර්මය හා සතුන් ඇති කිරීම මනුෂ්‍ය වර්ගයාගේ මුලාරම්භයේදීම ඇතිවූ බවත් පෙනේ. කෘෂිකර්මය හා සත්ත්ව පාලනය ආරම්භ වුයේ ක්‍රි.පු. 10, 000 පමණය. එහෙත් මිනිසා දැනට අවුරුදු මිලියනයකට පෙර පටන් මිහිපිට වාසය කර ඇත.

2. කායින් තම පුත් එනොක්ට නුවරක් තැනූ බව සඳහන් වෙයි. (4/17) මිනිසා නගර තැනීම ආරම්භ කළේ ක්‍රි.පූ. 8, 000 පමණය. මේ තාක් අවබෝධ කරගෙන ඇති පරිදි පැරණිතම නුවර ජෙරිකෝ බව කියැවේ.

3. ලෝ කුරුවන් (ලෝහ කම්කරුවන්) හා කූඩාරම් සාදන්නන් කායින්ගෙන් පැවත එන්නන් බව කියැවෙයි. (4/20-22) මිනිසා ලෝහ සමඟ වැඩ කිරීම ආරම්භ කළේ ක්‍රි.පු. 5,000 න් පසුවය.

4. කායින්ගේ භාර්යාව පිළිබඳ සඳහන් කරන බැවින් පළමු මිනිසා සහ ස්ත්‍රියද ඔවුන්ගේ දරුවන් දෙදෙනා ද හැරුණු කොට වෙනත් මිනිසුන් ද සිටි බව මෙම වෘත්තාන්තය පෙන්නුම් කරයි. (4:17) තවද දෙවියන් වහන්සේ කායින්ට දඬුවම් නියම කිරීමෙන් පසු ඔහු මෙලෙස පවසයි. මා හමුවට එන කවරෙකු හෝ වේවා මා මරා දමනු ඇත". (4/14)

මේ සියල්ලම පෙන්නුම් කරනුයේ කථා පුවත ඓතිහාසිකව අර්ථකථනය නොකළ යුතු බවය.

**ව්‍යුහය** 'පාපය - දඬුවම - ගැලවීම පිළිබඳ බලාපොරොත්තුව' යන රාමුව මත එය ගොඩ නගා ඇත.

### පණිවුඩය

1. මිනිසා විසින් දෙවියන් වහන්සේ වෙත පුදනු ලබන හොඳම යාග පූජා පිළිබඳව දෙවියන් වහන්සේ ප්‍රසන්නවනසේක. ඒනිසා, පසුකාලීනව මොසෙස්ගේනීතියෙහි සඳහන් කෙරෙන පරිදි (ලෙවී 3, 1) ආබෙල් සිය බැටළු රැළේ කුළුදුල් පැටවුන් ගෙන් සමහරකු ද ඔවුන්ගේ හොඳම කොටස් ගෙන දෙවියන් වහන්සේට පූජා කරනු දක්නට ලැබේ.

2. පවුකරුවා පාපයට වැටීමට පෙර දෙවියන් වහන්සේ ඔහුට අනතුරු ඇඟවීමක් කරන සේක. දෙවියන් වහන්සේ කායින්ට මෙලෙස පවසන සේක. 'පාපය රකුසකු සේ නුඹේ දොරකඩ ලැග සිටින්නෙහිය.' (4/7)

3. පාපය යනු, දෙවියන් වහන්සේට නියත අයිතිවාසිකමක්සේ සැලකෙන යමක් මිනිසා තමන් සතු කර ගැනීමට උත්සාහ කිරීමය. ජීවන හුස්ම දානය කරන්නේ දෙවියන් වහන්සේ වන බැවින් ජීවිතය අයත් වන්නේ දෙවියන් වහන්සේට පමණකි. එබැවින් කිසියම් හෝ වාතාවරණයක් යටතේ මිනිසාට එම අයිතිය උදුරා ගත නොහැකිය.

4. දේව කරුණාව පතා තමන් වහන්සේ වෙත හැරෙන ඉතාමත්ම දුෂ්ට පව්කාරයාට පවා සමාව දීමට දෙවියන් වහන්සේ සුදානම්ව සිටින සේක. දෙවියන් වහන්සේ කායින්ගේ නලලෙහි සලකුණක් තබන සේක. "කායින් හමුවන කවරකු වුවත් ඔහු නොමරණ පිණිස සමිඳාණන් වහන්සේ ඔහු පිට ලකුණක් තැබූ සේක." (4/15)

5. පාපය වැඩිවන විට එහි ප්‍රතිඵලද ජ්‍යාමිතික අනුපාතයකින් ඉහළ යයි. මෙය ගනු ලබන්නේ කායින්ගෙන් පැවත එන්නකු ලෙස හැඳින්වෙන ලාමෙක් අසීමිතව පලිගැනිම පිළිබඳ උදාහරණයෙනි. තමනට තුවාල කිරීම නිසා ලාමෙක් මිනිසකු මරා දමයි. (4/24). පලිගැනිම හැත්තෑවරක් හතකි. (70 ෦ 7) එහි අර්ථය සීමා රහිත බවය. හත සම්පූර්ණත්වය සංකේත කරන අතර දහය පරිපූර්ණත්වය සංකේත කරයි.

(තවත් කොටසක් ලබන සතියේ...)

# ශු. සභාවෙන් ඈත් වන පෞරාණික දේ නැවත කරලියට ගෙනෙමු

**කතුතුමනි,**

ශුද්ධ වූ සභාව සතු පෞරාණික වටිනාකමකින් යුත් වස්තූන් රැසකි. සභාවේ වත් පිළිවෙත් සඳහා උපයෝගි වන දේ ද ජනතා ආකර්ශනය දිනාගත් වස්තූන් ද මේ අතර වේ. අතමිට සරු අය මේවා දැක බලා ගන්නට වතිකානය, ශුද්ධ වූ දේශය, ලූර්දුව, පාතිමාව ආදී තැන් නැරඹීම සඳහා යොමුවන්නේ මේවා කෙරෙහි දක්වන භක්ත්‍යාදරය පෙරදැරි කරගෙනය.

මේවා ආශ්‍රිතව අප රටට අප දෙව්මැඳුරු වලට ද මෙම පෞරාණික දේ උරුමව ඇත්තේ බොහෝ විට සභාවේ වත් පිළිවෙත් සඳහා ද මේවා උපයෝගි වන නිසාය. මේවා අතර පැරණි සෑම දෙව්මැඳුරකම ස්ථාපිතව ඇති ප්‍රසාද ස්නාපනය සඳහා උපයෝගීවන විශේෂ ස්ථානය ප්‍රමුඛය. දරුවකු ප්‍රසාද ස්නාපනය ලැබීමේ දී මුල් වත් පිළිවෙත් අතරට ගැනෙන ජලය හිසමත මුදා හරිනුයේ මෙම විශේෂ වූ භාජනයට හිස යොමු කරමිනි. මේ වන විට මෙම ස්ථානය කෞතුක වස්තුවක් බවට පත් වෙමින් ගරු පියවරුන් අල්තාරය මත දීම ජලය හිස මත ඉසීමෙන් මෙම පිළිවෙත සිදු කිරීමට යොමුව ඇත. මේ නිසා මේ වෙනුවෙන් වෙන් වූ ස්ථානය අභාවයට යමින් පවතී.

දෙව්මැඳුරට ඇතුළු වන පිට වන විට ආසිරි පැන් වලින් ආලේප කර ගැනීම සඳහා දෙව්මැඳුරු වලට ඇතුළු වන දොරටුවල සවිකර තිබූ ආසිරි පැන් භාජන ද ක්‍රම ක්‍රමයෙන් අහෝසි වෙමින් පවතී. ඒවා සවිකර නැතිව හෝ ඒවාට ආසිරි පැන් පිරවීම අතපසු වෙමින් පවතී. මේ ක්‍රමය ද ක්‍රම ක්‍රමයෙන් ජනතාවගෙන් බැහැරවෙමින් පවතී. පාපොච්චාරණය සඳහා වූ දණ පුටුව ද බොහෝදුරට අහෝසි වී ඇත. ඒ වෙනුවට පුටුවක් තබා පියතුමා වාඩි වී සිටින අතර භක්තිකයා ඒ අසලින් දණගසා පාපොච්චාරණය කරගැනීමට පුරුදු වෙමින් පවතී. එයට නම් නව අර්ථකථන දෙමින් පවතී. අල්තාරය මත තිබූ ගරු පියවරුන් යාච්ඤාව සඳහා තබා තිබූ දණ පුටුවට ද මේ තත්ත්වයම උදා වෙමින් පවතී. එය එතැන තිබුණ ද ගරු පියවරුන් එතැන දැක ගත නොහැකිය.

අප වෙතින් ගිලිහී යන මේ වටිනා දේවල් නැවත පණ ගැන්වීම අනාගත පරපුර වෙනුවෙන් කෙරෙන මහඟු සෙතකි. අවධානය යොමුවේවා!

**සිසිල් පෙරේරා**
කෙරවලපිටිය

# දයාවේ දූතිකාවන්ට කළ නිග්‍රහයට බලවත් කණගාටුව

**කතුතුමනි,**

රාවතාවත්ත ප්‍රේම් නිවාසය වැටලීමෙන් එහි ප්‍රධාන මව්තුමිය ඇතුළු අනෙකුත් පැවිදි සොහොයුරියන් වෙත සිදුකළ අපහසුතාවයට කතෝලිකයන් වශයෙන් කම්පාවටත්, කණාග ටුවටත් පත් වී සිටිමු. උගත් රජයේ නිළධාරීන් යැයි කියන පිරිසක් විසින් දුරකථන ඇමතුමක් ලැබූ පමණින් සොයා නොබලා සිදු කරන ලද මෙම අකටයුතු ක්‍රියාව අප විසින් හෙළා දකිමු. කන්‍යා සොහොයුරියන් වාසය කරන්නාවූ නිවසකට පැමිණි පොලිස් බලය පෙන්වා ප්‍රධාන මව්තුමියව අත් අඩංගුවට ගැනීමද ඉතා අශෝභන ක්‍රියාවකි.

තම මව් රටින් පිටත්ව පිට දේශයකට පැමිණ වසර තිහක් තුළ ඔවුන් කරන්නාවූ මෙම සමාජ මෙහෙවර ඉතා ශ්‍රේෂ්ඨ වන අතර මෙහි සිටින අසරණ දරුවන් සහ මව්වරුන්ට දක්වන කරුණාව මිල කල නොහැක. මෙම අසරණයන්ව රජයට ද බරක් නොකර තම වෙහෙස මහන්සියෙන් පිට රට ආධාර පවා ලබාගෙන කරන මෙම බාරදූර කර්තව්‍යයට තුති පැසසුම් කළ යුතු අවස්ථාවක මෙම මඩ පහර ගැසීම ඉතා කණගාටුවදායකය. කොතරම් බාධක, දුක්කම්කටොලු පැමිණියත් ඒවා ජයගෙන ඉදිරි කටයුතු ධෛර්‍යමත්ව කිරීමට ප්‍රධාන මව්තුමිය ඇතුලු පැවිදි සොහොයුරියන්ට මේ මොහොතේ නිරන්තර දෙවිඳු පිහිට ආරක්ෂාව ද ප්‍රාර්ථනා කරමු.

මෙම ලංකාද්වීපය තුළ සිදුවන නොයෙකුත් අපරාධ, නීති විරෝධි ජාවාරම්, ගණිකා නිවාස මෙලෙස වැටලීම් සිදුකර මාධ්‍යයට එලිනොකරන්නේ මන්ද කියා, මෙම ඊනියා රාජ්‍ය නිළධාරීන්ට පැනයක් කතෝලිකයන් වශයෙන් අප විසින් ඉදිරිපත් කර සිටිමු.

**එම්. කේ. සිල්වා**
දඬුගම

# අපේ රටේ කතෝලික ආගම රෝමානු ද, ශ්‍රී ලාංකික ද?

**කතුතුමනි,**

ඒකත්වය, ශුද්ධත්වය, කතෝලිකත්වය හා අපෝස්තලිකත්වය කතෝලික සභාවේ (සංඝයේ) සුලක්ෂණ හතරක් බව අපි කුඩා කාලයේ ඉගෙන ගතිමු. කතෝලිකත්ත්වය යනුවෙන් අදහස් කරනු ලබන්නේ කතෝලික ධර්මය විශ්වීය බවයි. එය ලෝකයේ සකල ජාතීන්ට ම විවෘත බවයි. ජේසුස් වහන්සේ සිය ජීවිතය පූජා කළේ උපන් - නූපන් සකල මනුෂ්‍ය වර්ගයාට ම විමුක්තිය ලබාදෙන පිණිස ය.

“ස්වර්ගයෙහි ද, පොළොවෙහි ද සියලු බලය මට දී ඇත. එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න” (මතෙව් 28:19) යැ යි ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ට අණ කළ සේක. කතෝලික සංඝයට (සභාවට) ජාති, කුල, වර්ණ, භාෂා, ස්ථාන භේද කිසිවක් නැත. “ඔවුන් වහන්සේ (ජේසුස් වහන්සේ මිනිස් බවගෙන, ඔවුන් වෙන් කල, ඔවුන් අතර වෛරය ඇති කළ මැද බිත්තිය කඩාදැමූ සේක” (එපීස 2:14).

කතෝලික සංඝයට (සභාවට) “රෝමානු කතෝලික සභාව” යැ යි කියන්නේ, ශු. පේදුරු තුමා එම සභාව රෝම පටුනෙහි පිහිටවූ නිසාත්, ශුද්ධෝත්තම පියතුමා රෝමයෙහි වැඩ සිටින නිසාත් යැ යි අපට කුඩා කාලයේ උගන්වන ලදී. ජේසුස් වහන්සේ තම සභාව පිහිටවූයේ රෝමයේ නොවන බවත්, ජෙරුසලමේ දී බවත් අපි දැන් දනිමු. කතෝලික ධර්මය (ජේසුස් වහන්සේ ඉගැන්නු ධර්මය) කතෝලික සංඝයේ (සභාවේ) බූදලයක් නො වේ. එය විශ්වයට ම සාධාරණය. කතෝලික සංඝයට රෝමානු ඇඳුම ඇන්දවූයේ රෝම අධිරාජ්‍යයේ රජවරුය. කතෝලික සංඝය දේශානුරූපී විය යුතු බව දෙවැනි වතිකාන ජගත් මන්ත්‍රණ සභාව අවධාරණය කරයි.

“සංඝය, කතෝලික වීමට කැඳවීමක් ලබා ඇත. එම කැඳවීමට විශ්වාස වන්ත වීමට නම්, එය ලතින් වත්, ග්‍රීක් වත්, ස්ලාම් වත් නො විය හැකි ය. ඉන්දියාවේ ඉන්දියානු ද, ජර්මනියේ දී ජර්මානු ද, චීනයේ දී චීන ද විය යුතුය. එලෙස ම අප රටේ එය ශ්‍රී ලාංකික විය යුතුය. නො එසේ නම්, සංඝය (සභාව) කතෝලික නො වේ. කිතුනු සංඝය පිටුව 67 ගරු හිලේරියන් දිසානායක නි.ම.නි පියතුමා.

කරුණු මෙසේ වෙතත්, ‘රෝමානු’ විශේෂණය තවම කතෝලික සංඝයෙන් සම්පූර්ණයෙන් ගැලවී නැත. “රෝමානු කතෝලික පාඨශාලාව” යන නම පුවරු දැන් බොහෝ දුරට ඉවත් වී ඇතත්, රජයෙන් මුද්‍රණය කෙරෙන විභාග ප්‍රශ්න පත්‍රවල හා කතෝලික පොත්වල ‘රෝමානු’ විශේෂාංගය තවමත් මැකී නැත. රෝමානු ‘ඉජීප්තුවේ’ වහල් භාවයෙන් අප වහාම නික්ම යා යුතුය.

**ප්‍රැන්සිස් ජයසිංහ**
දංකොටුව

# මේ ක්‍රිස්තු වර්ෂ 2012

**කතුතුමනි,**

ලොව වසන සැමදෙනාටම මිහිරි අමිහිරි මතක සටහන් රැසක් ඉතිරිකොට 2011 වසර පසුගිය දෙසැම්බර් 31 දා මධ්‍යම රාත්‍රි 12 න් පසු සමුගෙන ඉතිහාසයට එක්විය. 2012 වසර උදාවිය. එයින් ද දින කිහිපයක් ඇනටමත් ඉතිහාසයට එක්වී හමාරය. කාලය මොහොතින් මොහොත වසරින් වසර අප පසුකරගෙන ඉදිරියටම ගමන් කරයි. කිතු උපතත් සමඟ ලෝක ඉතිහාසය දෙකඩවිය. ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තියට පෙර ක්‍රිස්තු පූර්ව වශයෙන් ද කිතු උපතට පසු ක්‍රිස්තු වර්ෂ වශයෙන් ද ‘වර්ෂ ක්‍රමය’ ලෝක ප්‍රජාව භාවිතා කරන්නට විය. එසේ ලෝක ඉතිහාසය දෙකඩ වූ අතර කිතු උපතට පෙරත් කිතු උපතට පසුත් ‘ක්‍රිස්තු’ යන නාමය ලෝක ඉතිහාසයේ බැබලෙන්නට විය.

කිතුනු ඇසින් බලනවිට මෙම පෙරළිය ශුද්ධාත්ම යාණන් වහන්සේ ඉතිහාසය තුළ ක්‍රියාකරන බවට ප්‍රබල සාක්ෂියකි. ශුද්ධාත්මයාණෝ විශ්ව ඉතිහාසය පුරා ක්‍රියාත්මක වෙමින්, ක්‍රිස්තුන් වහන්සේ වෙත මිනිස් අපගේ නෙත් සිත් අවධිකරමින් සිටින සේක. එය පුදුමයට කරුණක් නොවේ. ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේම ය. යම් දිනක මුළු විශ්වයම ක්‍රිස්තු රජාණන්ගේ ශ්‍රී දෙපා පාමුල එක්සේසත් කරන්නේ ශුද්ධාත්මයාණෝ ය. ‘ක්‍රිස්තු’ නාමය ඉතිහාසය තුළ බබළවමින් ශුද්ධාත්මයාණන් වහන්සේ අපහට පෙන්වා දෙන්නේ කාලයේ ස්වාමියාණන් දෙවියන් වහන්සේ වන බව ය. ‘ක්‍රිස්තු වර්ෂ’ යන්න අප සවනට වැටෙත්ම කිතුනුවන් සැටියට අප දකින්නේ ක්‍රිස්තුන් වහන්සේ කාලය හා සමඟ ජීවමානව වැඩවසන බවය.

දෙවියන් වහන්සේට ඉතිහාසයක් නැත. මන්ද දෙවියන් වහන්සේ ආරම්භයක් අවසානයක් නැතිව සදාකාලිකව වැඩවසන තැනැන්වහන්සේ නිසාය. එහෙත් මිනිස් අපට ඉතිහාසයක් ඇත. ඒ අප සීමිත නිසාය. ඒ හේතුවෙන් මිනිසාට කාලය අතිශයින් වැදගත්වේ. ජීවත්වන සීමිත කාලය තුළ මිනිසා කාලයත් සමඟ ඉතිහාසගතවන සිද්ධීන් උත්සවාකාරයෙන් සමරණ අතර එම මතකයන් ආවර්ජනය කරති. වර්තමානයේ අප ජීවත්වන්නේ ක්‍රි.ව. 2012 වසරේය. වසර මතක්වන සැමවිටම අපට මතක්වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ අති උත්කෘෂ්ඨ මාංශගතවීමයි. දෙවියන් වහන්සේ අප හා සමාන මිනිසකු වී ඉපිද අප සමඟ වාසය කිරීමයි. එමනිසා ක්‍රිස්තු වර්ෂ කිතුනුවාට අතිශයින් වැදගත්වේ. කිතුනුවකු සැටියට ලියනවිට, වැදගත් සටහන් තබනවිට, ලිපි යවන විට දිනය සටහන් කිරීමට පෙර ක්‍රි.ව. 2012 - මාසය - දිනය වශයෙන් යෙදීම උචිතයයි සිතමි. ඥානාර්ථ ප්‍රදීපය, ළමා ප්‍රදීපය වැනි කිතුනු පුවත් පත්වල මේ ක්‍රමය දැනටමත් පවත්වාගෙන යාම පිළිබඳව පැසසිය යුතුය.

ශ්‍රී ලංකාවේ පළවන වෙනත් ජාතික පුවත් පත්වල නිකම්ම නිකං 2012 යනුවෙන් සටහන් කරයි. තවත් පුවත් පත්වල වර්ෂ 2012 කියා සටහන් කරයි. තවත් සමහර අන්‍යාගමික ගොඩනැගිලිවල රාජ්‍ය වර්ෂ කියා සටහන් කර තිබෙනු මා දැක ඇත. සියලු රාජ්‍යයන් භාවිතා කරන හෙයින් රාජ්‍ය වර්ෂ කියා භාවිතා කරනවා විය හැක. නොඑසේනම් ක්‍රි.ව. කියා සටහන් කිරීමට අකමැතිකම නිසා එසේ කරනවා විය හැක. කෙසේ වෙතත් 2012 යනු ක්‍රිස්තු වර්ෂය. එමනිසා කිතුනුවන් සැටියට කාලයේ ස්වාමින් වහන්සේට කෙරෙන ගෞරවයක් වශයෙන් ද, දෙවියන් වහන්සේ මනුෂ්‍යයා වීමේ අති උතුම් මාංශගතවීමේ අභිරහසට ගෞරවයක් වශයෙන් ද තම කටයුතු වලදී ක්‍රිස්තු වර්ෂ (ක්‍රි.ව.) යනුවෙන් (ක්‍රි.ව. 2012 යනුවෙන්) සටහන් කිරීමට පුරුදු වුවහොත් යෝග්‍යයයි සිතමි.

**කොල්වින් ඒ. ප්‍රනාන්දු**
කටුනේරිය

# ගබ්සාව නීතිගත කිරීමට ඉඩ නොදෙමු

**කතුතුමනි,**

මේ දිනවල කිතුනු අපට පිළිකුල උපදවන තවත් පාපකාරී අසංවර පණතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරවා ගැනීමට ලහි ලහියේ පිඹුරු පත් සකසන බවට කරුණු අනාවරණය වෙමින් පවතියි.

බලහත්කාර කමින් හෝ ලේ ඥාතීත්වයක් ඇති අයකු විසින් තමන්ගේ කැමැත්ත නොමැතිව ගැහැණියක ගැබ් ගැනීමට සැලැස්වීම ඇයට කරන අසධාරණයක් ලෙස සලකන එම උපද්‍රවයට ලක් වූ තැනැත්තියට ගබ්සාවක් කර ගැනීමට නීතියෙන්ම ඉඩ ප්‍රස්තාව සැලසීම යෝජිත පනතේ මූලික පරමාර්ථයයි.

කිතුනු ඉගැන්වීම අනුව මෙය මිනිස් ඝාතනයකට ඉඩ සලසා දීම බව පුන පුනා කිව යුතු නැත. බුදු දහම අනුවද ප්‍රාණ ඝාතය විශාල අකුශල කර්මයක් බව ඉතා පැහැදිලිය. ඇතැම් බටහිර රටවල ක්‍රියාත්මක වන පාපකාරී ක්‍රමවේදයන් අප රටේ ද නීති ගත කිරීමට ඉඩදීම කුමන දහමකට හෝ අනුකූල නොවන්නකි.

මෙම පහත් පනත ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍යය අමාත්‍යාංශය හා අධිකරණ අමාත්‍යාංශය ද සම්බන්ධ කර ගෙන ඇති බව පෙනේ. කිතුනුවන් වශයෙන් කිතුනු කමට සාක්ෂි දැරීමට මෙය අවස්ථාවක් වන බැවින්, සියලු කිතුනු පාර්ශවයන් එකතු වී මෙයට විරුද්ධව කටයුතු කළ යුතු මෙන්ම, පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ - විපක්ෂ සියලු කිතුනු මන්ත්‍රිවරුන් තම හෘද සාක්ෂියට එකඟව මේ පනත පරාජය කිරීමට පෙරමුණ ගනු ඇතැයි ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් අපි බලාපොරොත්තු වෙමු.

**ලූෂන් ෂර්ලි එඩ්වඩ්**
ගෝනවල





# ශ්‍රී ලංකා ධර්මදූත ළමා සමාජයට විසිපස් වසර සපිරේ

ශ්‍රී ලංකාවේ වසර 60 ක් පමණ පැවති බාල පරාය සංගමය නමින් හැඳින් වූ මෙම කතෝලික දරුවන් සඳහා වෙන්වී තිබූ ළමා සමාජය දිවයිනේ කතෝලික පාසල් කිහිපයකට පමණක් සීමා වී තිබුණි. කතෝලික පාසල් රජයට පවරා ගැනීමත් සමගම මෙම ළමා සමාජය අඩපණ වී ගියේ අවාසනාවන්ත ලෙසය.

සමාජ විෂමතා හා පරිහානිය තුළින් හටගත් ප්‍රතිඵල අප දරුවන්ගේ ජීවිත බිලි ගනිමින් විනාශයේ බලවේගය අපට සරදම් කරන අවධියක එහි භයානක ප්‍රතිඵල තේරුම්ගත්, එවකට ශුද්ධාසනීය ධර්මදූත සංගම්හි ජාතික අධ්‍යක්‍ෂ තනතුර දැරූ අතිගරු මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් (එවකට පියතුමා) මෙම "බාල පරාය" නමින් තිබූ ළමා සමාජය "ධර්මදූත ළමා සමාජය" නමින් පණගැන්වූහ.

කුඩා දරුවන් ධර්මදූතයන් කිරීමේ මහඟු අභිප්‍රාය පෙරදැරි කරගෙන, විශේෂයෙන් කතෝලික දූ දරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීමටත්, එම විශ්වාසය තුළ ඔවුන් ජීවත් කරවමින් එම අත්දැකීම අන් අය හා බෙදා ගැනීමටත් හුරු කිරීමට තරුණ පිරිස් පෙළඹවීමට වර්ෂ 1987 සැප්තැම්බර් මස 12,13,14 දිනයන්හි අනුරාධපුර, හිඟුරක්ගොඩ දී පළමුවන ධර්මදූත ළමා සමාජ ඒකක මෙහෙයවන සජීවක පුහුණු සම්මේලනයක් පවත්වන ලදි.

අනුරපුරයේ රෝපණය කළ ධර්මදූත ළමා සමාජය අද සිංහල - ද්‍රවිඩ භේදයකින් තොරව ලක් සසුනේ සෑම පදවියකටම ව්‍යාප්ත වී තිබීම සතුටට කරුණකි.

හෙට උදාවන ලොවේ වැඩිහිටියා අද දරුවා බැවින් ඔවුන් සුරැකීම අපේ පරම යුතුකම වේය. එබැවින් මල් වගේ ලස්සන ජීවිත මිලින වී යන්නට ඉඩ නොදී මතු අනාගතයට භාග්‍යවත් ජුසේ වාස් මුනිතුමන් සැබෑ ධර්මදූතයින් පිරිසක් ත්‍යාග කිරීමේ පරම අදිටනින් ක්‍රිස්තු තුමන් සමගින් මේ ගමන් මඟ පියමං කිරීම ධර්මදූත ළමා සමාජයේ පරමාර්ථය වේ.

...ා සමාජය

...යේ නැංසි නුවර
...ැන් ද ජැන්සන්
... විසින් මෙම ළමා
...ම්භ කරන ලද්දේ,
...ගේ පිරිහී ගිය
...නැවත පෝෂණය
...කිතු සමිඳුන්
...නාගෙන ඒ අනුව
...ටත්, එම කැපවීම
...යේ ඕනෑම රටක
...ශ්‍යතාවයන් වෙත
... කිරීමටත් ය.

**2011 ළමා ධර්මදූත ඉරුදින සඳහා එක් එක් පදවිවලින් ලැබුණු දයකත්වය**

| පදවිය | අරමුදල |
|---|---|
| අනුරාධපුරය | 53,177.00 |
| බදුල්ල | 36,935.00 |
| හලාවත | 415,626.00 |
| කොළඹ | 1,509,708.00 |
| ගාල්ල | 42,601.00 |
| යාපනය | 202,149.00 |
| මහනුවර | 254,384.00 |
| කුරුණෑගල | 179,905.00 |
| මන්නාරම | 153,782.00 |
| රත්නපුර | 78,500.00 |
| ත්‍රිකුණාමලය /මඩකලපුව | 112,735.00 |
| එකතුව | 3,039,502.00 |

...අධ්‍යක්‍ෂක, ශුද්ධාසනීය ධර්මදූත සංගම්, නො. 19, බැල්කම් පෙදෙස, කොළඹ 08.
...3 E-mail - ndpms@sltnet.lk Website : www.pontificalmissionlk.org

## ...පෙබරවාරි 10 වැනිදා



...ැඩි වෙහෙසක් දරා තිරයට නැවත ගෙනාවේය.
...න් ග්‍රෙගරි සිනමාවලෝකනය තුළ ඔහුගේ
...රතුරු මෙන්ම එදා මෙදා සහය
...යෙන් දායක වූ චිත්‍රපට පිළිබඳව මෙන්ම
...ය කළ චිත්‍රපට පිළිබඳවද තොරතුරු ඇතුළත්
...ට අමතරව නිළි රැජිණ මාලනී ෆොන්සේකා,
...ධර ජෝ අබේවික්‍රම, ප්‍රවීණ රංගන ශිල්පී
...න්දෙනිය, චිත්‍රපට අධ්‍යක්‍ෂ නීල් රූපසිංහ, ප්‍රවීන
... ඒ. ඩී. රංජිත් කුමාර ආදීන් ලියූ ලිපි ද
...ැතුළත් වේ.

## ...න්ටන් ග්‍රෙගරි සිනමාවලෝකනය" ග්‍රන්ථය

...එළි / ...් අප / ...ර්මික / ...ගමුව / ...ාන්දු / ... මහ / ...නමා / ...ි. / ... නිළි / ...ාලනී / ...දනය / ...න්දීය), / ...ලිටස් / ...න්දීය), / ...දනය / ...සහය / ...ාලනී / ...කයා

ටෝනි රණසිංහ - චිත්‍රපට 11
රවීන්ද්‍ර රන්දෙනිය - චිත්‍රපට 09
එඩී. ජයමාන්න - චිත්‍රපට 05
සනත් ගුණතිලක - චිත්‍රපට 04

ගායක එච්. ආර්. ජෝතිපාල මා සේවය කළ චිත්‍රපට 41 ක ගී ගයා ඇත.

**මා සේවය කළ අධ්‍යක්‍ෂවරු**

1. ඇම්. මස්තාත් (ගුරුතුමා - ඉන්දීය)
2. ගාමිණි ෆොන්සේකා
3. ලෙනින් මොරායස්
4. නීල් රූපසිංහ
5. ටයිටස් තොටවත්ත
6. දයා විමලවීර
7. තිමති වීරරත්න
8. කේ. වෙන්කට්
9. ජේ. සෙල්වරත්නම්
10. අරුණශාන්ති
11. නිහාල් ඒ. ජයසිංහ
12. සිරිල් පී. අබේරත්න
13. ජෝදේව් ආනන්ද මහතා
14. ඒ. සී. තිරුලෝගචන්දර් මහතා (පයිලට් ප්‍රේමනාත්)
15. ආරියදාස පීරිස් මහතා ("මන්දාරම් වැහි" - විජය කුමාරතුංගගේ අභාවය නිසා අවසන් කිරීමට නොහැකි විය.)

★ සමාජ සේවකයෙක්
★ කලා අංශයට අයිති සමිතිවල තනතුරු ලබා සේවය කළේය. දැනුත් සේවය කරන්නේය.

මා පළමු සහය අධ්‍යක්‍ෂණය කළ චිත්‍රපටය "අල්ලපු ගෙදර" (119 වෙනි චිත්‍රපටය)
තිරගතවූයේ 1965.09.17 දා ය.
අධ්‍යක්‍ෂණය - ඇම්. මස්තාන්
නිෂ්පාදනය - කේ. ගුණරත්නම් (සීමාසහිත සිනමාස් සමාගම)

**මා සේවය කළ චිත්‍රපට කීපයක්**

★ අල්ලපු ගෙදර ★ සූර චෞරයා
★ ආත්ම පූජා ★අටවෙනි පුදුමය
★ සූරයන්ගෙත් සූරයා ★ දැන් මතක ද?
★ හතර දෙනාම සූරයෝ ★ (නව) හතර දෙනාම සූරයෝ
★ සරදියෙල්ගේ පුතා (දෙවෙනි කණ්ඩායමේ අධ්‍යක්‍ෂණය)
★ හාරලක්ෂය ★ එදත් සූරයා අදත් සූරයා
★ ආවා සොයා ආදරේ ★ සුළි සුළං
★ සූරයා සූරයාමයි ★ කොටි වලිගය
★ නොමියෙන මිනිසුන්

සම අධ්‍යක්‍ෂණය - දෙවියනී ඔබ කොහිද?, හිතවතිය
කාර්මික අධ්‍යක්‍ෂණය - නීලා, මිස් මල්ලිකා

# කිතු දහම වැළඳගත් අලගියවන්න මුකවෙටි කිවියා

හෙළ අපට "සුභාසිතය", "දහම් සොඬදාකව", "සැවුල් සංදේශය,", "කුස ජාතකය හෙවත් කුස ජාතක කාව්‍ය" යනාදිය හොඳින් හුරු පුරුදුය. අභාග්‍යයකට මෙන් තත්කාලීන පාසල් සිසුන් මේවා නො දැන සිටියත් මෙම කෘතීන් හෙළ සාහිත හුරු සැවොම හොඳින් දනිති. අගයති.

මෙම කෘතීන් ලියා ඇත්තේ පඬිවර අලගියවන්න මුකවෙටි කිවිඳාණන් ය. අලගියවන්නයන් උපත ලැබුවේ ක්‍රි.ව. 1552 දීය. සීතාවක රාජධානියේ සියනෑ කෝරළේ හිස්වැල්ල නමැති ග්‍රාමයේ උපන් ඔහු ගේ පියා දහම් ධජ හෙවත් ධර්මද්වජ ය. හේ උගතෙකි. අලගියවන්න ද පත පොත කෙරෙහි ඇලුම්ව සිංහල පාලි, සංස්කෘත සහ දමිළ භාෂාවන් හොඳින් උගත්තේ ය.

හෙළ සාහිතයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වෙන්නේ ක්‍රි.ව. 1411 සිට 1466 දක්වා වූ කෝට්ටේ හයවැනි පරාක්‍රමබාහු රජ කළ කාලය යි. එහෙත් ඉනික්බිති උදා වූ සොළොස් වැනි සහ දසසත් වැනි සත වසර කාලය ඒ අතින් අඳුරු යුගයක් විය. මේ කාලය තුළ දිස්වුණු එක ම පහන් තරුව අලගියවන්න කිවියාණන් යැයි කිව හැකිය.





අලගියවන්නයන් ගේ කවි ඉතා උසස් මට්ටමක පැවැති බවත් එකල මෙන් ම අද දක්වා ම ජනප්‍රියව පවතින්නේ යැයි කිවහොත් අතිශයෝක්තියක් නො වනු ඇත. හෙළ සාහිතයේ රසය ඉඳුල් කට ගා ඇති කෙනකු වුවත් සුභාසිතය නො දන්නවා නො වේ. සංස්කෘත, පාලි සහ දමිළ ලියකියවිලි ආභාසය ලබා අලගියවන්න ලියූ වියත්, ප්‍රඥාවන්ත කියමන් අඩංගු සුභාසිතය හෙළ සමාජය අතර සුප්‍රකට යි.

මෙම කිවියා බෞද්ධ ග්‍රන්ථ රැසක් ලීවේ ය. ඉන් එකක් වන "දහම් සොඬදාකව" බුදු සමිඳුන් ගේ පෙර පැවැත්මක් විස්තර කෙරෙන කවි පෙළකි. මෙය "රසවාහිනි" නමැති පාලි ග්‍රන්ථය අනුකරණය කොට ඇත. තවත් ග්‍රන්ථයක් වනුයේ "සැවුල් සන්දේශය"යි. මෙයින් විස්තර කෙරෙන්නේ සැවුලකු සංදේශයක් රැගෙන සීතාවක සිට සබරගමුවේ මහා සමන් දේවාලය වෙත ගොස් සමන් දෙවිඳුනට එය බාර දීම යි. ඉන් ඉල්ලා සිටිනුයේ සීතාවක, ක්‍රි.ව. 1581 සිට 1592 දක්වා සිටි රාජසිංහ රජුට සමන් දෙවිඳුන්ගේ ආරක්ෂා පිහිටයි. "කුස ජාතකය" හෙවත් "කුස ජාතක කාව්‍ය"ය ද බෞද්ධ ජාතක කතාවක් ඇසුරෙන් ලියන ලද්දෙකි. මෙය උකටලී වූ එක්තරා භික්‍ෂු කෙනකුන් අරභයා ජේතවනාරාමයෙහි දී දේශිත යි.

මෙම කිවියා උපතින් බෞද්ධයකු වුවත් පසු කලෙක කිතු දහම වැළැඳ ගත්තේ ය. ඔහු කිතු දහම වැළැඳ ගත්තේ ක්‍රි.ව. 1612 දී ය. ඔහු ගේ ක්‍රිස්තියානි නම වශයෙන් යොදා ගෙන ඇත්තේ ජෙරෝනිමෝ යන්නයි. මේ නම ඔහු ගේ ඥාන පියා වූ ලංකාවේ ප්‍රථම පෘතුගීසි කපිතාන් - ජනරාල් ව සිටි (1597 - 1614) ඩොම් ජෙරෝනිමෝ ද අසවේඩෝ ඔහුට ලබා දුන්නයි විශ්වාස කෙරේ.

අලගියවන්න මුකවෙටි කිවියා කතෝලිකයකු වූ බව තවදුරටත් සනාථ වන්නේ ප්‍රංශ ජාතික සංචාරකයකු වූ ජාන් - බැප්ටිස්ට් ටවර්නියර් "ට්‍රැවල්ස් ඉන් ඉන්ඩියා" (Travels in India) නම් ග්‍රන්ථයේ ලියා ඇති සටහන අනුව යි. දසහත් වැනි සිය වසරේ මැද කාලයේ ඉන්දියාවට පැමිණි මොහු - අලගියවන්න කොළඹ විසූ ජේසු නිකායික පියවරුන් නිතොර හමු වී කිතු දහම හොඳින් උගත් බවත් ඉනික්බිති ප්‍රසාද ස්නාපනය ලද බවත් පැහැදිලිව සඳහන් කරයි.

මෙම ජේසු නිකායික විදුහලට පැමිණි වියතාණන් මෙහි දී කිතු දහම පමණක් නො ව ලතින් බස ද උගත් බවත් ඔහු ශුද්ධවු සුවිශේෂය කියැවූයේ ලතින් බසින් ම බවත් සඳහන් වන්නේ ය.

කිතු දහම වැළඳගත් පසු ඔහු ලියූ ග්‍රන්ථයෙකි කුස්තන්තීනු හටන. මෙය සිංහල සටන් කතාවෙකි. මෙම කාව්‍යයෙන් විස්තර කෙරෙන්නේ කොන්ස්ටන්ටයින් ද සා නොරොඤ්ඤෝ නමැති පෘතුගීසි පාලකයා හා ඔහු කළ සටන් පිළිබඳ වර්ණනාත්මක විස්තරයකි.

සාහිත්‍ය කෘතියක් වශයෙන් මෙහි විශේෂත්ව කිහිපයක් ඇත. මෙය යුද ගැටුමක් ගැන ලියැවී ඇතත් කිතුනු ආකල්ප රැසක් එහි අඩංගු වී ඇත. මේ නිසා මෙය ප්‍රථම මෙන් ම පැරණි හෙළ සාහිත්‍යයේ එකම කතෝලික කාව්‍යය ලෙස හඳුන්වා දිය හැකිය. එසේ ම කුස්තන්තීනු හටන, ආදි සිංහල සාහිත්‍යයේ අවසාන සම්භාව්‍ය වූ කාව්‍යය වන්නේ ය. මෙයින් සිංහල සාහිත්‍යයේ කීර්තිමත් යුගයක් අවසාන වන්නේ ය. මෙම කාව්‍යය පළමු යුද සටන් කාව්‍යය සැටියට ද හඳුන්වා දිය හැකි ය. මින් පසු නිර්මාණය වූ හටන් කවි රැසෙකි. "මහා හටන", "පරංගි හටන", "ඉංගිරීසි හටන" ආදිය මෙ වැනි කිහිපයකි.

තවදුරටත් කුස්තන්තීනු හටන ප්‍රශස්ති ගීයක් ද වන්නේ ය. පසළොස් වැනි වසරේ ලියැවුණ පැරකුම්බා සිරිතට සමාන වන මෙය පෘතුගීසි පාලකයා වූ කොන්ස්ටන්ටයින් ද සා ගේ කෙරුම් වර්ණනා කරයි. මේ සියල්ලට අමතරව මෙම කාව්‍යය විශේෂ වන්නේ මෙය සන්දේශ කාව්‍යයක ස්වරූපය ද ගන්නා හෙයිනි. එහි කුස්තන්තීනු ද සා සහ ඔහුගේ හේවායින් කැරැලි කරුවන් සමඟ සටනේ දී ගත් ගමන් මඟ විස්තර කෙරේ.

මෙය ස්ථිර වශයෙන් ම කතෝලික කාව්‍යයක් බව කිව හැකි ය. මෙහි දී කිතු දහම එක්තරා ආකාරයකින් දේශානුරූප කැර තිබීම විශේෂයකි. හෙළ සාහිත්‍ය ශෛලය රකින අතර කිතුනු ආකල්ප ද එයට ඇතුළු කර ඇත. මේ සඳහා එක් නිදසුනක් වන්නේ බුදුනු කිවියන් තෙරුවන් නමදින අතර, මොහු ශුද්ධවූ ත්‍රිත්වයට නමස්කාර කරයි. මෙහි සඳහන් වී ඇත්තේ ශුද්ධවූ ත්‍රිත්වය, ජේසු සමිඳාණන් සහ මරියෝත්තමාවන් ය.

කාව්‍යයේ අවසානය ද එසේ ම ය. කාව්‍යයන් නිම කිරීමේ දී තුති පිදීම, පැසැසුම් කිරීම, සුබ පැතීම, ආසිරි ගැන්වීම සම්ප්‍රදායකි. මෙම කාව්‍යයේ දී කිවියා කිතු සමිඳුන් ගෙන් සහ මරියෝත්තමාවන් ගෙන් ද කොන්ස්ටන්ටයින් ද සා සෙන්පති වෙත ආසිරි අයැද කාව්‍යය නිම කරයි. මෙහි දී වැඳුම් පිදුම් සියල්ල විස්තර කෙරෙන්නේ හෙළ සිරිත අනුවයි. කවියෙහි කොන්ස්ටන්ටයින් ද සා හෙළ සිරිත අනුව කිතු සමිඳුන් ගේ දෙපා වඳින්නේ ය. එසේ ම ත්‍රිත්වේක දෙවිඳුන් ද දෙ පා වැඳ නමස්කාර කරනු ලබන්නේ ය.

කවියේ යෙදෙන උපමාලංකාර ද ඉතා රසවත් ය. වදනක ලක්ෂණ තුනෙකි - සංකේතය හෙවත් ලකුණ, ශබ්දය (එය ශබ්ද කෙරෙන ආකාරය) සහ එහි අර්ථය යනු මේවා ය. අලගියවන්නයෝ තම කෘතියේ ශුද්ධ වූ ත්‍රිත්වය මෙයට සමාන කරති. කන්‍යා මරියෝත්තමාවන් හිරු - ගලකට සමාන කැර ඇත. එයින් ගිනි දැල් නික්මුණත් ගල පළුදුවන්නේ නැත.

මෙසේ හෙළ උපමා රැසක් මෙන් ම පැරණි භාරතීය ජනප්‍රවාද රැසක් ද මෙහි යොදා ඇත. මේ ආකාරයෙන් අලංකාර කොට ඉතා දක්ෂ ලෙස කිතු දහම දේශානුරූපීව ඉදිරිපත් කැර ඇති අලගියවන්න මුකවෙටි පඬිවරයාණනට හෙළ කිතුනු පරපුරම ණය ගැති වන්නේ ය.

(මෙම ලිපිය සඳහා මාහිමි ඩබ්. එල්. ඒ. දොන් පීටර් පියතුමා ගේ ද, අති උතුම් එඩ්මන්ඩ් පීරිස් හිමිපාණන් ගේ ද, කේ. බී. ඒ. එඩ්මන්ඩ් මහතා ගේ මහා සිංහල ශබ්ද කෝෂයෙන් ද දත්ත ස්වල්පයක් ලබාගත් බව කෘතඥව සඳහන් කරමි.)

කලා සංග්‍රහය

# අන්ධ කලාකරුවකුගෙන් ඔබට ආයාචනයක්!



නිමල් ජෝශප් මෙන්ඩිස් මහතා දෑස් නොපෙනෙන අන්ධ අයෙකි. රාගම සා. ජෝශප් අන්ධ ගොලු බිහිරි විදුහලෙන් හා රත්මලාන අන්ධ විදුහලෙන් අධ්‍යාපනය හැදෑරීය. එහිදී ඉංග්‍රීසි භාෂාව ලිවීම, කියවීම හා කතා කිරීමද සංගීත භාණ්ඩ වාදනය කිරීම හා ගීත ගායනය ද ප්‍රගුණ කළේය.

ඉන් පසු සංචාරක හෝටල් වල සංගීත භාණ්ඩ වාදනය කරමින් ගීත ගායනා කරමින් හා නිවෙස් වලට ගොස් ළමුන්ට ඉංග්‍රීසි භාෂාව හා සංගීත භාණ්ඩ වාදනය උගන්වමින් කටයුතු කරයි. ගීතිකා ලිවීමට උනන්දුවක් ඇති වීම නිසා පද රචනා හා තනු නිර්මාණය කර 'සෙනෙහසේ ගීතය' නමින් පොතක් මුද්‍රණය කළේය. ඒ සඳහා මාහට ආචාර්ය ඩබ්ලියු. එල්. ඒ. දොන් පීටර් මාහිමි අරමුදලින් ආධාර ලබා දුනී. 2001 වසරේ ජාතික කතෝලික ලේඛක හවුල මගින් පැවැත්වූ සාහිත්‍ය දිනය වෙනුවෙන් ඇගයීම් සම්මානයක් හා සහතික පතක් ඔහුට හිමි විය.

මේ වන විට නත්තල් ගීතිකා කිහිපයක් රචනා කර තනුද සපයා ඇති ඔහු 2011 වසරේ අගරදගුරු පදවි ජනසංනිවේදන කේන්ද්‍රය මගින් පැවැත්වූ නත්තල් ගීත හා තනු නිර්මාණ තරගයට එම ගීතිකා ඉදිරිපත් කළේය. මේ ගීතිකා සැදැහැවත් ජනතාව අතරට පත්කිරීම ඔහුගේ ආශාව වූවත් එය කිරීමට තරම් ආර්ථික ශක්තියක් නොමැත. මේ සඳහා නිෂ්පාදකයකු හෝ ආධාර කරන්නට කැමති අයටයි මේ ආරාධනා කිරීම සැමවිටම සිදුවන්නේ ඇයගේ අතිනී. මාගේ දියණිය ගෙන් මා හට විශාල උපකාරයක් ඒ සඳහා ලැබෙන්නේය. මාගේ ආශාව හා බලාපොරොත්තුව C/D තැටියක් මගින් මෙම ගීතිකා සහෝදර සැදැහැවත් ජනතාව අතරට ගෙන ඒමයි. මෙම කාර්යය කිරීම සඳහා ඔබතුමාගේ හා සහෝදර ජනතාවගේ අනුග්‍රහය හා නොමසුරු සහයෝගය ඉතාම කාරුණිකව අයැද සිටිමි. නිමල් ජෝශප් මෙන්ඩිස්, නො. 83/B/7, පේරකොටුව, මාත්ගමුව කඩුගන්නාව ඔහුගේ ලිපිනයයි. මීගමුව සෙලාන් බැංකු අංක 01303135497910 1 දරණ ගිණුමට ද මුදල් බැර කළ හැකිය.

## එඩ්වඩ් අයිවන් පෙරේරා ගේ මගෙ දෙවි උතුම් 2 එළිදකී



*කිතුනු ගායකයෙකු වන පයාගල එඩ්වඩ් අයිවන් පෙරේරා ගේ ගීතිකා අඩංගු දෙවන සංයුක්ත තැටිය සුවය සමිඳුන්ගෙන්මයි (මගෙ දෙවි උතුම් 2) එළිදැක්වීම පසුගිය දා කුඩා පයාගල සා. මරියා දෙව් මැඳුරේ සාම දහම් ශාලාවේදී පැවැත්වුණි. මේ අවස්ථාවට කළුතර සිරිකුරුස විදුහලේ විදුහල්පති අධ්‍යක්ෂ ආචාර්ය ගරු කැමිලස් ප්‍රනාන්දු පියතුමා, මීගමුව මහවීදිය මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු, මග්ගොන සා. විසෙන්ති ළමා නිවාසයේ ගරු අජිත් පෙරේරා නි.ම.නි පියතුමා, පයාගල මීසම් සේවක ගරු නිලන්ත උඩුවක යන පියතුමන් ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ. මෙදින සංයුක්ත තැටියේ අඩංගු ගීතිකා කිහිපයක් ගායනා කරනු ලැබීය. එම උළෙලේ ප්‍රධාන ආරාධිතයාණන් වන ගරු කැමිලස් ප්‍රනාන්දු පියතුමා පොල්තෙල් පහන දැල් වූ අවස්ථාව. එඩ්වඩ් අයිවන් පෙරේරා මහතා ද පසෙක වේ.*

**- කුමර නයනජිත්**
**සේයා - නිමල් පෙරේරා**

## දිරිය සිත්තරාවිය



ස්වර්ගස්ථ වූ අති උතුම් ප්‍රෑන්ක් මාකස් හලාවත පදවි එඩේරාණන්ගේ සංකල්පයකට අනුව බිහිවූ චිත්‍ර, සංගීත, කථික, රචනා, නැටුම් ආදිවූ විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ විහිදෙන හ.ප.සං.ක. තරගයේ චිත්‍ර අංශයෙන් ජයග්‍රහණයන් ලබා ගනිමින් එය දිරියක් කර ගත් අය අතර බී. එල්. ඩී. වී. මරිනි තිළිණි පෙරේරා ප්‍රමුඛ ස්ථානයක් උසුලයි.

හලාවත පදවියේ, කටුනේරිය මීසමේ කිතුනු පවුලක එකම දියණිය ලෙස උපත ලැබූ ඇය, අද ආදරණීය බිරිඳක් සහ සිඟිති පුතකුගේ ආදරණීය මවකි. වෙන්නප්පුව ශුද්ධ වූ පවුලේ බාලිකා මහා විදුහලෙන් අධ්‍යාපනය හදාරා විද්‍යා අංශයෙන් සරසවි සුදුසුකම් ලැබූ ඇය චිත්‍ර කර්මයටත් දස්කම් දක්වන්නීය.

තම පාසල් සමයේ සිට විවිධ වූ චිත්‍ර තරගයන්ට සහභාගි වෙමින් ජයග්‍රහණයන් හිමිකර ගත් ඇය 2010 වසරේ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් මෙහෙය වූ සමස්ත ලංකා නත්තල් චිත්‍ර තරගයේ වයස අවු. 21-30 ත් අතර පළමු ස්ථානය ලබා ගත් අතර රාජ්‍ය නත්තල් සුබ පැතුම් පත සඳහා ද ඇයගේ එම චිත්‍රය යොදා ගැණිනි. මෙවරද (2011) පැවති එම චිත්‍ර තරගයෙන් නැවත වරක් ඇය වයස අවු. 21-30 ත් අතර 1 වන ස්ථානය හිමි කරගෙන ඇත.

## සෙනෙහසේ නාමයෙන් එළිදකී




කිතුනු කලාකරුවකු වන ජාඇල කලඑලියේ ජේ. එම්. මිල්රෝයි පීරිස් කලාකරු 'සෙනෙහසේ නාමෙන්' නමින් සී. ඩී. පටියක් පසුගියදා නිකුත් කරන ලද ගීත 14 කින් සමන්විත මෙම ගී තැටිය ඔහු දිවයිනේ සුපතල සුප වේදියකු වන චන්දන විජේරත්න මහතාට එය ඉකුත්දා හරසරින් පිළිගන්වන ලදි.

ගායනයට - වාදනයට - චිත්‍ර ශිල්පයට හා මූර්ති කලා නිර්මාණයට දස්කම් විස්කම් පාන ඔහු කටුනායක 'ගේට් වේ එයාර් පෝට් ගාඩ්න් හෝටලයේ' පේස්ට්‍රි අංශයේ ප්‍රධාන සුපවේදියකු වන මිල්රෝයි පීරිස්, දෙව්මැඳුරට බෙහෙවින් සමීප වන අතර, විශ්‍රාම ලද එවකට කුරුණෑගල ඇතුගල්පුර සිටි අති උතුම් රේමන්ඩ් පීරිස් රදගුරු හිමිපාණන්ගේ දයාබර සොහොයුරකුගේ පුත්‍ර රත්නයකි.

ලතින් භාෂාවෙන් ගීත ගැයීමට හපන් මිල්රෝයි සංගීත ලොවට අනාගතයේ දී පායන දීප්තිමත් තරුවකි. ගිටාරය, විදුලි ඕගනය හා සියලු සංගීත භාණ්ඩ වලට දෑත හුරු පුරුදු මිල්රෝයි හට සෑම කලාවක් ගැනම හසල දැනුමක් ඇති අතර ඒ දැනුම් සම්භාරය ඔහුට දෙවියන් වහන්සේගෙන් ලැබුණු තලෙන්තුවක් බැව් ඔහු ප්‍රදීපයට පැවසීය.

**ලෙස්ලි පෙරේරා**

## ලැටීෂියා පීරිස් ලිපියට ඌන පූර්ණයක්

**ලැටීෂියා පීරිස් ඉපැරණි නිළිය පිළිබඳව ලියැවුණු ඥානාර්ථ ප්‍රදීපය ලිපිය සහ බැඳේ.**

එකී ලිපියේ සඳහන් පරිදි ලැටීෂියා පීරිස් මහත්මිය සහ ඇගේ සැමියා රෝගීව සිටින අතර, ඔවුන්ගේ සියලු අඩුපාඩු පිළිබඳව සොයා බලන්නේ ඔවුන්ගේ එකම දියණිය යි. මේ ලියන මම ඔවුන් ගැන හොඳින් දන්නෙමි. ඇය සැමදාම පාහේ පා පැදියකින් හෝ වැලියකින් පැමිණ දෙමාපියන්ගේ දුක සැප අඩුපාඩු සොයා බලන අතර, ඇයගේ උපදෙස් මත සීලවතී නම් කාන්තාව එම යුවල හොඳින් බලා හදා ගනී.

'කිසිවෙකුත් මේ රෝගී දෙපල ගැන බලන්නේ නැත' යනුවෙන් මින් ඉහත පළ වූ වාර්තාව සත්‍යය නොවේ. ඒ මඟින් ලැටීෂියා පීරිස් මහත්මියගේ රෝගී ස්වාමියා සහ දියණිය ද කම්පාවට පත්ව සිටිති. එහෙත් සත්‍යය ලෙස ලැටීෂියා පීරිස් මහත්මියට ලැබිය යුතු ස්ථානය සහ සැලකීම, ලංකාවේ දැනට ජීවතුන් අතර සිටින පැරණිම නිළිය ලෙස ලැබී නොමැත. ඇයට එකී අසාධාරණය සිදු වී ඇත්තේ, ඇය යොදවා ගෙන චිත්‍රපට විශාල සංඛ්‍යාවක් නිෂ්පාදනය කොට ලාබ ලබා ගත් පමණක් නොව සිනමා ක්ෂේත්‍රයේ යම් ස්ථාවයරක් ගොඩ නඟා ගන්නට ඇය අත්වැලක් කරගත් චිත්‍රපට නිෂ්පාදක වරුන් විසින් ඇය අමතක කොට දමා තිබීම නිසාවෙනි.

ඔවුන් සමහරෙක් රුක්මණී දේවී හා සම කාලීන මෙම ප්‍රවීණ නිළිය ජීවතුන් අතර සිටිනවා දැයි නොදනිති. සිංහල සිනමාවේ ආරම්භක යුගයේ සිට අද දක්වා පැමිණි ගමන් මගේ දැනට සිටින පැරණිම සිනමා නිළිය ඇය වු ව ද කතෝලික ඇය ගැන එකී චිත්‍රපට නිශ්පාදකයින් හෝ සිනමාවට සම්බන්ධ අයට වගේ වගක් නැත.

සියලුම වර්තමාන තරුණ නිළියන් විවිධ අංශ වලින් සම්මාන ලබද් දී සිනමා කර්මාන්තය නගා සිටුවීමට රුක්මණී දේවී සමඟ උරදුන් ලැටිෂියා පීරිස් ගැන ඔවුන් නිහඬය. ඉතා අසරණව සිටින ඇය ගැන සොයා බලන්නේ දුවණියයි. එමෙන්ම ඇය හා සැමියා වන ඇන්ඩෲ ද සිල්වා මහතා රද්දොළුගම දේවස්ථානයේ මීසම් සේවක ගරු ප්‍රසාද් පෙරේරා පියතුමාව ගෞරවයෙන් සිහිකරන්නේ එතුමා හැකි අවස්ථාවල දී ඔවුන්ගේ දුක සැප සොයා බලමින් නිහඬව හැකි අයුරින් සහන සලසන බැවිනි.

**- පද්මා පැඩ්ඩිලියන්**

## සම්මානයෙන් පිදුම් ලබයි



දිවුලපිටිය නිමල මරිය වැඩිහිටි නිවාසයේ කොමිටිගෙ විනිෆ්‍රීඩා පෙරේරා 1932.2.25 උපත ලබා, කළුතර කලමුල්ල කන්‍යාරාමයෙන් අධ්‍යාපනය ලබා ඇත. පයාගල රජයෙ කුඩා කර්මාන්ත ආයතනයේ බේබි නෝනා ගුරු මෑණියන්ගෙන් ගුරු හරුකම් ලබමින් මූලාරම්භය පිරූ ඇය එවකට නිර්මාණය කළ දෑ ලක්සලට ඉදිරිපත් කරමින් කුසලතා පළ කළාය. මීගමුව දොන් බොස්කෝ, පිළියන්දල කන්‍යාරාමයේ ද සේවය කර ඇති අතර, පසුව මේ වනතෙක් දිවුලපිටියේ වැව ගෙදර මහිලා සමිතියේ අවට ගම් වාසීන්ගෙ දූවරුන්ට හා කාන්තාවන්ට ද සිය උරුමය දායා ද කරන්නීය. පසුව දිවුලපිටිය නිමල මරිය වැඩිහිටි නිවාසයට පැමිණ පන්ති පවත්වමින් දිවි ගෙවයි. **- මෙරිල් පෙරේරා**



තුඩැල්ල දිසාවේ වින්සෙන්ති ද පාවුලා සමිතියේ වාර්ෂික උත්සවය තුඩැල්ල ජුබිලි රැස්වීම් ශාලාවේ දී දිසාවේ සියලුම සමිති ඒකාබද්ධවී පැවැත්වූහ. එහිදි පමුණුගම කොන්පරන්සිය මඟින් ඉදිරිපත් කළ රංගනයකි මේ.

**- බෙන්ජමින් කිරිහෙට්ටි**

## ෆිලීෂන් අබයකෝන්ගේ සුබස 194

### දොඩමලු

"නිකං කියවන්නෙ නැතුව පොතක් කියවන්නකො" යන බැනරය පසුගිය මහ පොත් ප්‍රදර්ශනයේ තැනින් තැන තිබිණ. අනුන් ලවා තම වුවමනාව කියවීමත් කියවීමේ තුන්වන තේරුමයි. ඉවරයක් නැති කියවිල්ලත් දෙඩවිල්ලකි. අද දොඩනවා වහරින් ගිලිහී එහි ප්‍රයෝජ්‍ය ක්‍රියාව වන දොඩවනවාට සීමාවේ. එහෙත් පැරණි පොතපතේ දොඩනවාත් දැන් දොඩවනවා ම අදහස්වේ. "දරුවෝ මියන වේලෙහි සිහි එළවා ගත නොහී නන් දොඩමින් මළෝය. (රත්නාවලිය)

දෙඩුම්+අලු=දොඩමලු වී යයි මතයකි. දැන යන පූර්ව ක්‍රියාවෙන් දැනුවත් තැනුණ පරිදි 'දොඩනවා' ක්‍රියාවෙන් කෙළින්ම දොඩමලු ඇති වුණේ ද? කේලම් මල්ල මෙන් දොඩවන මල්ල දොඩමලු වුණි ද?

මධුර, ශිඛර වැනි මුඛර යනුත් දොඩමලු තමයි. මුඛරි වූයෙත් එයමයි. ශීතල, යුගල පරිදි බිහිවූ වාචාලයනුත් දොඩමලුයි. වචනය අනුවත් කෙළතොලු යනුත් කටවාචාල තේරුමමයි.

පාපෝච්චාරණයට පෙර ආත්ම සෝදිසියෙහි "අනුන්ට ආදරය නැතුව දෙඩුවෙහිද? යයි යාච්ඤා නිධානයේ පෙනේ. බුදු දහමෙහි දොඩමලුකම වාචසික දුසිරිතකි. සම්පප්‍රලාප නම් වේ. එසේම කටවහරේත් වියත්වහරේත් දොඩමලුකමට ඇත්තේ දුශ්ශීල, අසංවර පැතිකඩකි. සෘණාත්මක අර්ථයකි. දැන් දැන් මාධ්‍යයෙහි සම්මුඛ සාකච්ඡාවල සමහර මාධ්‍යවේදීන් "මේ මහාචාර්යතුමා සමඟ මම දොඩමලුවුණා." අප සමඟ මේ දානපතියා දොඩමලුවුණා"යි ඇසේ. බොහෝ විහාගවලට පාත්‍ර වූ උමංදාවේ මේ කොටස් කියවා නොදන්නෝ දැන ගනිත්වා. "කොල අරිටු බමුණ, නොදොඩයි කියදීත් දොඩ දොඩාම සිටිනෙහිද? "ඔහු තරම් දුර්ජනයෙක් මනුෂ්‍යයන් කෙරෙහි එකද කෙනෙක් නැතැයි" ඉතා දොඩමලුවූ බමුණු මහලු තමා කටට ආවක්ම කීයේය.

බොහෝ සදොස් වහර, එසැණින් අපේ දෙව්මැඳුරු තුළට රිංගෙන්නේ කෙසේ ද? ජුවාම් 4:7-30 පහදද් දී ජේසුස්වාමිදරුවන් සමරිතානු ස්ත්‍රිය සමඟ දොඩමලු වුණා යයි දේශනාවකදී අපට නොඇසේවා.

## සිරිලක් බයිලා 154



*ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු*

| | |
|---|---|
| කුඹියාගෙ ඇඳුම් අලිය හට | ඇන්දකිද |
| අලිය ගෙම්බ දෙන්නා එක | සමානද |
| දියෙන් උපන් ලුණු දියෙන් ම දිය | නොවේවිද |
| ගහේ කටුව අපි කවදා උල් | කෙරුවාද |
| දඹ බඹ ගා ජර මර කරනා | වවුල්ලුනේ |
| උඹ බලලා කෙල ගැහුවා ඇති | රිලවුන්නේ |
| පිට කසලා තලු මරලා ඇයි | ලෙවකන්නේ |
| කට දොඹලා පණු ඇදලා හෙට | වැලලෙන්නේ |

**ගායනය : (දුත්) බොල්ලෑගල චතුර**

# ශුද්ධාසනයට නව කාදිනල් හිමි විසි දෙනමක්!

**අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් විසින් ඉකුත් දා නව කාදිනල් හිමිපාණන් විසි දෙනමක් නම් කරන ලදී. එතුමන් අබිසෙස් ගැන්වීමේ මෞලි මංගල්‍යය පෙබරවාරි 18 වැනිදා වතිකානයේ දී පැවැත්වේ. මේ පසුගිය සතියේ පළවූ ලිපියේ ඉතිරි කොටසයි**

## අගරදගුරු අති උතුම් දොමිනික් දුකා හිමි



එතුමා චෙක් දේශයේ ප්‍රේග් හි අගරදගුරු හිමිපාණෝ ය. එතුමා වර්ෂ 1972 දී දොමිනිකානු නිකාය තුළ ස්ථිර පොරොන්දු දුන්නත් දූත මෙහෙවරේ යෙදීමට කොමියුනිස්ට් පාලනය විසින් අවසරය නොදෙන ලදී. එබැවින් 15 වසරක් පුරා සැළැසුම් කරුවකු ලෙසින් කම්හල් වල වැඩ කිරීමට එතුමාට සිදුවිය.

ඒ අතර තුරේ දී ජනතාවට ක්‍රිස්තුන් වහන්සේ හඳුනාදීමේ ක්‍රියාකාරකම් රහසේ පවත්වාගෙන යන ලදී. එතුමාගේ මිෂනාරි සේවාව නිසා වර්ෂ 1981-1982 දක්වා සිර බත් කෑවේය. කොමියුනිස්ට් පාලනය බිඳ වැටීමත් සමඟම එතුමා දොමිනික් නිකායේ ජ්‍යෙෂ්ඨ නායකයන්ගේ යුරෝපීය සම්මේලනයේ උප සභාපති වරයා වශයෙන් ද පත් කරනු ලැබීය. වර්ෂ 1998 සැප්තැම්බර් මස 26 වැනිදා රදගුරු හිමි ලෙස පත් කරනු ලැබූ එතුමා වර්ෂ 2010 පෙබරවාරි මස 13 වැනි දා අති උතුම් XVI වැනි බෙනඩික්ට් ශුද්ධෝත්තම පියාණන් විසින් ප්‍රේග් හි අගරදගුරු වශයෙන් පත් කරනු ලැබීය.

කොමියුනිස්ට් පාලනය විසින් රාජ සන්තක කර තුබු සම්පත් ආපසු දීමටත්, පසුගිය කාල පරිච්ඡේදය සඳහා ඒවාට වන්දි ගෙවීමටත් රජය ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ මෙතුමාගේ කාර්ය භාරය නිසා වේ.

## අගරදගුරු අතිඋතුම් විලෙම් ජාකෝබුස් ඉජ්ක් හිමි

මෙතුමා නෙදර්ලන්තයේ උට්රෙච්ට් හි අගරදගුරු හිමිපාණෝ ය. වර්ෂ 1953 ජූනි මස 22 වෙනි දා උපන් මෙතුමා ඕලන්ද ජාතික පැවිදි වරයෙකි. එතුමා වර්ෂ 2008 ජනවාරි මස 26 වැනි දා එරටේ 70 වෙනි අගරදගුරු හිමිපාණන් ලෙසින් ආලේප කරනු ලැබීය.

මෙතුමා ප්‍රථමයෙන් වෘත්තිමය වෛද්‍ය උපාධියක්, 1987 වර්ෂයේ දී ඇමස්ටඩම් විශ්ව විද්‍යාලයෙන් ලබා ගත්තේ ය. ඉන් පසු එතුමා පූජක වරය සඳහා දෙව්සත්හලට ඇතුළු විය. පසුව සිය වෛද්‍ය විද්‍යාව හා දේව ධාර්මික ඥානය ඒකාබද්ධ කැරෙන උපාධියක් ලේටන් විශ්ව විද්‍යාලයෙන් ද ලබා ගන්නා ලදී. ඊට පසුව එතුමා පූජකවරය ලැබුවේ ය. තවද එතුමා විසින් වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආචාර්ය උපධියක් ද ලබා ගන්නා ලදී. මෙතුමා වෛද්‍ය විද්‍යාව හා දේව ධර්මය එක්තැන් කොට



ගබ්සාව, සමලිංගිකත්වය යන කාරණා වලදී වෛද්‍ය විද්‍යාව හා ධාර්මික න්‍යායන් ගැන ලොව දැනුවත් කරන්නා වූ ප්‍රාඥයෙකි.

## අගරදගුරු අති උතුම් ගියුසෙප්පේ බෙතෝරි හිමි

ඉතාලි ජාතික මෙතුමා පොලොන්ස් හි අගරදගුරු හිමිපාණෝ ය. මෙතුමා පූජක වරය ලැබුවේ 1970 වසරේ ය. ශුද්ධාසනයේ බයිබලීය ආයතනයෙන් ශුද්ධ ලියවිලි පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇත. ඒ අනුව අසීසි දේව ධර්ම නිකේතනයේ පීඨාධිපති වශයෙන් සේවය කර තිබේ. වර්ෂ 2002 දී රදගුරු පදවියට පත් මෙතුමා 2008 සැප්තැම්බර් මස 8 වැනි දා අති උතුම් XVI වැනි බෙනඩික්ට් ශුද්ධෝත්තම



පියා විසින් පිලෙන්ස් හි අගරදගුරු හිමිපාණන් ලෙසින් පත් කරනු ලැබීය. පසුගිය වසරේ නොවැම්බර් මස 5 වැනිදා සාහසිකයකු විසින් මෙතුමා ට තුවක්කුව එල්ල කරනු ලැබුවත් මරණයෙන් බේරුණේ ය.

මෙතුමාගේ කාර්යාලය අසලදී එතුමාගේ ලේකම් පූජක තුමාට පහර එල්ල කොට තුවාල කළත් අග රදගුරු තුමා වෙත එල්ල කළ තුවක්කුව පත්තු වී නොමැත.

## අගරදගුරු අති උතුම් මයිකල් දෝලාන්

ඇමෙරිකාන ජාතික මෙතුමා නිව්යෝර්ක් නගරයේ දස වැනි අග රදගුරු හිමිපාණෝය. මෙතුමා උපත ලබා ඇත්තේ මිසුරි හි ශාන්ත ලුවිස් හි දී ය. එතුමා දරුවන් පස් දෙනෙකුගෙන් යුත් පවුලක වැඩිමහල්ලා විය. පියා ගුවන් නියමුවෙකි. දෝලන් අග රදගුරු තුමා කුඩා කල සිටම සැමට ප්‍රකාශ කර ඇත්තේ ඔහු පූජක වරයෙකු වන බවයි. ඔහු එමගින් කිසිදා ඈත් නොවූ බැව් අදත් ප්‍රකාශ කරයි. පසු කාලයේ දී වැඩි දුර අධ්‍යාපනය සඳහා එතුමා රෝමයට ගියේ ය.

එහි දී උතුරු ඇමෙරිකා විදුහලෙන් දේව ධර්මය පිළිබඳ උපාධියක් ලබා ගත්තේ ය. වර්ෂ 1976 ජූනි මස 19 වැනි දා හෙතෙම පූජක වරය ලැබීය. එතුමා වොෂින්ටනයේ අපෝස්තලික තානාපති සේවයේ ද නිරතව සිටියේ ය. "තුන්වැනි සහස්‍රක වර්ෂය සඳහා පූජකවරු"



නමැති ග්‍රන්ථයක් ද එතුමන් විසින් ප්‍රකාශයට පමුණුවා ඇත.

පසුව එතුමා ග්‍රෙගොරියන් විශ්ව විද්‍යාලයේ ආචාර්ය වරයෙකු වශයෙන් සේවය කරත. එතුමාගේ අග රදගුරු තේමා පාඨය වන්නේ, "ස්වාමිනි අප කා වෙත යන්න ද?" යන්නයි. "කතෝලික සහන සේවා" යන කතෝලික ජාත්‍යන්තර ආයතනයේ සභාපති වශයෙන්, අප්‍රිකානු හා ආසියාතික රටවල දිළිඳු බවින් පීඩා විඳින ජනතාවන් වෙත මහත් සේවයක් කිරීමේ ලා ප්‍රමුඛත්වය ගන්නා ලදි.

## අගරදගුරු අති උතුම් රේනර් මරියා වොකි හිමි

ජර්මානු ජාතික මෙතුමා බර්ලින් හි අග රදගුරු හිමිපාණෝ ය. වර්ෂ 1956 අගෝස්තු මස 18 වැනිදා මෙලොව එළිය දුටු මෙතුමා බොන්හි විශ්ව විද්‍යාලයන් දේව ධර්මය හා දර්ශන විද්‍යාව උගත්තේය. වර්ෂ 1985 ජූනි මස 14 වැනි දා පූජක වරය ලැබූ මෙතුමා කලක් හමුදාවේ සේවා පූජක ලෙස කටයුතු කළේ ය. වර්ෂ 2000 දී මෙතුමා බොන් විශ්ව විද්‍යාලයෙන් දේව ධර්මය පිළිබඳ ආචාර්ය උපාධියයක් ද ලබා තිබේ. පසුව 2003 වර්ෂයේ මාර්තු 30 වැනිදා රදගුරු හිමි නමක් ලෙස ආලේප කරනු ලැබීය. එතුමා ජර්මනියේ රදගුරු සම්මේලනය තුළ දේව කැඳවීම් හා සභා සේවාවන් පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ද විය.



වර්ෂ 2011 ජූලි මස 02 දා අති උතුම්XVI වැනි බෙනඩික්ට් ශුද්ධෝත්තම පියා විසින් එතුමා බර්ලීනයේ අගරදගුරු හිමි ලෙසින් පත් කරනු ලැබීය. ජර්මනියේ පවත්නා සම ලිංගිකත්වයට එරෙහිව එතුමා විසින් ගෙන යනු ලබන සුවිසල් ව්‍යාපාරය වෙත ඇතැම් දේශපාලඥයන්ගේ විරෝධතාවය පළවී ඇතත් ජනතාවගේ සැබෑ ගරුත්වය උදෙසා එම කාර්ය දිගටම කරනා බැව් එතුමා සපථ කරයි. අග රදගුරු පදවියට පත් කිරීමෙන් දින 132 ට පසුව කාදිනල් තනතුරට පත්කරනු ලැබීමේ පණිවුඩය ජර්මන් ජනතාවට මහත් ප්‍රීති දායක වේ.

## අගරදගුරු අතිඋතුම් ජෝන් තොං හොං හිමි



එතුමා හොං කොං හි අගරදගුරු හිමිපාණෝ ය. තවද එතුමා චීන කතෝලික සභා ඉතිහාසයේ හත් වැනි කාදිනල් හිමිපාණෝ ය. වර්ෂ 1939 දී උපත ලැබූ එතුමා පූජකවරය ලැබුවේ වර්ෂ 1966 දී ය. වර්ෂ 2009 දී එතුමා රදගුරු වශයෙන් ආලේප කරනු ලැබීය.

එතුමා චීනයේ ශුද්ධාත්ම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ වශයෙන් ද සේවය කොට ඇත. කතෝලිකයන් හට චීනයේ පවත්නා හිරිහැර බාධක හමුවේ තමා ජනතාව සමඟ ඈඳහිල්ලේ ගමනක් යන බැව් එතුමන් විසින් කතෝලික පුවත් වලට පවසා ඇත.

## අගරදගුරු අති උතුම් ලූෂන් මුරේසන් හිමි



එතුමා රුමේනියාවේ ෆගරාස් හා අල්බා ජූලියා හි අගරදගුරු හිමිපාණෝ ය. එතුමා රුමේනියාවේ ෆිරිෂා නම් දුරස්ථ ගමක උපත ලබා ඇත්තේ දොළොස් දෙනෙකුගෙන් යුක්ත පවුලක 10 වැනියා ලෙසින් ය. සිය ප්‍රාථමික අධ්‍යාපනය ගමේ පාසලෙන් ද ද්විතීය අධ්‍යාපනය බයියා මරේ නම් නගර පාසලෙන් ද ලබා ඇත. එතුමාගේ සිහිනය වූයේ කතෝලික පූජකවරයකු වීමයි. එහෙත් එවක දී රුමේනියානු සභාව හා රෝමානු සභාව අතර පැවැත්ම තහනම්ව පැවැති නිසා පූජක වරයට බාධා තිබිණි. පසු කාලීනව තහනම ඉවත් වීමෙන් එතුමාගේ සිහිනය සැබෑ විය.

## අතිගරු ජූලියන් රීසස් පියතුමා

බෙල්ජියානු ජාතික පූජකවරයකු වන මෙතුමා ලුවේන් විශ්ව විද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්ය වරයෙකු වශයෙන් සේවය කොට විශ්‍රාම ගෙන ඇත. එතුමා පූජකවරයට පත් වූයේ වර්ෂ 1945, දෙසැම්බර් මස 8 වැනි දා ය.

දර්ශන විද්‍යාව හා පෙරදිග ඉතිහාසය පිළිබඳ ආචාර්ය උපාධියක් ලද එතුමා වර්ෂ 1960 සිට 1968 දක්වා බෙල්ජියමේ ලූවෙන් කතෝලික විශ්ව විද්‍යාලයේ ආචාර්ය වරයෙක් ද විය. එතුමා විසින් ප්‍රකාශිත



ආගම් පිළිබඳ අගනා ප්‍රකාශයක් ද ලෝ ප්‍රකට ඉතිහාසඥයන් හා කළ තර්ක විතර්ක ඇතුළත් ලේඛණයක් ද මිලාන් හී කතෝලික ඩෙල් සක්‍රෝ කියුරෝ විශ්ව විද්‍යාලයට ත්‍යාග කර තිබේ. වර්ෂ 1990 දී සක්‍රීය සේවාවන් ගෙන් විශ්‍රාම ගත් එතුමා අධ්‍යයන පර්යේෂණ වල නියැළී සිටි.

## අතිගරු ප්‍රොස්පෙරෝ ග්‍රෙච් පියතුමා

එතුමා මෝල්ටා හිදී වර්ෂ 1925 දෙසැම්බර් මස 23 දා උපත ලැබුවේ ය. එතුමා විශ්ව විද්‍යාලීය සිසුවකු වශයෙන් දෙවැනි ලෝක මහා යුද්ධයේ ආරක්ෂක හටයෙක් ද විය. දොමිනිකාන නිකායට



බැඳුණු එතුමා වර්ෂ 1950 දී පූජක වරය ලැබුවේ ය. ඊට වසර කීපයකට පසුව එතුමා රෝමයේ ග්‍රෙගෝරියාන විශ්ව විද්‍යාලයේ දේව ධර්මය පිළිබඳ ආචාර්ය උපාධිය දිනා ගත්තේ ය.

පියතුමා ඔක්ස්ෆර්ඩ් හා කෙම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයන් හි ජනවාර්ගික භාෂා පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය කළේය. තවද රෝමයේ ශුද්ධාසන බයිබලීය ආයතනයේ කතිකාචාර්ය වරයෙකු ලෙසින් ද වසර 30 කට වැඩි කලක් සේවය කළේ ය. ඉන්දියාවේ දෙව්සත්හල් වල පූජක සිසුන්ට ජනවාර්ගික භාෂා පිළිබඳ උගැන්වීම් කළේය. එතුමා ලෝකයේ විවිධ දේශයන් හි පවත්නා ජනවාර්ගික භාෂා න්‍යායයන් පිළිබඳ ප්‍රාඥයෙකි.

## අතිගරු කාර්ල් බෙකර් පියතුමා



ජර්මන් ජාතික මෙතුමා වර්ෂ 1977 සිට ඇදහිල්ල පිළිබඳ උපදේශක වරයෙක් වශයෙන් කටයුතු කරයි. එතුමන් විසින් දේව ධර්මය පිළිබඳ ලේඛන ගත කළ ප්‍රකාශනයන් විශාල සංඛ්‍යාවකි. කතෝලික සභාවේ කතිකාවන් හි ප්‍රධානත්වයක් ගන්නා ධර්ම දායකයෙකි.

බැසිල් ෆොන්සේකා

# කුරුණෑගල රදගුරු වසමට නවක පූජක පුතුන් තෙනමක්

*ගරු ගෝමි දිවාකර ප්‍රනාන්දු, ගරු ජාමික සුමේධ පෙරේරා සහ ගරු නෙයොමාල් සිල්වා යන තේවාචාර්යය සොයුරන් තිදෙනා 2012 ජනවාරි 28 දින පෙ.ව. 10,00 ට, කුරුණෑගල සා. ආනා ආසන දෙව්මැඳුරේ දී, කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා රදගුරු හිමිපාණන් අතින් පූජක සේවා වරම් ලබා දෙව් ජනතා සේවයට කැපවෙති.*

*කුරුණෑගල මිල්ලව භාග්‍යවත් ජුසේවාස් කනිටු දෙව්සත්හලින් පූජක පුහුණුව ඇරඹූ මෙම සොහොයුරෝ කළුතර "දහම් සෙවන" දෙව්සත්හලේ පුහුණුව ලබා පසුව අම්පිටිය ජාතික දෙව්සත්හලින් දර්ශනවාදය සහ දේව ධර්මය ප්‍රගුණ කර 2011 ඔක්තෝබර් 29 දින තේවාචාර්යය වරම් ලැබූහ.*

## ගරු වර්ණකුලසූරිය ගෝමි දිවාකර උදාන ප්‍රනාන්දු සොයුරු

මණ්ඩකොන්ඩාන මීසමේ යගම්වෙල ඩබ්. ගොඩ්වින් ප්‍රනාන්දු සහ ඩබ්. එම්. ආර්. මරිය තිසේරා මාපියන්ගේ කනිටු පුතනුවන් ලෙස 1975 .09.21 උපත ලද මෙතුමා බිංගිරිය බ්‍රහ්මනයාගම කුලි/තාවල්ල ධම්මාලෝක කනිටු විදුහලින් සහ මාදම්පේ මධ්‍ය මහා විද්‍යාලයෙන් සිප් සතර හැදෑරීය. දෙව්සත්හල් පුහුණු කාලය අතරතුර 1998 සිට 2007 දක්වා (වසර 9 ක්) සයිප්‍රසයේ ශ්‍රී කුරුසියේ දෙව්මැඳුරේ සදාසරණ නිකායේ ගරු පැවදි සොයුරියන්ගේ සහය තුළ, එහි ශ්‍රී ලාංකික කතෝලික සංඝයට සේවය කළේය. නැවත 2007 සිට පූජක පුහුණුව අරඹා පසුව තේවාචාර්යයවරයකු ලෙස නිකවැරටිය, මල්පිටිය, කට්ටිමහන යන මීසම් වල සේවා අත්දැකීම් ලැබීය. මෙතුමන්ගේ කුළුඳුල් දිව්‍ය යාගය 2012.01.29 දින සවස 5.00 ට මණ්ඩකොන්ඩාන ශුද්ධවූ පවුලේ දෙව්මැඳුරේ දී පැවැත්වීමට නියමිතය. මෙතුමන් දේව කැඳවීම සඳහා යොමු කළේ ගරු නෝබට් ප්‍රනාන්දු පියතුමාය.



## ගරු මල්ලව තන්ත්‍රීගේ ජාමික සුමේධ පෙරේරා සොයුරු



නිකවැරටිය මීසමට අයත් එම්. ටී. එඩ්වඩ් නිමල් පෙරේරා සහ ඩබ්. ජූලියට් අයිරින් රුදිගු යන දෙමාපියන්ගේ කනිටු පුතනුවන් ලෙස 1979.09.05 උපත ලද මෙතුමා නිකවැරටිය ජයන්ති මහ විදුහලින් ප්‍රාථමික අධ්‍යාපනය ද නිකවැරටිය මහසෙන් ජාතික පාසලෙන් සහ කුරුණෑගල මලියදේව පිරිමි විදුහලින් ද්විතියික අධ්‍යාපනය ද ලැබීය. පූජක පුහුණු කාල සීමාව තුළ "වර්ල්ඩ් විෂන් ලංකා" ආයතනයේ සේවය කරමින් තණමල්විල, රිදීමාලියද්ද යන ප්‍රදේශවල විවිධ අත්දැකීම් ලද මෙතුමා පූජක පුහුණු කාලයේ දී උතුවන්කන්ද මීසමේ ද සේවා අත්දැකීම් ලබා පසුව තේවාචාර්යවරයකු ලෙස මල්පිටිය මීසමේ සේවය කළේය.

මෙතුමන්ගේ කුළුඳුල් දිව්‍ය යාගය 2012.01.29 දින උදේ 10.00 ට නිකවැරටිය ශු. අන්ද්‍රේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ දී පැවැත්වේ. මෙතුමන් දේව කැඳවීම සඳහා යොමු කළේ ගරු කැමිලස් පාතිමාදාස ප්‍රනාන්දු පියතුමාය.

## ගරු ලියනගේ නෙයොමාල් සිල්වා සොයුරු



කොළඹ අගරදගුරු වසමේ බටේපොල මීසමේ තියෝ ඩියුලස් සිල්වා සහ ඒ. ඒ. බියට්‍රිස් මැටිල්ඩා යුවළට දාව දෙටු පුතනුවන් ලෙස 1981.03.13 දින උපත ලද මෙතුමා සිය ප්‍රාථමික අධ්‍යාපනය, මිනු/බටේපොල කණිෂ්ට විද්‍යාලයෙන් ද ද්විතික අධ්‍යාපනය මිනු/දිවුලපිටිය ශ්‍රී ඥානෝදය මධ්‍ය මහවිද්‍යාලයෙන් සහ කුරුණෑගල සා. ආනා විද්‍යාලයෙන් ද ලැබීය. පූජක පුහුණුව අතර කාලයේ (2006 - 2007 ) බටේපොල "ග්ලෝබ් නිටිං" පෞද්ගලික ආයතනයේ සේවය කළ මෙතුමා පසුව තේවාචාර්යයවරයකු ලෙස කුරුණෑගල මීසමේ සේවා අත්දැකීම් ලැබීය. මෙතුමන්ගේ කුළුඳුල් දිව්‍ය යාගය 2012. 01. 29. දින සවස 4.30 ට බටේපොල ශු. කාර්මෙල් මාතා දෙව්මැඳුරේ දී පැවැත්වේ. මෙතුමන් දේව කැඳවීම සඳහා යොමු කළේ ගරු ඇතනේෂියස් සමරසිංහ පියතුමා ය.

✍ **ගරු ආනන්ද වීරකෝන් පියතුමා**

# සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන පැවදි හවුලට පූජක පුතුන් දෙනමක්

සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන පැවදි හවුලට අයත් පූජක පුතුන් දෙනමක් සමිඳු මිදි උයනේ සේවාව ඇරඹීමට වරම් ලබති. 2012 ජනවාරි 30 සඳුදා සවස 3.30 ට මහනුවර සා. අන්තෝනි දෙව්මැඳුරේ දී ගාල්ල රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පූජකවර ප්‍රදානය සිදුකෙරේ.

## ජෙරෝෂන් අමල්රෝයි තේවාචාර්යතුමා



සලාපුර පදවියේ, මාම්පුරිය මීසමේ, නාවට්කඩු ග්‍රාමයේ බෙනඩික්ට් වින්සන්ට් මහතා සහ මේරි ඔයිට්ලා මහත්මියගේ දෙටු පුත් ගරු ජෙරෝෂන් අමල්රෝයි තේවාචාර්යතුමා 1984 වූ ජූලි මස 19 වන දින මෙලොව උපත ලැබීය. ගැඹුරු කතෝලික පරිසරයක් තුළ හැදී වැඩුණු මෙතුමා තම මූලික අධ්‍යාපනය නාවට්කාඩු රෝමානු කතෝලික විදුහලෙන් සහ හැටන්හි ශා. ජෝන් බොස්කෝ විදුහලෙන් ලබා ගනිමින් වසර 2000 වූ ජනවාරි මස 2 දින බෙනදිකාන නිකායේ කුඩා දෙව්සත්හලට ඇතුළු වී තම තෘතීය අධ්‍යාපනය මහනුවර සා. සිල්වෙස්තර විද්‍යාලයෙන් නිම කරන ලදි.

තවදුරටත් තම පූජක පුහුණු කාල සීමාව තුළ දී අම්පිටිය ජාතික දෙව්සත්හලෙන් දෙවසරක දර්ශනවාදය සහ සිව්වසරක දේව ධර්මය හදාරා තම නිකායේ සදාකාල වේදභාරයන් 2011 වූ අගෝස්තු මස 27 වන දින ලබාගන්නා ලදී. තාපසාරාමයේ හය වසරක නේවාසික පුහුණු කාල සීමාව තුළ වහකෝට්ටේ, රාජගිරිය, තොඩුවාව, ඉදල්ගස්හින්න, පුත්තලම යන මීසම්වල සේවය කළ මෙතුමා 2011 වූ ඔක්තෝබර් මස 6 දින තේවාචාර්ය ලැබීමත් සමග තම තේවාචාර්ය පුහුණුව රත්නපුර පදවියේ කුඩාගම ලූර්දුමාතා සිද්ධස්ථානයේ දී සිදුකරන ලදී. මෙතුමන්ගේ කුළුඳුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින ප.ව. 4.00 ට නාවට්කඩු සින්ද්‍රාති අප ස්වාමිදූගේ දෙව්මැඳුරේ දී සිදු කිරීමට නියමිතය.

## අමිල චාමර තේවාචාර්යතුමා



සලාපුර පදවියේ, පුත්තලම මීසමට අයත් පර්සි කැනියුට් ෆොන්සේකා සහ ඇනට් රීටා අයිරාංගනී රුදිගු යන යුවළගේ එකම පුතනුවන් වූ ගරු අමිල චාමර ෆොන්සේකා තේවාචාර්යතුමන් 1984 ජූලි මස 24 වන දින මෙලොව උපත ලැබීය. ගැඹුරු කතෝලික පරිසරයක් තුළ හැදී වැඩුණු මෙතුමා තම අධ්‍යාපනය පුත්තලම ශා. ඇන්ඩෲ මධ්‍ය මහා විදුහලෙන් නිම කරමින් බෙනදිකාන නිකායේ කුඩා දෙව්සත්හලට ඇතුළු විය.

2004 වසරේ දී බෙනදිකාන තාපස නිකායට ඇතුළත් වූ ගරු සොයුරු තුමා එහි දී අම්පිටිය ජාතික දෙව්සත්හලේ දෙවසරක දර්ශනවාදය හා සිව් වසරක දේව ධර්මය හදාරමින් වසර 2011 ක්වූ අගෝස්තු මස 27 වන දින තම පැවදි දිවියේ සදාකාල වේද භාර ගන්නා ලදී. තම පූජක පුහුණු කාල සීමාව තුළ වහකෝට්ටේ, රාජගිරිය, තොඩුවාව, ඉදල්ගස්හින්න, කවුලහේන යන මීසම්වල සේවය කරන ලදි. 2011 ඔක්තෝබර් මස 6 දින තම තේවාචාර්ය අභිෂේකය ලබා යටියන්තොට සා. මරියා දෙව්මැඳුරේ දී තේවාචාර්ය පුහුණුව ලැබීය. මෙතුමන්ගේ කුළුඳුල් දිව්‍ය පූජා යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 9.00 ට පුත්තලම සා. මරියා දේවස්ථානයේ දී සිදු කිරීමට නියමිතය.

✍ **ගරු ඉරංග ඉරෝමාල් සා.බෙ.නි. සොයුරු**

# ගරු නෙවිල් ජෝ පෙරේරා පියතුමා මොංසිංඤ්ඤෝර් පදවි ලබයි



විසිරී වෙසෙන සංක්‍රමික කිතුනු සංඝ ගොඩනගමින් ගරු නෙවිල් ජෝ මාහිමිපාණන් කරන අනගිභවනීය සේවය තව තවත් ගැඹුරින් සහ කැපවීමෙන් ඉටු කිරීමට මෙම නව පදවිය පිරිනැමීමෙන් ශුද්ධාසනය බලාපොරොත්තු වන බව කාදිනල් හිමිපාණෝ වැඩිදුරටත් ප්‍රකාශ කළහ.

මෙම විශේෂ දිව්‍ය පූජා යාගයට ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකේය කිතුනු සංඝ හා ගරු උපාධ්‍ය පියවරුන් ද, වතිකානයේ සේවය කරන මොංසිඤ්ඤෝර්වරු කිහිප දෙනෙක් ද සහභාගි වූහ. ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කරමින් උත්සවයට සහභාගි වූ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍ය දොස්තර රාජිත සේනාරත්න මැතිතුමා ගරු නෙවිල් ජෝ හිමිපාණන් වෙත ජනාධිපතිතුමන් ඇතුළු රජයේ සුභාසිංසන පිරිනැමී ය.

මෙම උත්සවයට ශ්‍රී ලංකා විදේශ තානාපති අසිත් සිල්වා මහත්මා ද රජයේ නිලධාරීන්, ශ්‍රී ලාංකේය සහ ඉතාලි කතෝලික බැතිමතුන් රාශියක් ද සහභාගි විය.

✍ **ගරු ඩෙනින්ටන් සුබසිංහ පියතුමා**



**ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකේය ජනතාවගේ ආධ්‍යාත්මික එඬේරාණන් ලෙස ගරු ජෝශප් නෙවිල් ජෝ පෙරේරා කළ විසි වසරක අඛණ්ඩ සේවාව අගයමින් ඉකුත් දා සොළොස්වන බෙනදික් ශුද්ධෝත්තම පියතුමා එතුමාණන්ව මොංසිංඤ්ඤෝර් (මාහිමිපාණන්ගේ) පදවියට ඔසවනු ලැබීය. එම පදවි ප්‍රාප්ත උලෙළ රෝමයේ ඉන්ෆර්නෙත්තු මීසමේ සාන්ත මරියා දෙව්මැඳුරේ දී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් නොබෝදා පැවැත්විණි.**

මොංසිංඤ්ඤෝර් පදවිය කිසියම් දූත සේවාවකට උපහාර පිණිස ශුද්ධාසනය විසින් තෝරාගත් සුළුතරයකට පමණක් පිරිනැමෙන තනතුරකි. මොංසිංඤෝර්වරයකු ශුද්ධෝත්තම පියතුමාගේ සහයකයකු ලෙස සේවය කිරීමට කැඳවනු ලබයි. එම පදවිය මඟින් ශුද්ධාසනයට සම්බන්ධවන මොංසිඤ්ඤෝර්වරයා වතිකානයේ විශේෂ නියෝජිතයන් ලෙස විවිධ නිල සේවාවල නියැලෙයි.

පදවි ප්‍රාප්ති උලෙළ නිමිත්තෙන් සංවිධානය කළ විශේෂ දේව මෙහෙයේ දී කාදිනල් හිමිපාණන් අවධාරණය කළේ මෙම සෑම තානාන්තරයකම ගෞරවයක් නොව, කිතු සමිඳුන්ගේ කුරුසියට ගැඹුරින් උරදීමට ලබන ආරාධනාව බවයි. දෙවියන් වහන්සේගේ විශේෂ දූත මෙහෙයක් සඳහා මෙලොවට පැමිණි ක්‍රිස්තුන් වහන්සේටද සිය මෙහෙය ඉටුකිරීම සඳහා මනුෂ්‍ය සහය අවශ්‍ය බව කාදිනල් හිමිපාණෝ සිය දේශනයේ දී සිහිපත් කළේය. මුහුද අද්දර මසුන් මරමින් සිටි දුර්වල මනුෂ්‍යයන්ව මේ භාරධූර දේව කාර්යයට සම්බන්ධ කරගැනීමට ජේසු සමිඳුන් බිය නොවීය. දුර්වල මනුෂ්‍යයන් තුළ අරුම පුදුම දේ කර ගැනීමට දෙවියන් වහන්සේට හැකි වූයේ උන්වහන්සේට ක්‍රියාත්මක වීමට එම මනුෂ්‍යයන් මුළුමනින්ම ඉඩදුන් නිසා බව අගරදගුරු හිමිපාණෝ කියා සිටියහ. ප්‍රසාද ස්නාපනය තුළින් මෙම මහා ශ්‍රාවකත්වයට කැඳවනු ලබන සෑම කතෝලිකයකුගෙන්ම දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන්නේ දෙවියන් වහන්සේ අප ජීවිත වලට ඇතුළු වී කරන මනරම් දේ දැකීමට සහ විඳීමට ය.

වසර විස්සකට අධික කාලයක් ඉතාලියේ සෑම දිශාවකම



# විශ්වාසය මත පදනම් වූ විශිෂ්ට පිතිහරඹයක්!

## තිසර පෙරේරා කිතුනු බවට සාක්ෂි දරයි

දිගින් දිගටම ලත් පරාජයන් හමුවේ හෙම්බත්ව අසරණව සිටි ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම දකුණු අප්‍රිකාව හා සමඟ පැවැති සිව්වන එක්දින තරගයෙන් කිසිවකුත් නොසිතූ ආකාරයෙන් විශිෂ්ට ජයක් ලැබීය. එම ජයග්‍රහණයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙමින් එම තරගයේ වීරයා වෙමින් සම්මානයට පාත්‍ර වූයේ එක්දින ජාත්‍යන්තර පිටියේ තවමත් කෝඩුකාරයකු වන තුන් ඉරියව්වේම දස්කම් පාන යොවුන් ක්‍රීඩක තිසර පෙරේරා ය.

විශේෂයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩා ලෝලීන් ද, ක්‍රීඩා බලධාරීන් ද සමහර විට කණ්ඩායමේ ක්‍රීඩකයන් ද පවා තරග පිළිබඳ බලාපොරොත්තු අත්හැර තිබූ අවදියක එම තරඟයෙන් මෙවැනි ජයග්‍රහණයක් ලබා ගැනීම තරගාවලියේ පස්වන තරගයෙන් ද එවැනි විශාල ලකුණු ප්‍රමාණයක් හඹා ගොස් ජයග්‍රහණය කිරීමට තරම් ආත්ම ශක්තියක් එන්නත් කළ තරගයම විය.

එවැනි තරගයක තරගයේ වීරයා වූ තිසර පෙරේරා පිටියට පිවිසෙත්ම කළේ කුරුසියේ සළකුණ තම අතින් සන් කර ගැනීමයි. එපමණක් ද නොව තමන් පන්දුවට පහර දෙන සෑම අවස්ථාවකදීම තම ගෙලේ පැළඳ සිටි කුරුසිය දිහා දෙනෙත් යොමු කර විශ්වාසයෙන් යුක්තව පහරවල් කරා එළැඹීමය. එම විශ්වාසය හයේ පහර පහකින් ද හතරේ පහර තුනකින් ද සමන්විත පන්දු 44 කදී නොදැවී ලබාගනත් ලකුණු 69 ට මහත් ජවයක් ගෙන දුන් බව පැහැදිලිය. මෑත කාලයක් වනතුරුව ශ්‍රී ලංකා කණ්ඩායමේ ක්‍රීඩා කළ චමින්ද වාස් ද මේ ආකාරයට තම ආගමික අනන්‍යතාවය ලොවටම ප්‍රදර්ශනය කළ ක්‍රීඩකයකු විය. තමන් කතෝලිකයන් යැයි කියාගන්නා බොහෝ දේශපාලනඥයින්, කලාකරුවන් ප්‍රසිද්ධියේ ඒ බව ලොවට, රටට හඬ නගා කියන්නට මැලිවන මෙවන් අවදියක ආත්මාර්ථකාමීව කතෝලිකකම අත් හරින මෙවන් යුගයක යොවුන් ක්‍රීඩක තිසර පෙරේරා ලොවටම පෙන්නුම් කළ මෙම ශ්‍රේෂ්ඨත්වය කතෝලික අප සැමගේ ද දැස් කඩතුරා බිඳලන මහඟු ආදර්ශයකි. ශු. ත්‍රිත්වයේ පිහිට ආශිර්වාදයෙන් අපේ තිසරට ජය පතමු!

✍ වෙන්නප්පුවේ **ප්‍රියන්ත පීටර්ස්**

# අවිලා හි තෙරේසාතුමිය, භාවනාශීලී යාච්ඤාව හා සංතෘප්තිය - 17

අපි දැන් දිව්‍යමය සහ අධ්‍යාත්මික විවාහ බන්ධනයන් ගැන අවධානය යොමු කරමු. මෙම දිව්‍යමය වරප්‍රසාදයේ පරිපූර්ණ අත්දැකීම අපට මේ ජීවිත කාලය තුළදී භුක්ති විඳිය නොහැකි ය. අප දෙවියන් වහන්සේව අත්හැර දැම්මොත් මෙම උත්තරීතර යහපත අපට අහිමිවේ. පළමුවන වතාවට දෙවියන් වහන්සේ මෙම වරප්‍රසාදය අපට දානය කරන විට, උන්වහන්සේ තමන් වහන්සේව ආත්මයට අනාවරණය කරන සේක. එවිට මනුෂ්‍ය ආත්මයට එයට ලැබෙමින් පවතින ශ්‍රේෂ්ඨ සහ රාජකීය තෑග්ග ගැන අවබෝධ කර ගැනීමට සහ වැටහීමට පටන් ගනී.

උන්වහන්සේ තමන් වහන්සේව විවිධ පුද්ගලයන්ට විවිධාකාරයෙන් අනාවරණය කරන සේක. උන්වහන්සේ තමන් වහන්සේගේ සම්පූර්ණ රාජකීයත්වය, අලංකාරය, කාන්තිමත් ප්‍රභවය සහ මහේශාක්‍යභාවය දිව්‍ය සත්ප්‍රසාදය තුළින් සමහර පුද්ගලයන්ට අනාවරණය කරන සේක. එවැනි පුද්ගලයන් දෙවියන් වහන්සේගේ කටයුතු තමන්ගේ කටයුත්තක් මෙන් ඉටු කරයි. එමෙන්ම උන්වහන්සේ එවැන්නන්ව ඉතා මැනවින් රැක බලා ගන්නා සේක.

හත්වන මහලත්, අනෙකුත් මහලවල් අතරත් සුවිශාල වෙනසක් පවතී. එය අධ්‍යාත්මික විවාහයත්, මිනිසුන් අතර සිදුවන සාමාන්‍ය විවාහයත් අතර පවතින වෙනස මෙන්ය. අධ්‍යාත්මික විවාහ බන්ධනය සිදු වන්නේ දෙවියන් වහන්සේ වැඩ වාසය කරන ආත්මයේ ගැඹුරුතම කේන්ද්‍රය තුළයි. ඊට ඇතුළු වීම සඳහා කිසිම දොරක් අවශ්‍ය නැත. ඊට හේතුව දෙවියන් වහන්සේ ආත්මයේ ගැඹුරුතම කේන්ද්‍රයේ වැඩ වාසය කරන බව බුද්ධිමය දැක්මක් මඟින් වැටහීමට පටන් ගැනීමයි. මෙය වෙනත් කිසිම දැක්මකට වඩා ගැඹුරින්ම අභිරහස් දැක්මකි.

මෙම දිව්‍යමය සහ අභිරහස්මය වරප්‍රසාදය නිසා ආත්මය අතිශයින්ම කුල්මත් වේ. අප ස්වාමීන් වහ්නසේ අති මහත් ලෙස තම ස්වර්ගීය මහිමය අනාවරණය කිරීමට සමාන දෙයක් මෙහිදී ද සිදුවේ. දෙවියන් වහන්සේ සමඟ එක යථාර්ථයක් බවට ආත්මය පත් වේ. උන් වහන්සේගේ අති මහත් ආදරය කොතරම් ගැඹුරුද යන්න පෙන්වීමට උන්වහන්සේ ඉමහත් ආශාවක් දක්වන සේක. එවිට අපට උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ගැන ස්තුති ප්‍රශංසා කළ හැකිය.

උන්වහන්සේගේ මැවිල්ලේ කොටසක් වන අප සමඟ එකතුවීමට තරම් උන්වහන්සේ බැහැපත් වී ඇත. පුද්ගලයන් දෙදෙනෙක් විවාහ බන්ධනයෙන් සදාකාලිකව එක් වෙනවා මෙන් උන්වහන්සේ අපගෙන් කිසිදාක වෙන් නොවන සේක. අධ්‍යාත්මික විවාහ ගිවිසීම පුදුම සහගත යථාර්ථයකි. වරප්‍රසාදයේ බන්ධනය විසුරුවා හැරිය හැකිය. පුද්ගලයන් දෙදෙනෙකුව එකට එකතු කළ හැකි වුවත්, වෙන්වීම ද ඕනෑම මොහොතක සිදුවිය හැකි යථාර්ථයකි.

උන් වහන්සේ සමඟ එකතුවීමේ වරප්‍රසාදය ඉක්මනින්ම පහවී යා හැකිය. එවිට උන්වහන්සේගේ මිත්‍රත්වය නොමැතිව ආත්මයට කල් ගත කිරීමට සිදු වේ. නමුත් අප ස්වාමීන් වහන්සේ සමඟ ඇති වන අධ්‍යාත්මික විවාහ බන්ධනය ඊට වඩා වෙනස් එකකි. එහිදී ආත්මය එහි කේන්ද්‍රය තුළ දෙවියන් වහන්සේ සමඟ වාසය කරයි. ශුද්ධ වූ පාවුලු තුමා පවසන ආකාරයට, "සමිඳාණන් වහන්සේට සම්බන්ධ වන තැනැත්තේ උන් වහන්සේ සමඟ



ඒකාත්මයක් වන්නේය" (1 කොරින්ති 6:17). එතුමාණන් එම පාඨයෙන් අදහස් කරන ලද්දේ එම රාජකීය විවාහය විය හැකිය. සමිඳාණන් ආත්මය සමඟ එකට සම්බන්ධ වන බව ද එයින් ගම්‍ය වේ.

එතුමා තවත් තැනක මෙසේ සඳහන් කරයි, "මට ජීවත් වීම නම්, ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ජීවත් වීමය. මරණය මට වාසියකි." (පිලිප්පි 1:21). මෙවැනි දෙයක් ප්‍රකාශ කළ හැක්කේ ගැඹුරු ආත්මයකට පමණි. එවිට ඉතා උත්තරීතර ආනන්දයක් සහිතව මිය ගිය හැකිය. හේතුව ක්‍රිස්තුස් වහන්සේ තම සමස්ත ජීවිතයම බවට පත් වීමයි.

කාලයත් සමඟ මෙය තව තවත් පැහැදිලි වේ. ආත්මයට සැබෑ ජීවය දෙන්නේ දෙවියන් වහන්සේ බව එය වටහා ගනී. එය විස්තර කිරීමට අපහසු වුවත්, එය එසේ බව ආත්මයට ඉතා සියුම්ව වැටහේ. එය කොතරම් ප්‍රබලව හැඟේදයත්, එය අත්දකින පුද්ගලයාට ආදරයේ ප්‍රකාශයන් නිකුත් නොකර සිටීමට නොහැකිය. මෙම මාලිගාවේ වාසය කරන සේවකයන්ව තෘප්තියට පත් කල හැක්කේ දෙවියන් වහන්සේගේ පියයුරු වලින් ගලා එන කිරි වලින් පමණි. ආත්මයේ සම්පත් භුක්ති විඳීමට උන්වහන්සේ අපෙන් බලාපොරොත්තුවන සේක.

ආත්මය තම සැබෑ කේන්ද්‍රයෙන් ඉවත් නොවේ. එමෙන්ම උන් වහන්සේ විසින් එයට දානය කළ හැකි සාමය ද ඊට අහිමි නොවේ. උන්වහන්සේ "ඔබට ශාන්තිය වේවා" (ජොහාන් 20:19) සහ "ශාන්ති සිතින් යන්න" (ලූක් 7:50) යන වචන වදාළ විට ඒවාට වචනාර්ථයට වඩා ගැඹුරු අර්ථයක් ඇත. අප ස්වාමීන් වහන්සේගේ වචන අප තුළ ගැඹුරින්ම ක්‍රියාත්මක වේ. එහිදී ආත්මය තුළ තිබූ සියලුම ලෞකික දේවල් පහවී, අධ්‍යාත්මික දේවල් පමණක් ඉතිරි වේ. එවිට මවනු නොලැබූ ආත්මයාණන් වහන්සේ සමඟ ස්වර්ගමය බන්ධනයක් ඇති කර ගැනීමට ඉඩ සැලසේ.

අප අපගේ ලෞකික ඇලීම් වලින් අපව හිස් කර ගන්නේ නම්, දෙවියන් වහන්සේගේ ආදරය උදෙසා ලෞකිකත්වයෙන් ඈත් වන්නේ නම්, සමිඳාණන් වහන්සේ උන්වහන්සේගෙන් අපව පුරවන සේක. ක්‍රිස්තුන් වහන්සේ තම ශ්‍රාවකයන් උදෙසා මෙසේ යාච්ඤා කළ සේක;" පියාණෙනි, මා මෙසේ යාච්ඤා කරන්නේ ඔබ මා තුළ ද මා ඔබ තුළ ද සිටින්නාක් මෙන්, ඔවුන් ද අප තුළ ඒකත්වයක් වන පිණිසත්, ඔබ මා එවා වදාළ බව ලෝකයා විශ්වාස කරන පිණිසත්ය" (ජොහාන් 17:21).

එමෙන්ම උන් වහන්සේ මෙසේ ද යාච්ඤා කළ සේක; "මොවුන් ගැන පමණක් නොව, මොවුන්ගේ වචනය කරණකොට ගෙන මා අදහාග න්නා අය ගැනත් යාච්ඤා කරමි" (ජොහාන් 17:20). මීට වඩා ආදරය උත්තරීතර විය හැක්කේ කෙසේ ද යයි මම නොදනිමි. උන්වහන්සේගේ ආදරය තුළට ඇතුළු වීමට කිසිම පුද්ගලයෙක් පසු බට නොවේවා! උන්වහන්සේ මෙසේ ද ප්‍රාකශ කළ සේක; "මා ඔවුන් තුළ ය" (ජොහාන් 17:23).

මෙම වචන සම්පූර්ණයෙන් ම සත්‍යය. මෙම හත්වන මහල තුළ යාච්ඤාමය ජීවිතයක් ගත කරන පුද්ගලයෙකුගේ ආත්මයට මෙම වචන පැහැදිලිවම තේරුම් ගත හැකිය. එමෙන්ම එම වචන පරිපූර්ණත්වයට ද පත්වේ. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ වචන කවදාවත් අසමත් නොවේ. එසේ වුවහොත් ඊට හේතුව අපගේ වරදකි. අපව නියමාකාරයෙන් සූදානම් කර නොගැනීමෙන් සහ ආලෝකය පැමිණීමට ඇති සියලුම බාධාවන් ඉවත් කර නොගැනීමෙන්, අප අසමත් වේ.

දෙවියන් වහන්සේගේ ම මහල වන ආත්මයේ ගැඹුරුතම කේන්ද්‍රය තුළ දෙවියන් වහන්සේ ආත්මය සතපවන සේක. දෙවියන් වහන්සේ ආත්මය ආරක්ෂා කරන තුරු, ආත්මය උන් වහන්සේට අප්‍රසන්න නොවන ලෙස කටයුතු කරන තුරු, ආත්මය සුරක්ෂිතව පවතී. එය එසේ වුවත් අප සුළු ප්‍රමාණයෙන් හෝ දෙවියන් වහන්සේට එරෙහිව පව් නොකිරීමට වග බලා ගත යුතුයි. එමෙන්ම සෑම මොහොතකම දෙවියන් වහන්සේට සේවය කිරීමට උවමනාවකුත්, එසේ කිරීමට බැරි වූ විට ඒ ගැන අධික වේදනාවක් ඇති වීමත් ස්වභාවිකය. මෙය සරල කාරණයක් නොව ඉතා අධික අභ්‍යන්තර අරගලයක් බවට පත් විය හැකිය. ඒ නිසා ඒ ගැන අප අවදියෙන් සිටිය යුතු වේ.

අවසානයේ දී ක්‍රිස්තුන් වහන්සේ තුළ ආත්මය සැබෑ ආනන්දය සොයා ගනී. එවිට ක්‍රිස්තුන් වහන්සේ ආත්මය තුළ ජීවත් වන සේක. එමෙන්ම දුක් පීඩාවන්, වේදනාවන් දරා ගැනීම සඳහා ද සුවිශාල ශක්තියක් ලැබේ. පීඩාවන්, කලකිරීම් අධික වන තරමට ඇතුලාන්ත ආනන්දය ද අධික වේ. එමෙන්ම අභ්‍යන්තර සාමය පවත්වා ගැනීම සඳහා ද පෙරට වඩා හැකියාවක් ලැබේ. එමෙන්ම අපගේ සතුරන්ට එරෙහිව කිසිදු කහටක්, තරහාවක්, අයහපත් සිතුවිල්ලක් පහළ නොවේ. ඔවුන්ට එරෙහිව කිසිදු නපුරක් ද ප්‍රාර්ථනා නොකරයි. තමන්ගේ සතුරන් සඳහා විශේෂ ආදරයක් ද ඇති වේ. ඔවුන්ට උදව් කිරීමට උවමනාවක් ඇති වේ. ඔවුන්ට කරදරයක් වූ විට ඒ ගැන කම්පාවට පත් වේ, දුකට පත්වේ.

අපට ලැබී ඇති වරප්‍රසාද අපගේ සතුරන්ටත් ලැබෙනු ඇතැයි අප ප්‍රාර්ථනා කළ යුතුයි. එම වරප්‍රසාද වල ප්‍රතිඵලයක් ලෙස අප සතුරන් දෙවියන් වහන්සේට අප්‍රසන්න වන ලෙස හැසිරීම නවත්තනු ලබනු ඇතැයි අපගේ පැතුම විය යුතු වේ. අපගේ ස්වාමීන් වහන්සේ වඩාත් අගය කරන්නේ අපගේ ක්‍රියා කාරකම් නොව එම ක්‍රියාකාරකම් වලට අප කොතරම් ආදරයක් රැගෙන එනවාද යන්නය. අපට කළ හැකි සෑම දෙයක්ම අප පරිපූර්ණ කළ විට, උන්වහන්සේ අපට තව තවත් දේවල් ඉටු කිරීමට අපට ශක්තිය ලබා දෙන සේක.

*(මීළගට "සහා මාතාව තුළ ආදරය වෙමි මම; මහා මෙරක් වූ කුඩා මල සහ මහා මෙහෙවර" බලාපොරොත්තු වන්න)*

(මීළගට "සහා මාතාව තුළ ආදරය වෙමි මම; මහා මෙරක් වූ කුඩා මල සහ මහා මෙහෙවර" බලාපොරොත්තු වන්න)



මහාචාර්ය **ඇන්ටන් මීමන**

## 14 දර්ශනය යනු කුමක්ද ?

# ප්‍රඥාව, සත්‍යය සහ බුද්ධිමය නිහතමානීත්වය

මා කරන, කියන, සිතන පතන සෑම දෙයක් ම නිකුත් විය යුත්තේ මාගේ හදවතේ, ආත්මයේ, අධ්‍යාත්මයේ ගැඹුරුතම කේන්ද්‍රයෙනි. එය මා පිළිබඳව සත්‍යයේ උල්පත විය යුතුයි. මාගේ සැබෑ අනන්‍යතාවයේ පදනම මා පිළිබඳව සත්‍ය ය යි. මාව ගැඹුරින් ම නිදහස් කරන්නේ, ගලවා ගන්නේ සත්‍ය ය යි.

තමන්ව තේරුම් ගැනීමේ ක්‍රියාවලිය තුළ පූර්ව මතයන් අඩංගු වීම යනු අන්‍යයන්ට තේරුම් ගැනීමේ දී ද එම පූර්ව මතයන් නැවත නැවත ක්‍රියාත්මක වීමයි. එහි දී යමක් හරියාකාරව දැන ගැනීමේ අභ්‍යන්තරික, ඥානමය සහ දාර්ශනික ක්‍රියාවලිය ගබ්සාවට ලක් වෙයි. අපගේ හැසිරීම් රටාවන්, සිතුවිලි ධාරාවන් නව දැනුම හේතුවෙන් වෙනස් කර ගැනීමට දක්වන බුද්ධිමය, දාර්ශනික අලසකම නිසා මෙම පූර්ව මතයෙන් මිදීමට අතිශයින් දුෂ්කර වේ.

පූර්ව මතයන්, සහ පූර්ව නිගමනයන් යනු යමක සත්‍යය වසන් කිරීමයි, සත්‍යයට හිමි නියමිත තැන ලබා නොදීමයි, සත්‍යයට ද්‍රෝහිකම් කිරීමයි, සත්‍යය පාවාදීමයි, අසත්‍යය, අසාධාරණය, අයුක්තිය, අසමගිය, අවිචාරය සහ අවිද්‍යාව ජයග්‍රහණය කරවීමට උත්සහ කිරීමයි. සත්‍යය යටපත් කිරීම ලොව ඇති දරුණුතම අසාධාරණ යයි. සත්‍යය යටපත් කර යහපත් සමාජයක් ගොඩනැගිය නොහැකි ය. සමාජ ප්‍රගතිය සත්‍යය මත පදනම් විය යුතුයි.

පූර්ව නිගමනයන් බුද්ධිමය සහ අධ්‍යාත්මික වර්ධනය නවතා දමයි, සීමා කරයි. අධ්‍යාත්මිකව සහ බුද්ධිමය ලෙස වර්ධනය නොවන පුද්ගලයාට සමාජ මෙහෙවරක් කළ නොහැකි ය. අප විසින් මානව සංහතියට කරන සේවය අපගේ අධ්‍යාත්මික වර්ධනයට සෘජුව සමානුපාතික වේ. අප මානව වර්ගයාට කරන සේවය අධික වන තරමට, අපගේ බුද්ධිමය සහ අධ්‍යාත්මික වර්ධනය වැඩි වේ. එමෙන්ම අප බුද්ධිමය සහ අධ්‍යාත්මිකව වැඩි වර්ධනය වන තරමට, අපගෙන් ඉටුවන සේවය ද තීව්‍ර වේ.

සමාජයක පිරිහීම අප එකිනෙකා තුළ මූලික වශයෙන් පවතින තත්ත්වයකි. සමාජ පිරිහීම ආරම්භ වන්නේ අප එකිනෙකා තුළයි. තනි පුද්ගලයන් පිරිහුණු විට, සමස්ත සමාජයම පිරිහෙයි. මිනිසුන් වන සතුන් සහ මෘගයන් ලෙස හැසිරෙන විට සාමජය කැලෑවක් බවට පත්වීම කිසිසේත්ම වැළැක්විය නොහැකිය. අද ලෝකය පුරාම සිදුවෙමින් පවතින්නේ එයයි. ජන සමාජයක සැබෑ ප්‍රගතියේ පදනම වන්නේ තනි පුද්ගලයන්ගේ අධ්‍යාත්මික, දාර්ශනික සහ සදාචාරාත්මක සෞඛ්‍ය සම්පන්න භාවයයි.

සමාජ පරිවර්තනයේ සැබෑ නිර්මාතෘ තනි පුද්ගලයායි (Individual). සමාජය පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සාමුහික සහ පොදුක්‍රියාවලියක්බවටපත්වන්නේදෙවනුවයි.පවතිනසමාජ,ආර්ථික දේශපාලන ක්‍රමය වෙනස් කළ පමණින් සමාජය වෙනස් නොවේ. ගැඹුරු දාර්ශනික ප්‍රඥාව නොමැතිව සමාජ ප්‍රගතිය සඳහා කටයුතු කළ නොහැකි ය. දාර්ශනික පාලකයින් නොමැතිව පොදු යහපත වැඩි වර්ධනය කළ නොහැකි ය. අද ලෝකයේ ඇති ප්‍රධාන ප්‍රශ්නය නම් සැබෑ ප්‍රඥාවන්තයින් සමාජ දේශපාලන ක්ෂේත්‍රයට තවමත් පිවිස නොමැති වීමයි.

ජනප්‍රිය දේශපාලන ව්‍යාපාරවල සහ සම්ප්‍රදායික දේශපාලන පක්ෂවල බුද්ධිමය සීමාවන් සහ ඥානමය ක්ෂිතිජයන් ඉතා පටුය. මානවයා සහ සමාජය පිළිබඳ ඉතා සංකීර්ණ යථාර්ථයන් සටන් පාඨ කිහිපයකට ඔවුන් සීමා කර ඇත. ජනප්‍රිය සටන් පාඨ යනු සංකීර්ණ සමාජ යථාර්ථයන්ගෙන් පලා යෑමකි. දාර්ශනික විග්‍රහයක් නොමැතිව සමාජ, ආර්ථික, දේශපාලන යථාර්ථයන් ගැඹුරින් අවබෝධ කර ගත නොහැකි ය. ඒවාට ශක්තිමත් විසඳුම් ගවේෂණය කළ නොහැකි ය.

සමාජ සංසිද්ධීන් විග්‍රහ කිරීම සඳහා ඇති එකම උපකරණය, එකම මිනුම් දණ්ඩ, එකම ක්‍රමවේදය (Methodology) ඇත්තේ වෙන කොහෙවත් නොව, ඒවා විග්‍රහ කරන්නාගේ දාර්ශනික අවදි වීම (Philosophical Awareness) තුළයි, බුද්ධිමය සවිඥානිකත්වය (Intellectual Consciousness) තුළයි. අපගේ සවිඥානිකත්වය ගැන සහ එහි විවිධ පැතිකඩයන් ගැන අප නිරන්තරයෙන් සවිඥානික විය යුතුයි. ස්වයං විශ්ලේෂණය (self-analysis) සමාජ විශ්ලේෂණය මඟින් පරිපූර්ණ කර ගත යුතුව ඇත. එමෙන්ම සමාජ විග්‍රහය (Social analysis) ස්වයං විශ්ලේෂණය මඟින් ගැඹුරු කර ගත යුතුව ඇත.

සමාජ, ආර්ථික, දේශපාලන බලවේගයන් යනු මිනිස් හදවතේ, මිනිස් ආත්මයේ තැන්පත් ගැඹුරුතම බලවේගයන්ය. සමාජ, දේශපාලන පෙරළි, මත සට්ටන, හැල හැප්පීම්, බල අරගල සහ විප්ලව මානව හදවත් තුළ පවතින පෙරළි, මත සට්ටන, හැල හැප්පීම් සහ බල අරගල වල සෘජු පරාවර්තනයකි, පිළිබිඹුවකි. සමාජ ප්‍රගතියේත්, අධ්‍යාත්මීක වර්ධනයේත් පදනම එකකි. දාර්ශනික පුළුල් භාවය, අධ්‍යාත්මීක වර්ධනය, භාවාත්මක ගැඹුරු භාවය සහ මානසික පරිනත භාවය, සමාජ ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍ය පූර්ව කොන්දේසීන්ය. අප අප දෙසම ස්වයං විචාරාත්මකව, ස්වයං විවේචනාත්මකව බැලිය යුතු කාලය පැමිණ ඇත. අපි අප දෙසම නව දෘෂ්ටියකින්, නව කෝණයකින්, අලුත් උපැස් යුවලකින් බැලිය යුතු වෙමු. දර්ශන විද්‍යාව ඒ සඳහා අපට නිරන්තරයෙන්ම ආරාධනා කරයි. එයට පිටු නොපෑම සැබෑ ප්‍රඥාවන්තයෙකුගේ නෛසර්ගික ලක්ෂණයකි.

ඉදිරි කලාපයට... »

## තෙමස් සැමරුම



දුන්ගල්පිටියේ විසූ

**ශාන්ත සිරි හෙට්ටිආරච්චි**

ආදරණීය පියාණනි, ඔබ අපෙන් වෙන්ව දෙව්මව් තුරුළෙහි සැතපී 2012 පෙබ්‍ර. 01 වන දිනට තෙමසක් සපිරෙයි. "සිරි නිකේතනයෙහි" ඔබ තැබූ සුවඳ සදා අප වටා දැවටෙනු ඇත. ඔබට සදා මොක් සුව පතන්නේ සදාදර පුතනුවන් තිදෙනා, දියණියන් තිදෙනා, ලේලිලා, බෑණාවරුන්, මුණුබුරු මිණිබිරියන් හා ඔබ සොයුරිය මේරි මාග්‍රට් හා වික්ටර් රුද්‍රිගු

## වාද්දූව කිතුනු එකමුතුව දයා සේවාවේ !

වාද්දූව කිතුනු එකමුතුව සංවිධානය පසුගිය වසරේ මෙන් මෙවරද ප්‍රදේශයේ ඉතාමත් දිළිඳු පවුල් සියයක් අතරේ වියළි ආහාර මල්ලක් බෙදා දෙන ලදී.

මෙම ආහාර මල්ලක වටිනාකම රු. 1000/- ක් පමණ වූ අතර කිරි දරුවන් ඇති පවුලකට කිරිපිටි පැකට්ටුවක්ද අඩංගු කළහ. මෙම කාර්යය සඳහා සමිතියේ සාමාජිකයන්, ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව හා ග්‍රාමයේ පරිත්‍යාගශීලීන් මෙන්ම සාමාජිකයින්ගෙන් පිටස්තර බෞද්ධ පින්වතුන්ද දායක වී ඇත.

**(බර්නාඩ් විල්ෆ්‍රඩ්)**

## සංක්‍රිස්තියන් සග සුව දිනයි

*ඉරබඩගම ශු. පේදුරු පාවුළු මුනිවරුන්ගේ දේවස්ථානයේ සංක්‍රිස්තියන් සේවයේ වසර විසි හයක් සේවය කළ සුනිල් ජෝර්ජ් තිසේරා මහතා ඉරබඩගම මීසම් වාසීන්ගේ හදකම්පා කරමින් පසුගියදා හදිසියේම දිවියෙන් සමුගත්තේය.*

සුනිල් ජෝර්ජ් තිසේරා මහතා වසර 48 ක මෙලොව දිවියේ දෙවිඳුන් වෙතින් ලද හැකියාවන් දෙවිඳුන්ට උපහාරක් ලෙස පුදන්නට තරුණවියේ සිටම කැපවිය. මීසම්වාසී සියළු දෙනාගේත් ගරු පියතුමන්ලාගේත් සිත දිනාගෙන කටයුතු කිරීම තමන් සතු කටයුතු හොඳින් කරන්නට ඔහුට මහත් රුකුලක්විය. දේවස්ථානය සතු භාණ්ඩ නිසි පරිසි සුරක්ෂිත කිරීමට සමත්වූ ඒ මහතාගේ සේවය මීසමේ අනෙකුත් දේවස්ථාන වලටද අවශය අවස්ථාවලදී ලබා දුනි. ඒ මහතාගේ සංක්‍රිස්තියන් සේවාවේ රිදී ජුබිලියද පසුගිය වසරේ උත්සවාකාරයෙන් පැවැත්විණි. ඉරබඩගම මීසම් සේවක ගරු රූපස් හිලරි පියතුමාගේ ආගමික වතාවත් වලින් පසු සුනිල් ජෝර්ජ් තිසේරා මහතාගේ අවසන් කටයුතු ඉරබඩගම කතෝලික සුසාන භූමියේදී මීසම් වාසී ජනතාවගේ සෝසුසුම් මැද සිදු කෙරුණි. ඒ මහතාට මොක් සුව පතමු. !

**(පෝල් විජේතුංග)**

## සග සුව දිනති

වැලිවිට මීසම් සේවක ගරු එල්මෝ රාජ් ප්‍රනාන්දු පියතුමාගේ දයාබර මෑණියන්ද, කලමුල්ල මීසම් සේවක ගරු මොරිස් නාමල් පියතුමාගේ දයාබර පියාණන්ද පසුගියදා සග සුව දිනූ අතර ඔවුන්ගේ ආත්මයනට සදා සාමය පතා යදින්නැයි ප්‍රදීපය ඉල්ලා සිටී.



*කටුවපිටිය ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය නිමිත්තෙන් මාර්ග අංක 251 කටාන - මීරිගම ප්‍රධාන බස් මාර්ගයේ සිසිල්බීම බෝතල් යොදා ගෙන අලංකාර තොරණක් ඉදිකර තිබුණි. ත්‍රීවිල් සංගම් හා තරුණ කොටස් ඒ සඳහා දායක වී තිබුණි. මෙහි දැක්වෙන්නේ එහි සේයාරුවයි.* **(සිසිල් ඩැනීසියස්)**

## නව තනතුරු වලින් පිදුම් ලද සැල්වටෝරියන් සොහොයුරියෝ



සැල්වටෝරියානු පැවදි හවුලේ ප්‍රාදේශාධිපතිනිය ලෙස දෙවන වරටත් ගරු ඩල්සි ප්‍රනාන්දු පැවිදි සොහොයුරිය පිදුම් ලබා ඇත. ඇයගේ සහයක කමිටුව සඳහා ගරු නාලිනි ප්‍රනාන්දු, ශිරෝමා කුරුම්බලපිටිය, ග්‍රේස් ප්‍රනාන්දු, ප්‍රැට්‍රිෂියා සන්දනු සවර් පැවිදි සොයුරියෝ අයත් වෙති.

## රාවතාවත්ත මීසම තුළ රෝස කුසුමේ දේවමාතා බැතිය

මෙයට තෙවසරකට පෙර සංඛ්‍යාත්මකව ඉතා සුළු ප්‍රමාණයකින් ආරම්භ වූ රෝස කුසුමේ බැතිය මීසමේ සේවය කරන පියතුමන්ලාගේ අතහිත ලැබීමෙන් හා මග පෙන්වීම තුළින් වර්තමානයේ මීසම් කටයුතු වලදී දේව ජනතාවගේ උද්යෝගය බෙහෙවින් හිමිවී ඇති භක්ති අභ්‍යාසයක් බවට පත්වී ඇති අතර දිනපතා තම අවශ්‍යතාවයන් සමග බොහෝ සැදැහැවතුන් මෙම සත්කාරයයට සම්බන්ධ වෙමින් පැවතීම සතුටට කරුණකි. ජනතාව අතර අධ්‍යාත්මික වටිනාකම් වැඩි වර්ධනය කිරීමටත්, දෙව්මවුන්ගේ පිහිට අත්දැකගැනීමට සැලැස්වීම සඳහත් සෑම මසකම 13 වැනිදා කොළඹ පදවියේ පියතුමන්ලාගේ දායකත්වයෙන් මෙම භක්ති අභ්‍යාසය පණ පෙවේ. මාසයේ හැම 13 වැනි දාම පමණක් ජපමාලය හා ප්‍රාර්ථනය ඔප්පු කරමින් යාච්ඤා කරන ලද සමයක පසුගිය 2010 වසරේ නොවැම්බර් සිට අනෙකුත් යැදුම් සමගින් සැදැහැවතුන්ගේත් විශේෂයෙන් ලෙඩ රෝග අසනීපතත්වයන්ට සුවයත්, ජීවිත ගමනට පවතින අභියෝග සඳහා විසදුම් හා අධ්‍යාමීක සුවයත් පතා කණ්ඩායම් හැගීමෙන් යාච්ඤා කිරීම විශේෂත්වයකි. මෙම යාච්ඤා වල වැදගත්ම සංධිස්ථානයක් බවට පසුගිය වසරේ නොවැම්බර් 13 වැනිදා සැලකිය හැක. එදින දිව්‍ය පූජාවට පෙර තිබූ යැදුම් මෙහෙය අවසන් කොට දිව්‍ය පූජාවෙන් පසුව ඔප්පු කරන ලද යාච්ඤාවල අවසන් අදියරේ දෙව් මැඳුරු ශුද්ධවූ අල්තාරයේ දේවමාතා මැදිහත් බව පිළිබිඹු කරන ස්ථානයේ විහිදී ගිය තවමත් ඒ පිළිබඳව නිසි වටහා ගැනීමක් සිදු කරගැන්මට නොහැකිව සිටින නීලවර්ණයෙන් දිස්වූ ආලෝක ධාරාවයි. රැස්ව සිටි සෑම සැදැහැවතෙක්ම එය දුටු අතර එම අත්දැකීමත් සමග මෙම වසරේ නොවැම්බර් 13 වෙනිදා 150 වෙනි නුවානය පැවති අතර එහි අවසානයේ බොහෝ සැදැහැවතුන්ගේ සහභාගිත්වයෙන් උත්කර්ෂවත්ව දිව්‍ය පූජාව පැවැත්වූහ. එයට මීසම් වාසීන් සමග අනෙකුත් කිතුනු ජනතාව මහත් භක්තියෙන් සහභාගිවූ අයුරු දක්නා ලදී. **(ගර්ලි කොටිල්ඩා)**

**ලංකා බයිබල් ...... 1 පිටුවෙන්**

වහන්සේගේ ආශිර්වාදය ද නොමඳව ලැබේවා"යි පැවසීය. ඉන්දියාවේ බයිබල් සමාගමේ මහ ලේකම් අතිගරු මානි චාකෝ දේවගැති තුමා විශේෂ පණිවුඩයක් ප්‍රකාශ කළේය. ලංකා බයිබල් සමාගමේ මහ ලේකම් ලක්ෂානි ප්‍රනාන්දු මහත්මිය, කිතුනු කටයුතු දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ඒ. ආර්. ගුණවර්ධන මහතා ද කතා කළහ.

**ලේඛකයන්ගේ... 5 පිටුවෙන්**

කඩවසම් තරුණයකු වූ ප්‍රැන්සිස් කාගේත් සිත්ගත් ප්‍රියමනාප, විනීත, මහත්මා ගති ඇති ඉතා හොඳ හික්මීමකින් යුතු කෙනකු විය. සැම දෙනාම ඔහු ප්‍රිය කළහ. මේ අතර ඔහුගේ ජනප්‍රිය බවට ඊර්ෂ්‍යා කළ කීපදෙනෙකුද වූහ. ප්‍රැන්සිස්ගේ මෙම තැන්පත් බව බයාදු, නිවට කමක් ලෙස සිතූහ. ඒ අනුව ඔහු වැදගැම්මකට නැති අවඥා සහගත කෙනකු බවට පත් කිරීමට කුමන්ත්‍රණ කළහ. දිනක් රාත්‍රියේ පිරිස එක්ව ඔහු එනමඟ රැක සිට පහර දුන්හ. එසේ තලා පෙලා හිරිහැර කරන විට ඔහු බයවී උදව් ඉල්ලා කෑ ගසමින් දුවනු ඇතැයි සිතූහ. එහෙත් සිදුවූයේ වෙනත් දෙයකි. ප්‍රැන්සිස් තරුණයා වහාම සිය කඩුව ඇද හරඹ කරමින් පිරිස මර්ධනය කර නිරායුධ කළා පමණක් නොව ඔවුන් සියලු දෙනා දණ ගැස්වීය. ප්‍රතිවාදීහු ඔහු ඉදිරියේ බැගෑපත්ව සමාව ඉල්ලා සිටියහ.

මේ වන විට ප්‍රැන්සිස් දුටුවන් මන බඳින ප්‍රසන්න කඩවසම් තරුණයෙක් වූවා මෙන්ම උගත්කමින්ද බුද්ධිමත් සහ ප්‍රඥාවන්ත බවින් ද නිර්භීත කමින්ද යුතු විය. මේ කරුණු කාරණා හේතුවෙන් එක් කුමරියක් ප්‍රැන්සිස්ට ආදරය කරන්නට විය. ඇය ප්‍රැන්සිස් වෙත අගනා රන් භාණ්ඩ සහ මුතු මැණික් තෑගි වශයෙන් දූතයකු අත යවා තමන් හමුවීමට එන ලෙස දන්වා සිටියාය. එහෙත් ප්‍රැන්සිස් කුමරුන්ගේ හදවත තුළ සිටි එකම ස්ත්‍රිය දෙව්මවුන් පමණක් විය. නිර්මල මරියාවන් ඔහුගේ මව විය. රැජින විය. දෙව්මවුගේ දෙනෙතේ කාන්තියට ඉහලින් කිසිවක් ඔහුට නොවීය. ඒ නිසා එම දූතයා තෑගිභෝග සමඟින්ම ආපසු යැවීය. තමන් එවැනි යෝජනාවකට කිසිසේත් කැමති නැති බව දන්වා යැවීය.

මෙසේ සියලු කටයුතු සාර්ථකව කරගෙන යන අතර දුර්පරීක්ෂා වලින් ගැලවෙන පිණිස නිරාහාර ශීලය රක්ෂා කළේය. කෙසේ නමුදු හිටි හැටියේ ඔහුට කෑම අරුචිය දැනෙන්නට විය. නිදා ගැනීම අපහසු විය. මේ නිසා ශරීරය දුර්වල වී වැහැරෙන්නට පටන් ගති. වෛද්‍යවරුන් කොතරම් උත්සාහ කළ ද සුවයක් නොවීය. අන්තිමේ උත්සාහය අත්හල වෛද්‍යවරු ඔහු මරණාසන්න බවත් අවසාන සක්‍රමේන්තුව දිය යුතු බවත් දැන්වූහ. තමන්ගේ මරණය ළඟා වන බව ඇසූ ප්‍රැන්සිස් තරුණයාගේ සිත දිව්‍යමය සතුටින් පිරී ගියේය. ඉමහත් ආනන්දයෙන් ශුද්ධවූ බයිබලයේ අලංකාර කොටස් මිහිරි හඬකින් ගායනා කරන්නට පටන් ගත්තේය. "සර්වබලධාරී දෙවියනී අනන්තයෙන් අනන්තයටම ඔබට ප්‍රශංසා වේවා. සමිඳුනි මාගේ අන්තිම හුස්ම දක්වා ඔබවහන්සේට ප්‍රශංසා ගායනා කරමි" අවසානයේ අසරණව යාච්ඤා කරමින් සිටි දියාගෝ තුමන්ට කතා කොට මරණින් පසු තම ශරීරය වෛද්‍ය විද්‍යාලයට භාරදෙන ලෙස ඉල්ලීය. එහෙත් ස්වර්ගයේ දොරටු මෙම ශුද්ධවන්ත ආත්මය භාර ගැනීමට ඉක්මන් නොවීය. ස්වර්ග රාජ්‍යයේ ආලෝකය පතා සිටි ප්‍රැන්සිස් ඒ වෙනුවට නොසිතූ පරිදි සුවපත් වන්නට විය.

## ශ්‍රී කුරුසියේ සිය වසරක ජයන්තිය සැමරේ

වසර 166 ක අතීතයකට හිමිකම් කියන දියලගොඩ සාන්ත සෙබස්තියන් දෙව්මැඳුරේ භාග්‍යවන්ත ජුසේවාස් පියතුමන් විසින් 1691 ජනවාරි මස 20 ශුද්ධ වූ සෙබස්තියන් මුනි මංගල දිව්‍ය පූජා යාගය පැවැත්වූ බවද, 1995 අප දෙව්මැඳුරේ 150 වැනි ජුබිලි සැමරු ජනවාරියේ දී අපේ සභා නායක සුදතුම් පියතුමාගේ ලංකා ගමන හා වන්දනීය ජුසේ වාස් පියතුමන් භාග්‍යවරයට එසවීමේ මහෝත්සවය යෙදී තිබීමය. එය අප දියලගොඩ ජනතාව ලත් භාග්‍යයකි.

මෙවැනි ඓතිහාසික සිද්ධීන් බොහෝමයක් ඇතුලත්වී ඇති පුරෝගාමීන්ගේ ග්‍රාමයයි නම් පටබැඳි දියලගොඩ වත්මන් තරුණ පරපුර දැනුවත් කිරීමෙහිලා වැදගත් වේවායි සිතමි. ක්‍රි.ව. 1871 දී එදා උතුරු කළුතර සිට අළුත්ගම දක්වා මීසමක් ලෙස පැවතුනි. එහි නව මීසම් පාලක පියතුමා වූයේ ගරු ඇලෝසියස් පිච්චනෙල්ලි පියතුමාය. එතුමාගේ සේවා කාලයේ දී දියලගොඩ උපත ලද සොහොයුරන් දෙදෙනෙක් වූ එච්. ඩී. මර්තීනු සහ ඇස්. ඩී. මර්සලීනු යන තරුණයන් දෙදෙනාගේ නායකත්වයෙන්, ප්‍රැන්සිස්කන් තාපස නිකාය 1874 දී පිහිටුවීම දියලගොඩ ග්‍රාමය විශ්ව සභාවේ පැවදි නිකා අතරද රන් අකුරින් ලියවී ඇති බව සනිටුහන් කරනුයේ මහත් ආඩම්බරයෙනි. එමෙන්ම සමිඳු මිදි උයනේ සේවය සඳහා මෙතෙක් අප ගමින් බිහි වුනු පූජකවරුන් දස දෙනෙක් ද සහෝදරවරුන් හය දෙනෙක් ද වන අතර පැවදි සොහොයුරියන් ගණන විසිහතකි.

ශ්‍රී ලංකාවේ පැරණිතම සඟරාව වූ "භක්ති ප්‍රබෝධන" සඟරාව 1899 දී ආරම්භ වූ යේද දියලගොඩ පුත්‍ර රත්නයක් වූ සී.ඩී. අන්තෝනියුස් ජයවර්ධන මහතාගේ සංස්කාරකත්වයෙනි. එතුමා එදා මග්ගොන ගුරු අභ්‍යාස විද්‍යාලයේ ආරම්භක හා ප්‍රථම විදුහල්පතිවරයාද වීමේ භාග්‍යය ලබා ඇත.

වසර 1924 දී නිමල මරිය නිකායේ ගරු අයි. බැල් පියතුමන් විසින් දියලගොඩ ජනතාවට දුන් පොරොන්දුවක් වශයෙන් ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතුවක් එවකට කොළඹ අගරදගුරු ඇන්තනී කුදේර් හිමිපාණන්ට එවන ලදී. එවකට මීසම් පාලකව සිටි ගරු ඩේවිස් පියතුමන් විසින් බාරගත් එම ශුද්ධවූ ධාතුව බහාලූ කරඬුව අදත් දියලගොඩ ජනතාවට මහඟු ආශිර්වාදයකි.



එමෙන්ම වසර 100 ක අතීතයකට හිමිකම් කියන දියලගොඩ දෙව්මැඳුරු මංසන්ධියේ ඉදිකර තිබෙන ප්‍රතිමාවට ඉදිරියෙන් ඇති ශුද්ධවූ කුරුසිය දියලගොඩ පුත්‍රරත්නයක් විසින් ඉදිකරන ලද බව කියැවේ. අද එම කුරුසියේ සියවස් සංවත්සරය සමරන්නේ හද බැඳී ප්‍රීතියෙනි. මෙම උළෙලට දියලගොඩ ගමෙන් බිහිවූ ගරු පියවරුන්, සහෝදරවරුන්, පැවිදි සොහොයුරියන් ඇතුළු ගම්වාසී ජනතාවගේ සහභාගීත්වයෙන් දියලගොඩ මංසන්ධියේ දී සියවස් සැමරීමේ මංගල උළෙල ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමා ඇතුළු දියලගොඩ කිතුණු සංඝය කටයුතු කළහ.

වසර ගණනාවක සිට දියලගොඩ ජනතාවට අධ්‍යාත්මීක වශයෙන් මහඟු සේවයක් කළ පියතුමන් අතර, ගරු මර්සලින් ජයකොඩි, ගරු හේලියස්, ගරු කේ.ඩී.ඒ. නානායක්කාර, ගරු දොමිනික් පතිරණ, ගරු පිලිප් ද සිල්වා, බැසිල් වික්‍රමසිංහ, ලියෝ කැමිලස් ජේ.ඇල් මික, මාර්ක් ප්‍රනාන්දු, වික්ටර් ජයමාන්න, වික්‍රම ෆොන්සේකා, කිරුල් ජයනාත් යන පියතුමන් මෙහිදී සිහිපත් කළ යුතුය. වත්මන් මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමාය. එතුමා මීසම් ජනතාවගේ අධ්‍යාත්මීක පෝෂණය සඳහා බෙහෙවින් ඇප කැපවී සේවය කරයි.

දියලගොඩ ගමේ ප්‍රගතිය සඳහා ඇප කැපවී සේවය කළ දීප්තිමත් ඉතිහාසයක් උරුම කර දුන් ඒ අපගේ වීරෝධාර පැරැන්නන්ගේ අමරණීය නාමයට තුති පැසසුම් පිදිය යුතු අතර සමිඳු සෙවනේ සදා සාමය ඔවුනට ලැබේවා. ඔවුන් ගිය මග අනුගමය කරමින් ඉර හඳ පවතින තුරු මෙම ඓතිහාසික ගම උසස් තැනක රඳවන්නට අපේ නව පරපුරට හැකිවේවා යන පැතුමත් සමග ශුද්ධවූ සෙබස්තියන් මුනිඳුන්ගේ පිහිටාරක්ෂාවත්, ආශිර්වාදයත් නොඅඩුව ලැබේවායි පතමු.

**(ඩී. ඇන්සලම් ප්‍රනාන්දු)**



*ගොඩැල්ල සා. සෙබස්තියන් දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය නොබෝදා සිදු කළ අතර මෙවර මංගල්‍යය වෙනුවෙන් ගොඩැල්ල බෑන්ඩ් හංදිය තරුණ පිරිස දෙව්මැඳුර ඉදිරිපිට ඉදිකළ තොරණයි මේ. මේ තොරණ සඳහා කොහු ලණු අඩි විසිනමදාහක් (29000) සහ රබන් ඇණ කිලෝ විසි අටක්ද දින අටක් මුලුල්ලේ දිවා රෑ තරුණයන් හයදෙනා ගේ ශ්‍රමදායකත්වය ද ලබාදී තිබිණි. කොහු ලණුවලින් නිර්මාණාත්මකව කළ මෙම තොරණ සියල්ලන්ගේ පැසසුමට ලක්විය.* **(එච්.ඒ. සිරිල් පෙරේරා)**